රංගිරි RANGIRI SRI LANKA - RADIO

FM 104.4,105.7

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව

"රංගිරි ශ්‍රී ලංකා"

සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

RANGIRI SRI LANKA NEWSPAPER



රංගිරි RANGIRI SRI LANKA - RADIO

FM 104.4,105.7

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව

"රංගිරි ශ්‍රී ලංකා"

සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු



ශ්‍රී.බු.ව. 2565- ක්‍රි.ව. 2021 ජූනි (පොසොන්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය

31




## සුභ පොසොන් මංගල්‍යයක් වේවා!


**රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය**

රංගිරි ශ්‍රී ලංකා RSL TELEVISION

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

**රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය**
**දේශයේ රන් හඬ**

රංගිරි ශ්‍රී ලංකා RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk



රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.



# පොසොන් පෝය වර්ණාව

ලක්දිව රජකළ මුටසිව රජුගේ ඇවෑමෙන් පසු ලක්දිව රාජ්‍යයට පත්වුනේ දෙවන පෑතිස් රජතුමාය. දඹදිව රජ කළේ ධර්මාශෝක අධිරාජ්‍යයාය. බුදුදහමේ ව්‍යාප්තිය සඳහා එතුමාගේ අනුග්‍රහයෙන් පවත්වන ලද තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස රටවල් නමයකට බුදුදහම ව්‍යාප්ත කරවිය. ලංකාද්වීපයට පැමිණි ධර්මදූත කණ්ඩායමේ ප්‍රධානත්වය දැරුවේ, රජුගේ පුත් මිහිඳු මහ රහතන් වහන්සේය. දහම් පණිවිඩය රැගෙන ලක්දිව මිස්සක පව්වට (මිහින්තලාවට) වැඩම කලේ පොසොන් පොහෝ දිනකය. පොහෝ දින රජතුමා පිරිවර සමඟින් දඩයමෙහි යෙදී සිටියේය. මිස්සක පව්වේදී රජු හා මිහිඳු මහ රහතන් වහන්සේ අතර සිදුවූ හමුවෙන් පසු මෙරටට දහම් එළිය පැතිරවීම ආරම්භ විය. පළමුවෙන් රජතුමා තෙරුවන් සරණ ගිය අතර පසුව ජනතාවද තෙරුවන් සරණ ගියහ. රජුගේ ආරාධනයෙන් අනුරාධපුරයට වැඩම කරන ලද මිහිඳු මහ රහතන් වහන්සේ ඇත් ගාලේදී චුල්ලහත්ථි පදෝපම සූත්‍රයෙන් දහම් දෙසීය. මෙතැන් සිට බුදුදහම රාජ්‍ය ආගම වූ අතර රාජකීය උත්සව වලදී තෙරුවන් සරණයෑම පළමුවෙන්ම සිදුවිය. විශේෂ ආගමික උත්සවයන්ට රජතුමාගේ සහභාගිත්වය අනිවාර්යයෙන්ම සිදුවී තිබීම විශේෂත්වයකි.

මිහින්තලේ කාලප්‍රාසාදයෙහි පැවැති විශේෂ ධර්ම දේශනාවට රජතුමා ගේ සහභාගිත්වය සිදුවූ බවට ඓතිහාසික තොරතුරු වලින් පැහැදිළි වෙයි. දෙවන පෑතිස් රජතුමා මුළු රාත්‍රියෙහි එහි රැඳී සිටි මෙන් දහම් ශ්‍රවණය කළ බව එහි විස්තර වේ. පංචශීල ප්‍රතිපත්ති ආරක්‍ෂා කරන ලාංකික පිරිසක් ඇතිවන්නේ මෙතැන් සිටය. භණ්ඩුක තාපසතුමාගේ පැවිද්දත් අරිට්ඨ ඇමතිගේ පැවිද්දත් අනුලා දේවියගේ පැවිද්දත් ආරම්භවීමත් සමඟම මෙරට භික්‍ෂු හා භික්‍ෂුණී යන දෙපිරිසක් ඇතිවිය. පසුව එය ව්‍යාප්ත වී සංඝ සමාජයක් බවට පරිවර්තනය විය. භික්‍ෂූන්ට වස් කාලය එළඹීමෙන් වැඩ විසිමට ආරාම නොවූයෙන් මිහිඳු මහරහතන් වහන්සේගේ අනුශාසනා පරිදි දෙවන පෑතිස් රජතුමා අටසැටලෙන් පිළිසකර කරවීය. ස්වාභාවික ලෙන් , විහාර ආරාම, බවට පත්විය. දාගැබ්, විහාර, ගොඩනැංවීමද මෙකළ සිදුවිය. ථූපාරාම දාගැබත්, මහ විහාරයත් මෙලෙසින් ගොඩනැගුණි.

ලක්දිව බොහෝ ප්‍රදේශවල විහාර, දාගැබ් ඉදිකිරීමට මූලික වුයේද මිහිඳු මහරහතන් වහන්සේ ගෙන් ලැබුණු අනුශාසනාවන්ය. ආගමික, සංස්කෘතික, සදාචාරාත්මක වෙනස්වීම් සිදුවුයේද පොසොන් පොහෝදා සිදුවූ මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකාගමනය නිසාම බව කිවහැකිය. ලාංකික ජනතාව විහාරස්ථාන කරා පොහෝ දිනවලට ඇදී යෑමද සිදුවුයේද දාන, ශීල, භාවනා යන දැහැමි ප්‍රතිපදාවන්ගෙන් යුක්ත වූයේ පොසොන් පෝදා සිදුවූ මහින්දාගමනය නිසාම බව පැවසිය හැකිය. දැහැමි සමාජයකට මුලපිරූ අතිශයින් වැදගත් දිනයක් වූ පොසොන් පොහෝ දින ලාංකික බෞද්ධ ජනතාවට ආමිස පූජාවන්හි යෙදීමට අවස්ථාව සැලසී ඇතිබව කිවහැකිය. ඇතැම් පිරිස් මෙවැනි උතුම් දිනයන්හි විනෝද චාරිකාවන් පවත්වමින් කාලය ගෙවන බවක් පෙනේ. එවැනි අවස්ථාවන් ඇතිවීම, ආගමික පරිසරයන්ට නොගැලපේ. පොහෝ දිනය ආමිස හා ප්‍රතිපත්ති පූජාවන්හි යෙදීම බෞද්ධ ඔබ අප සැමගේ වගකීම හා සත් ක්‍රියාවද වන්නේමය. එය සැබවින්ම මිහිඳු මහ රහතන් වහන්සේට කරන ගෞරවයක්ද වනු ඇත.

ඇම්.ඩී.විජයවර්ධන

## පුදබිමක අසිරිය

# හඟුරන්කෙත අරත්තන රජමහ විහාරය

හඟුරන්කෙත සිට මහනුවර මාර්ගයේ සැතැපුම් දාසයක් පමණ ගියවිට මෙම පුදබිම හමුවේ. මෙහි මහාසංඝරත්නයට අයත් වෙල්යායක් තිබුණ නිසා ''හඟුරන්කෙත'' යන නාමය යෙදුන බව ජනප්‍රවාදයන්හි සඳහන් වෙයි.

කන්ද උඩරට පාලකයාව සිටි (ක්‍රි.ව.1739-1747) ශ්‍රී විජය රාජසිංහ රජතුමා විසින් ''අර අතන විහාරය''කරවන ලෙස නියම කරන ලද බවක් එතැන් සිට ''අරත්තන'' යන නාමය භාවිතා කළ බව පැරණි ග්‍රන්ථවල සඳහන් වෙයි. මෙම විහාරස්ථානයේ අතීත තොරතුරු රාශියක් මෙහි දක්නට ලැබේ. ශ්‍රී ලංකාවට වැඩම කරවන ලද බෝධින් වහන්සේගේ දෙතිස්ඵල බෝධින් වහන්සේ නමක් මෙහි රෝපණය කර පුදපූජා පවත්වා තිබේ.



මෙම විහාර මන්දිරය චිත්‍ර, ලී කැටයම්, සඳකඩපහණ,දොරටුපාල බහිරව රූප වලින් අලංකාර වී තිබීම විශේෂත්වයකි. විහාරයට පිවිසෙන පියගැට පෙළ අසල විශාල ''බහිර රූප'' දෙකක් දක්නට ලැබේ.මහනුවර යුගයට අයත් ''ත්‍රිකෝණාකාර'' සඳකඩපහණින් හමුවී තිබේ. විහාරයට පිවිසෙන ස්ථානයේ දර්ශනීය මකර තොරණක් දක්නට ලැබේ.



විහාර අභ්‍යන්තරයේ ඇති සමාධි බුද්ධ ප්‍රතිමාව ලී සහ මැටි වගී භාවිතයෙන් නිර්මාණය කර ඇත. ''පෙතිකඩ'' සිතුවම් මෙහි දක්නට ලැබේ. ජාතක කථා සහ බුද්ධ චරිතය සිතුවමට නගා තිබෙනු විශේෂයෙන් දැක්වීමට පුළුවන. වාර්ෂිකව පැවැත්වෙන ඇසළ පෙරහැර නිමවීමෙන් පසු දිය කපන අසිපත මෙම විහාරයේ තැන්පත් කිරීම සිරිතකි. නුවර යුගයේ රාජ්‍ය පාලනය කළ රජවරුන් විසින් සිදුකරන ලද පරිත්‍යාගයන් පිළබඳ තොරතුරු ඓතිහාසික ග්‍රන්ථවල සඳහන් වෙයි.

මුත්තුසාමි රජු විසින් කරන ලද පරිත්‍යාගයන් ද සෙනරත් රජු,විමලධර්ම සූරිය රජු,කීර්ති ශ්‍රී රාජසිංහ රජු යන අයගේ පරිත්‍යාගයන්ද විහාර තොරතුරුවල සඳහන් වෙයි. මෙම පරිත්‍යාග සන්නස් පත්‍ර මගින් තහවුරු වී තිබේ. මහනුවර යුගයට අයත් විහාරස්ථාන අතර හඟුරන්කෙත අරත්තන විහාරස්ථානයට සුවිශේෂි ස්ථානයක් හිමිවේ. මෙම ඓතිහාසික විහාරස්ථානය නරඹන අයගේ වගකීම මෙන්ම යුතුකම වන්නේ පරිසරයට මෙන්ම මේ ස්ථානයේ පවතින පැරණි දේවල් ආරක්‍ෂා කිරීමත් ඒවා සංරක්‍ෂණය කිරීමත්ය.

ඇම්. ඩී. විජේවර්ධන

# හෙළ බොදු රටක් බිහිකළ මහින්දාගමනය



මහින්දාගමනය බෞද්ධ ශාසනික ඉතිහාසයේ සිදුවූ සුවිශේෂී වූ සංසිද්ධියකි. මහින්දාගමනය පිළිබඳව සාහිත්‍යයික මූලාශ්‍ර වලින් හෙළිදරව් කරන ඇතැම් කරුණු පුරා විද්‍යාත්මක සාධක මගින් මනාව සනාථ කෙරේ.

මහින්දාගමනය පිළිබඳ තොරතුරු හැදෑරිය හැකි වැදගත් සාහිත්‍යයික මූලාශ්‍රයක් ලෙස මහාවංශය, දීපවංශය, සමන්ත පාසාදිකාව, මහබෝධිවංශය ආදී පාලි කෘති සහ පූජාවලිය, භික්ෂු බෝධි වංශය යන ග්‍රන්ථ මෙන්ම පුරාවිද්‍යාත්මක සාධක වශයෙන් අම්පාර දිස්ත්‍රික්කයේ රජගලින් හා මිහින්තලයෙන් සොයාගත් සෙල්ලිපි දෙකක් දැක්විය හැක. වංශ කතා අනුව මහින්දාගමනය සිදුවූයේ සම්බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ 236ක් ඉකුත් වූ පොසොන්පුර පසළොස්වක පෝය දිනක දීය.

එම වර්ෂය ශ්‍රී ලංකාවේ පාලක දේවානම් පියතිස්ස රජතුමාගේ ප්‍රථම රාජ වර්ෂය වූ අතර එවකට ඉන්දියාවේ පාලක ධර්මාශෝක අධිරාජ්‍යයාගේ අටවැනි රාජ වර්ෂය විය. ධර්මාශෝක අධිරාජයාගේ 17 වන රාජ වර්ෂයේදී පවත් වන ලද තුන්වන ධර්ම සංඝායනාවෙන් පසුව රටවල් (ජනපද) නවයකට ධර්මදූත කණ්ඩායම් නවයක් පිටත්කර යවන ලද බව සමන්ත පාසාදිකාව හා මහාවංශයේ සඳහන් වේ. (සමන්ත පාසාදිකාව 1, 36, 37 පිටු - මහාවංශය 12 පිටුව - ඒ. බී. බුද්ධයත්ථ තෙර, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම - 1959) මින් එක් කණ්ඩායමක් වූයේ මිහිඳු හිමි සමඟ ලංකාවට පැමිණි කණ්ඩායමයි. හියුංත්සාං විසින්ද මෙම කරුණ සනාථ කොට ඇත.

වංශකතාගත තොරතුරු වලට අනුව පමණක්ම නොව ශ්‍රී ලංකාවෙන් හමුවී ඇති පුරා විද්‍යාත්මක සෙල්ලිපි වලින් ද ධර්මදූත සේවය පිළිබඳ තොරතුරු අනාවරණය වී ඇත. ශ්‍රී ලංකාවට පැමිණි ධර්මදූත කණ්ඩායම මේ පිරිසට ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන හතර නමද සංඝමිත්තා තෙරණියගේ පුත්‍රයෙකු වූ සුමන සාමණේරයන් වහන්සේ හා වේදිස දේවියගේ නැගණියගේ දුවගේ පුත්‍ර භණ්ඩුක ද අයත්වූහ. සමන්ත පාසාදිකාවේ භණ්ඩුක මුලදී ධර්මදූත කණ්ඩායමට එකතු වූ බවක් සඳහන් නොවූ අතර වේදිසගිරියේදී එකතුවූ බව දක්වා ඇත.

ශ්‍රී ලංකාවට පැමිණි ධර්මදූතයින් වහන්සේලා පිළිබඳව තොරතුරු අම්පාර දිස්ත්‍රික්කයේ රජගලින් සහ මිහින්තලයෙන් සොයාගත් සෙල්ලිපි වල සඳහන් වී ඇත. මිහිඳු හිමි අවුරුදු අසූවක් (80) ආයු වළඳා උත්තිය රජතුමාගේ අටවැනි රාජ වර්ෂයේදී පිරිනිවන්පෑ බව මහාවංශයේ සඳහන් වී ඇත. (මහාවංශය 20, 32, 33 පරිච්ඡේද) දිවයිනේ ධර්ම ප්‍රචාරය සඳහා පැමිණි ධර්මදූතයින් වහන්සේලා මිහින්තලය, අනුරාධපුර යන ප්‍රදේශ වලින් බැහැරව ධර්මප්‍රචාරක කටයුතුවල නිරත වූ බව සාහිත්‍යයික මූලාශ්‍ර වල සඳහන් නොවන අතර රජගල සෙල්ලිපියට අනුව අම්පාර දිස්ත්‍රික්කය වැනි ප්‍රදේශවලද ධර්ම ප්‍රචාරක කටයුතු සිදුකළ බව අනුමත කළ හැක.

ශ්‍රී ලංකාවට පැමිණි ධර්මදූත කණ්ඩායමේ නම් පිළිබඳ මිහින්තලයෙන් හමුවූ සෙල්ලිපියේ කූටකණ්ණ තිස්ස (ක්‍රි.පූ. 44-22) රජුගේ රාජ්‍ය සමයට අයත් වෙයි. මහාචාර්ය පරණවිතාන ශූරීන් දක්වන එම සෙල්ලිපියෙහි "මහිද තෙරවහ" භද්‍රසාල තෙරහව, ඉඨික තෙරහව..." ආදී වශයෙන් හතර නමක ගේ ප්‍රතිමා ගැන සඳහන් වේ. මේ අනුව වංශකතා ලිවීමට සියවස් පහකට පමණ පෙර පිහිටවූ සෙල්ලිපියක ධර්ම දූතයින් වහන්සේලා ගැන සඳහන් කර තිබීමෙන් පෙනීයන්නේ මහින්දාගමය ඓතිහාසික සුවිශේෂී වූ ශාසනික සංසිද්ධියක් වූ බවය.

සෑම රටකටම ධර්ම ප්‍රචාරය සඳහා පිටත්කර හරින ලද්දේ ධර්මදූතයින් වහන්සේලා පස් නමකි. (දීපවංශය 1 පිට. සමන්ත පාසාදිකාව 1 පිටුව, මහාවංශය 1, 27 පිටු) භාරත දේශයේ සිට ලක්දිව බලා අශෝකාරාමයෙන් පිටත් වූ මිහිඳු ප්‍රමුඛ ධර්මදූතයින් වහන්සේලා පස්නමට සහාය පිණිස සුමන සාමණේරයන් වහන්සේ එකතු කර ගත්හ. මේ පිරිසට වේදිස ගිරියේ දී "භණ්ඩුක" ද එකතු විය. (දීපවංශය 12,26 පිටු හා මහාවංශය 13, 17, 18 පිටු) ඒ අනුව සෙසු රටවලට ගිය කණ්ඩායම් වලද සහායකයින් වහන්සේලා සිටින්නට ඇතැයි කල්පනා කළහැක. ශ්‍රී ලංකාවට එවූ ධර්ම දූතයින් වහන්සේලා ගැන විමසා බලන විට පෙනී යන්නේ කිසියම් විශේෂතාවය ක් කර ඇති බවයි. එනම් ශ්‍රී ලංකා ධර්මදූත කණ්ඩායමේ නායකත්වය ඉසුලූ මිහිඳු හිමි ධර්මාශෝක රජුගේ පුත්‍රයෙකු වූ බව සඳහන් වීම නිසාය.

මේ ආකාරයට ධර්ම දූතයින් වහන්සේලා සමඟ පැමිණි සුමණ සාමණේරයන් මෙන්ම භණ්ඩුකත් ශ්‍රී මහා බෝධින් වහන්සේගේ ශාඛාව රැගෙන ලංකාවට පැමිණි සංඝමිත්තා තෙරණියත් රජ පවුලට සම්බන්ධ වූ අය වූහ. (ලංකා ඉතිහාසය පේරාදෙණි වි.වි. I කාණ්ඩය) මේ අනුව ධර්මාශෝක අධිරාජ්‍යයාගේ පුත් කුමරෙකු වූ මිහිඳු හිමියන් මෙන්ම දූ කුමරියක වන සංඝමිත්තා තෙරණියත් එසේ ම මුණුපුරන් දෙදෙනෙකුත් එවීමෙන් ශ්‍රී ලංකාවට විශේෂ සැලකිල්ලක් දක්වා ඇති බව පෙනේ. එසේ එවීමේ ප්‍රතිඵල ඉතා වැදගත් වූ බව අද දක්වාම ශ්‍රී ලංකාව ථෙරවාදී බෞද්ධ සම්ප්‍රධායේ සුවිශේෂී මධ්‍යස්ථානයක් වශයෙන් පැවත ගෙන ඒමෙන් ගම්‍යමාන වේ.

මහින්දාගමනයට සුදුසු කාල වකවානුව කුමක්ද යන්න තීරණය කිරීමේ දී පෙනී යන්නේ මුටසීව රජුට පසුව රාජ්‍යයට පත් දේවානම් පියතිස්ස රජුගේ රාජ්‍ය කාලය ඊට වඩාත් උචිත කාලය වූ බව වංශකථා වල සඳහන් වේ. දේවානම්පියතිස්ස රජු රාජ්‍යවයට පත් වූ විට අගනා රන් රුවන් පහළ වූ අතර ඒවා තම බෑණා වූ අරිට්ඨ ඇතුලු දූත පිරිසක් මගින් මිතුදම තහවුරු කරගැනීම් වස් ධර්මාශෝක අධිරාජ්‍යයා වෙත යවන ලද බව වංශ කතාවල සඳහන් වේ. මේ පුද පඬුරුවල වටිනාකම ඉතා ඉහල මට්ටමක තිබූ අතර ඊට ප්‍රතිත්‍යාග වශයෙන් පරිත්‍යාග හරින ලද්දේ ධර්මදූතයින් වහන්සේලා පස් නමකි. (දීපවංශය 1 පිට. සමන්ත පාසාදිකාව 1 පිටුව, මහාවංශය 1, 27 පිටු) භාරත

15 පිටුවට...

විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂ ඩී.එම්.එච්.කරුණාරත්න මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පළ කෙරේ.

# බුදු පිළිමයේ දැක්වෙන "කේතුමාලා"



බෞද්ධ අට්ඨකථාවලට අනුව වන ආකාරයට අප තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශරීරය තුළින් රියන් අසූවක් පමණ වන රශ්මි කදම්භයන් විහිදෙන බව සඳහන් වේ. එම රශ්මි මාලාව නීල, පීත, ලෝහිත, ඕදාත, මාජෙෂ්ඨ සහ සුභාෂ්වර යන වර්ණ වලින් යුක්ත වී ඇත.

බුදුරජාණන් වහන්සේගේ කෙස් වලින් නීල රශ්මියද සිරුරින් කහපාටද තොල්වලින් රතු පාට ද දත් වැනි ස්ථාන වලින් සුදු පාටද ප්‍රභාෂ්වර නම් වේ. මෙම රශ්මි මාලාවන්ගේ සම්මිශ්‍රණයන් ලෙසද රශ්මිමාලා පිලිබඳව හැඳින්විය හැක. ලක්දිව ඇතුලත වූ බුදුපිළිම හා අදාළ සිතුවම්වල මෙම වර්ණයන් දකින්නට ඇත්තේ මහනුවර යුගයේ සිතුවම්වල පමණක් බවට විද්වතුන්ගේ මතය වී ඇත.

කේතුමාලා පිළිබඳව වැඩිදුරටත් අධ්‍යයනය කරද්දී සමන්ත ප්‍රාසාදිකා" නම් ග්‍රන්ථයට අනුව බුදුන් වහන්සේගේ හිස වටේට විවිධ කේතුමාලා වලින් බැබලෙන බව දක්වා ඇත. හිස මුදුනේ මැද පෙනෙන උන්නතස්සානය "රංසිප්‍රංජරය" කේතුමාලාව වශයෙන් ඉපැරණි බෞද්ධ ලේඛණයන්හි දැක්වෙන බව පෙනී යයි.

කේතුමාලාව යන්න අසීත්‍යා නුව්‍යඤ්ජන වලින් එකක් බවද ධම්ප්‍රදීපිකාවේ දැක්වෙන බවද සඳහන්ය. පූජාවලිය ග්‍රන්ථයට අනුව "සිරෝධාතුවෙන් මඩු රියනක් නැගි සෑම විටෙකම ජ්‍යොතිමත්ව තිබෙන්නාවූ කේතුමාලා නම් රශ්මි කදම්භය ලෙස සඳහන් වන බවද කියැවේ.

මහාවංශයට අනුව ක්‍රි.පූ 3 වැනි සියවසේදී අශෝක අධිරාජයා සඳහා මහා කාල නාගරාජයා මවන ලද බුදු පිළිමයෙහි දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් අසීත්‍යානුව්‍යඤ්ජන භ්‍යාමප්පභා කේතුමාලා යන අංග වලින් යුක්ත බව පැහැදිළි වේ. කෙසේ නමුත් ඉහත හැඳින්වීම් වලට අනුව අප මහා සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ සිරුරේ ශීර්ෂයෙන් නික්මෙන විවිධ ආලෝක ධාරාවන් කේතුමාලා වශයෙන් දක්වා ඇත.

දීඝ නිකායේ ලක්ඛණ සූත්‍රයෙන් මහා ප්‍රදාන සූත්‍රයෙන් බුදුන් වහන්සේගේ කායික ලක්ෂණ විස්තර වුවද කේතුමාලා ලක්ෂණ ගැන සඳහන් නොවන බව විද්වතුන්ගේ මතය වී ඇත. කෙසේ නමුත් ක්‍රි. පූ. 3 වැනි සියවසේ බුදුපිළිමයේ තිබිය යුතු මූලික ලක්ෂණ වලට කේතුමාලා ඇතුලත් වියයුතු බව පිළිගැණිනි. මීට අමතර වශයෙන් දෙතිස් මහා පුරුෂ ලක්ෂණ හා භ්‍යාම ප්‍රභා තත්වයද තිබිය යුතු බවත් බුද්ධ ශරීරයෙන් නික්මෙන රශ්මිධාරාව භ්‍යාම හෝ බඹයක් බවත් එය හිසට පිටුපස රවුම් වළල්ලක හැඩයෙන් හිස මුදුනේ සිරස්පතක හැඩයෙන් දක්නට ලැබේ.

මහායාන බුදු පිළිම වල දක්නට ලැබෙන්නේ කේතුමාලාව මගින් හිස මුදුනේ ඉහළට පිම්බුණු කවාකාර වුණු කේතුවක් එම ප්‍රතිමා නෙළීමේ ලක්ෂණය පසුකාලීනව විවිධාකාරයෙන් විකාශණය වී ඇත. සිරස්පත උෂ්ණීය ප්‍රභය කොට ඇති වූ අතර කාලාන්තරයක් එලෙස භාවිතාවීමෙන් කේතුමාලාව ලෙසට පරිවර්තනය වී ඇත. මේ ආකාරයට නිර්මාණ කිරීමේදී ඇතැම් ශිල්පීන් වජ්‍රයක ආකාරය මතුකර දැක්වූ බව පැවසේ. පැරණි බෞද්ධ චිත්‍රයක හෝ බුදු පිළිමයක කේතුමාලා ඇතුලත් ව නොතිබුණු බවට මථුරා, ගාන්ධාර, සාරානාත් පිළිම වලින් තහවුරු වේ.

අජන්තා බිතු සිතුවම් නෙලීමේදී පළමුව සිදුකළ නිර්මාණයන්හි රැස්වළල්ල දක්නට ලැබෙන්නේ ශීර්ෂය වටා වෘත්තාකාර ලෙසය. එහෙත් අනුරාධපුර යුගයට අයත් ප්‍රසිද්ධ පිළිමවල කේතුමාලා හෙවත් රැස්වළලු නොමැත්තේය. එහෙත් හිඳගල බුද්ධ චිත්‍රයෙන්ද පිදුරංගල දාගැබෙන් හමුවූ කැටයම් බුද්ධ රූප වල පසුකඩ වෘත්තාකාර රැස්වළල්ල තුළින් කේතුමාලාව දක්වා ඇත.

මහියංගන දාගැබ් ධාතු ගර්භයේ ඇති බුදු රුවේ ශීර්ෂය වටා වෘත්තාකාර සැරසිල්ලක් ලෙසින් කේතුමාලාව අලංකරණය කොට දක්වා ඇත. දිඹුලාගල ගල්ගෙයි චිත්‍ර අතරද සැරසිලි නොමැති කේතුමාලා රූපාකාර රැස්වළලු උරහිස උඩින් හිස වටා නිරූපණය කොට දක්වා ඇත. මථුරාහි බුද්ධ ප්‍රතිමා දෙකද සාරානාත්හි සමාධි බුද්ධ ප්‍රතිමාවේද ඉතා මනහර ලෙස රැස්වළල්ල කේතුමාලාව විශිෂ්ඨ ලෙස නිමකර ඇති බව පැවසේ. ඒවා සියුම් කලාත්මක කැටයමින් නිමවා ඇත.

මහනුවර යුගය උදාවත්ම බුද්ධ ප්‍රතිමාවේ කේතුමාලාව ඇතුලත් කරන අන්දම බෙහෙවින් වෙනස් ස්වරූපයක් ගෙන ඇති බව විද්වතුන්ගේ පිළිගැනීමයි. පිළිමය මෙන්ම බිත්තියද චිත්‍රණය කර බුදුරුවේ පාදාන්තය සිට සිරස දක්වා විහිදී යන ආකාරයට කේතුමාලාව රූපාකාර වළල්ලක් ඇඳ තිබේ.

මෙම රැස්වළල්ල නීල, පීත, ලෝහිත, ඕදාත, මාංජෙෂ්ඨ ආදී වර්ණ වලින් රැස්වළලු පහක් ඇතුලත් කොට ගෙන ඇති බව දක්නට ඇත. එයට පිටින් ප්‍රභාෂ්වර නමින් එකී වර්ණ පහ එක වටයක යොදා ඇති බැව් දැකිය හැකිය. සැරසිලි වණී අලංකරණය පිණිස නම් වර්ණයද උපකාරී කොට ගෙන ඇත.

දඹුලු විහාරයේ බිතු සිතුවම් සියල්ලක්ම කේතුමාලාවන්ගෙන් යුක්ත වී ඇති අතර මහනුවර ගංගාරාමයේ බිතුසිතුවම් අතර වූ පිළිමයන් 130ක් චිත්‍රයෙන් දක්වා ඇති අතර ඒ සියල්ලේම කේතුමාලා දක්වා ඇත. එහිම විශාල බුදුපිළිම තවත් 376ක් ඇති අතර ඒවා වටා රශ්මිමාලා කේතුමාලා ඇතුලත්ව නැත. එම පිළිම වහන්සේලා පිළිබඳව අපි තවදුරටත් කරුණු සොයා බලමු.

(තොරතුරු පොතපත ඇසුරිණි)

**පද්මා එන්. කොඩිකාර**

## හිමි නොවැඩියා නම් මේ පින් බිමද නැත

පොවමින් දම් අමා මුවරද දනන් හට
පිබිදූ ජන මනස එළිකොට සිහල රට
අනුබුදු සමිඳු සිරි නාමය මෙනෙහි කොට
පූජා කරමි මේ වනපස කුසුම් මිට

රන් තැටියක් වගේ මිහිකත එළිය කොට
පුන් සඳ මඬල හිනැහේ නිල් අඹර සිට
මිස්සක පව් හිසේ හිමි වැඩ සිටින විට
අඹ මල් පිපුණි තුරු හිස්වල හතර වට

සිරිලක පුරා පැතිරී ගිය තිසරු මත
සුං කොට දමා නැගූ දම් ධජ හතර අත
කරුණා මෛත් ගුණය පිරිපුන් අපරිමිත
හිමි නොවැඩියා නම් මේ පින් බිමද නැත



**ලෙනදොර අනුරාධ මහින්ද**



# අවිජ්ජිත බුද්ධ භූමිය

ඇසට නිරීක්ෂණය වන වර්ණ රූපය, කණට නිරීක්ෂණය වන ශබ්ද රූපය, නාසයට නිරීක්ෂණය වන ගන්ධ රූපය, දිවට නිරීක්ෂණය වන රස රූපය, කයට නිරීක්ෂණය වන පොට්ඨබ්බ රූපය, මනසට නිරීක්ෂණය වන ධම්ම රූප මේ අභ්‍යන්තර බාහිර රූප සංකත වේ.

සකස්වීම් භෞතිකයි. රූප විභජනය කර බෙදා වෙන්කර යාමේදී "ශක්ති" ප්‍රභවයක් බව විදු ඇසට පැණැස විද්‍යාමාන වේ. එහි ඒකීය භාවයක් ඒකාත්මීය බවක් කිසිසේත් ප්‍රකට නොවේ. පැනවිය ද නොහැක. ස්පුඨ කල නොහැක. ඒ පටිච්ච සමුප්පන ධර්මතාවය පමණි. ස්වයංභූ වෙනස් වීමකි.

එහි යථාභූත භාවය නම් ප්‍රකට බවේ ශූන්‍යත්වය අප්‍රකට වීමයි. අප්‍රකට බවේ ශූන්‍යත්වය ප්‍රකට බවයි. මෙම සඳහන් කිරීම වචනයේ පරිසමාප්ත අර්ථයෙන් "එහි ස්වභාවය" ගැන යම් ඉඟියක් පැනවීමට ඒත්තු ගැන්වීම සඳහා පමණි.

අන්‍යෝන්‍ය විපරිණාම ධර්මතාවය පාරිභාෂිත වචනයෙන් ප්‍රකාශ කල නොහැකි නිසාවෙනි. එම ධර්මතාවය ඉඳුරන්ට ගෝචර නොවේ. විඤ්ඤානයට ගෝචර නොවේ. ස්කන්ධ විරහිතභාවය බුද්ධියට ගෝචර කරගත යුතුය. ප්‍රඥාවෙන් දැකිය යුතුය. ශුද්ධ ධර්මවල ඒකීයත්වයක් නොමැත. වහ වහා වෙනස්වන ධර්මතාවයකි.

ධාතුන්හි පරම + අනුවක, පරමාණුවක කෝටිප්‍රකෝටි ගණනක ප්‍රමාණයක් වෙනස් වීම මත "ස්ථිතියක්" හෙවත් "ඇත" පැනවිය නොහැක. "ඇත" නැති තැන "නැත" ද නැත.

අනිත්‍යතාවය හෙවත් වේගය පිළිබඳව බුද්ධිමය දැනුමටත් වඩා ඊට එහා ගිය (සත්‍යඤාණය කෘත්‍ය ඤාණය කෘතඤාණය) අත්දැකීමක් අත්‍යවශ්‍යයයි. සවිඥානක අවිඥානක සංකතයන්ගේ මේ ක්‍රියාවලිය අතරක් නැතිව නොකඩවා සිදුවන ස්වභාව ධර්මතාවක් බව "සතිමත්" ව විමසිය යුතුය. එය අප්‍රමාදී බවයි. එමඟින් අතීතයේ රැස්කල කර්ම ක්ෂය කිරීමට උපන් හැකියාවක් ඇත.

අනවබෝධය මත "සංකත" ධර්මයන්ට ප්‍රතික්‍රියා දැක්වීම නිසා

"සංඛාර" හටගැනීම වැළැක්විය නොහැක. සෑම රූප කලාපයක්ම පරම අනුවලට විභව්නය වීමේදී මූල ද්‍රව්‍ය 8ක් ප්‍රකට වන බව දැක්වේ.

එනම් පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වණ්ණ, ඝන්ධ, රස, ඕජා වේ. පළමු හතර කැපී පෙනේ. ඉතිරි හතර ඇති නමුත් අපැහැදිළිය.

මේවා ශුද්ධාෂ්ඨක කලාප නම් වේ. එක් කලාපයක ප්‍රමාණය වනුයේ අති සියුම් දූවිලි අංශුවකින් හෙවත් ඒකකයකින් 1/46656 පමණ වේ යයි විද්‍යාත්මක ගණනය කර ඇත. (විද්‍යාත්මක සාධක ස්ථිර නිගමන නොවන අතර යම්කිසි වෙනස්වීමක අදහසක් ගත හැක)

එයද වහා වෙනස් වේ. අසුරු ගණන මොහොතක කලාපයන්ගේ වෙනස්වීම ට්‍රිලියන 10 x 12 වාරයක් බව කියවේ.

සම්මුති දේශනාවේ දී "රූපය" ප්‍රකටවන බව පැහැදිළි කරන නමුත් පරමාර්ථ දේශනාවේදී පෙන්නුම් කරන්න දෙයක් නැත. එනම් සම්මුති ව්‍යවහාරයේ "රූපය" යනු මුසාවකි. මේ ලෝකෝත්තර ධර්මතාවයයි.

බුදුරජාණන් වහන්සේගේ දර්ශනය සංකල්ප ඉක්මවා ගිය අති ප්‍රබල ධර්මතාවයකි. එසේ හෙයින්

**"යො පටිච්ච සමුප්පදං පස්සති - යෝ ධම්මං පස්සති"**

යනුවෙන් වදාලහ. සංඥා විරහිත අනිමිත්ත "බුද්ධ" නම් වේ. තථාගත ධර්මයේ පරමාර්ථ දේශනා සම්මුති දේශනා දෙ කොටසේ වෙනස යෝගාවචරයා බුද්ධියෙන් අවබෝධ කටයුතුය. ඇතිවීම, නැතිවීමෙ, සමුදය වය, ධර්මතා පැනවීම් වශයෙන් ප්‍රඥප්ති වශයෙන් ප්‍රවෘත්ති වශයෙන් හුවා දැක්වීම් වශයෙන් ගෙන හැර දැක්වීම් වශයෙන් ආණා දේශනා වශයෙන් දැක්වීම ලෝකෝත්තර සම්මා දිට්ඨියේ දී ඉවත්වේ.

සංකත ධර්මවල උපත පැනවිය නොහැක.

"ප්‍රවර්තනය" හෙවත් "පැවැත්ම" යන වචනය යෙදේ. උපත නැති තැන විපත නැත. ඇත හෝ නැත" නූපදී. ඇත නැතිනම් "නැත" නැත. ලෝක ධර්මයන්ගේ සංකතයන්ගේ යථාර්ථය මූලය ස්වකීය ලක්ෂණ යථාභූතභාවය අඛණ්ඩව අතරක් නැතිව වූ "පටිච්ච සමුප්පන" භාවයයි.

සිතුවිලි වශයෙන් සංකල්ප වශයෙන් පනවා ගැනීම් වශයෙන් සංඥා වශයෙන් ලෝකෝත්තර ධර්මතාවයේ ප්‍රකට බවක් නොවේ. ඒ අසංකත ධර්මයේ ස්වභාවයයි.

ආයර්‍ය පර්යේෂණ චාරිකාවේ දී බුද්ධත්ව ගවේෂණයේදී ගෞතම බෝසතාණන් වහන්සේ මුළු මහත් දඹදිව සිසාරා දර්ශනවාද මතවාද න්‍යාය ධර්ම ඉදිරිපත් කළ ශ්‍රමණ බ්‍රාහ්මණ නිඝණ්ඨ පරිබ්‍රාජක ජටිල තවුසන් වෙත එළඹ එම ඉදිරිපත් කිරීම්වල සත්‍යතාවය හා අසත්‍යතාවය ප්‍රඥා ගෝචරව විමසා බැලූහ.

ඒ ඒ සම්ප්‍රදායන්ගේ භාවනා ක්‍රම මගින් ව්‍රත මගින් යාග හෝම මඟින් ආමිස වශයෙන් කාම සංඥා, රූප සංඥා, අරූප සංඥා සහිත ලෝක ධාතුන්හි සැරිසැරීමක් පමණක් බව වටහා ගත්හ. එම පිළිපැදීම් භව නිරෝධය සඳහා පිටිවහලක් නොවීය. ඒ දෘෂ්ටි ජාලයෙන් මිදීමට "නිවන" බව අවබෝධ කරගත්හ. (සියලුම දෘෂ්ඨි වලින් මන නිදහස් කරගත යුතුය)

ඒ තීරණාත්මක නික්ම යාමේ අභිනිෂ්ක්‍රමණයේ සම්ප්‍රාප්තිය බුද්ධගයාවයි. අවිජහිත ශුද්ධ බුද්ධ භූමියයි. සමස්ත කාමාවචර, රූපාවචර, අරූපාවචර, ජෛන, හින්දු, නිගණ්ඨ,බ්‍රාහ්මණ භාවනා ක්‍රම ඉවත ලූහ. කසින භාවනා ධ්‍යාන භාවනා අරිය පර්යේෂණයේ දී ප්‍රතික්ෂේප විය.

තපස් යෝග වූ අන්ත දෙක අත්හලහ. සිද්ධාර්ථ ගෞතමයාණන් වහන්සේ එම යෝග කෙම් ක්‍රමවල හරයක් නොමැති බව අරිය පර්යේෂණ සූත්‍රයේ මෙසේ සඳහන් කරති.

**තස්මා මයිහං භික්ඛවේ එකදහොසි**
**නායං ධම්මො නිබ්බිදාය**
**න විරාගාය**
**න නිරොධාය**
**න උපසමාය**
**න අභිඤ්ඤාය**
**න සම්බොධාය**
**න නිබ්බාණය**
**සංවත්තති යාවදේව**
**ආකිඤ්චඤ්ඤායත**
**නූප්පත්තියාති**
**සො බෝ අහං භික්ඛවේ තං**
**ධම්මං අනලංකරිත්වා,**
**තස්මාධම්මා නිබ්බජ්ජ**
**අපක්කමිං..."**

සරළ අදහස මෙසේයි.

"මහණෙනි, මට (ආකිඤ්ඤායතන සමාපත්තිය ගැන) මෙබඳු අදහසක් ඇතිවිය. මේ ධර්මතාවය සසර කලකිරීම සඳහා නොවේ. මේ ධර්මතාවය සසර නොඇල්ම සඳහා නොවේ. මේ ධර්මතාවය නිවීම සඳහා නොවේ. මේ ධර්මතාවය කෙළෙස් සංසිඳිම සඳහා නොවේ. මේ ධර්මතාවය විශේෂ දැනුමක් සඳහා නොවේ. මේ ධර්මතාවය සම්බෝධිය සඳහා නොවේ.

(ලෞකික සමථ සමාධියේදී ලබන චිත්ත සමාධිය ලෞකිකත්වයක් පමණි. ලෝකෝත්තර සඳහා නොවේ. කෙලෙස් යටපත් කිරීමකි. එය යෝග ක්‍රමයකි. තපස් ක්‍රමයකි. පළමු ධ්‍යාන ඇතුලු රූපාවචර ධ්‍යානක් ආකාසානඤ්චායතනය ඇතුලු අරූපාවචර ධ්‍යානත් ආරිය පර්යේෂණයේදී ප්‍රතික්ෂේප විය.)

"මහණෙනි, මේ ධර්මතාවය නිර්වාණ අවබෝධය සඳහා නොවේ.

මේ ධර්මතාවය ආකිඤ්චඤ්ඤයතන අරූපි බඹලොව ඉපදීම, සඳහාම වේ. එය මම ශාන්ත නිවනට ප්‍රමාණයත් නොවන බව දැන (එයින් කම් නැත. තෘප්තියට පත්නොවී) එහි කලකිරී වෙන්ව ගියෙමි. සමුගත්තෙමි"

ආලාරකාලාම තවුසාණෝ සමුගත් උන්වහන්සේ උද්දකරාමපුත්ත තවුසා වෙතින් නෙවසඤ්ඤානාසඤ්ඤා ධ්‍යාන සමාපත්තිය ලැබ එයද භාව නිරෝධය සඳහා කාරණා නොවන බව දැන,

**"සෝ බො අහං භික්ඛවෙ කිංකුසලගවේසී අනුත්තර සන්තිවරපදං පරියේසමානො මගධෙසු අනුපුබ්බේන චාරිකං චරමානො..."**

මහණෙනි, ඒ මම කුසලය කුමක්දැයි කුසල ගවේසීව අනුත්තර නිවන සොයමින් මගධ දනව්වේ පිළිවෙලින් සැරිසරන්නේ...." (වජ්‍රාසනය වෙත සමීප වූවෙමි)

සම්බුද්ධත්වයෙන් පසු උරුවේල ජනපදයේ නේරංජනාවේ අජපල් නුග රුක මුල වැඩ සිටි බුදුපියාණන් වහන්සේට මෙබඳු සිතක් ඇතිවිය.

(සංයුක්ත නිකායේ ආයු වග්ගයේ තපෝ කම්ම සූත්‍රයේ)

**"එවං චේතසො පරිවිතක්කො උදපාදී. මුත්තො වතම්හිතාය දුක්කර කාරිකාය. සාධු මුත්තො වතම්හි තාය**
**අනත්ථසංහිතාය, දුක්කරකාරිකාය. සාධු ඨිතොබොධිං සමජ්ඣ න්ති"**

ගාථා රත්නය :-

**"අන්ථ සංහිතං ඤත්වා**
**යංකිඤ්චි අමරත්තපං**
**සබ්බං නත්වාච හංහොති**
**පියා රිත්තං ච ධම්මනි"**

සරල අදහස මෙසේය.

සය අවුරුදු දුෂ්කර සමයක් ගත කළෙමි. ලෞකික සමථයෙන් කෙළෙස් තැවීමේ නියුක්ත වීමි. වැඩදායි බවක් නැති ඒ දුෂ්කර වූ ක්‍රියාවන්ගෙන් ඒකාන්තයෙන්ම මිදුනෙමි. අනර්ථය සඳහාම වූ යහපත් නොවූ දුෂ්කර ක්‍රියාවන්ගෙන් ඒකාන්තයෙන්ම මිදුනා වෙමි. මැනවින් මිදුනෙමි. ගාථාවේ අදහස

"අමර" යයි නමින් යම් කිසි ලෞකික තත්වයක් වේද ඒ සියල්ල අනර්ථය සඳහාම වේ මැයි එය දැන අත්හලේ එමඟින් සිදුවන යහපතක් නැත. කෙසේද යත් මරුකතරේ වූ නැවක් රිටකින් පැදවිය නො හැක්කා මෙනි."

15 පිටුවට...

ගම්පහ සිරි සීවලී හිමි



# බුදුරදුන්ගේ විසිතුරු උපමා දෙසුම්

**ලෝක සත්වයා සසර කතරින් එතෙර කරන්නට කෙලෙස් මලින් මුදවාලන්නට නොමඟ ගිය අය සුමගට ගන්නට මිථ්‍යා දෘෂ්ටිකයන් සම්‍යක් දෘෂ්ටිකයන් බවට පත් කරන්නට නොදමුණු පුද්ගලයන් දමනය කරන්නට අප්‍රමාණ ලෙස දහම් දෙසූ ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම දේශකයාණෝ බුදුරජාණන් වහන්සේමය.**

උන්වහන්සේ විසින් දේශනා කොට වදාළ ධර්මයට වඩා දේශනා නොකළ ධර්මය බොහෝය. අසූහාර දහසක් වූ ධර්මස්කන්ධය නමින් අප හඳුන්වන්නා වූ මේ ධර්මය උන්වහන්සේ දෙවියන් සහිත සත්වයාට දේශනා කළේ ඒ ඒ අයට තේරෙන ක්‍රමවලටය. මෙසේ විශිෂ්ට ලෙස දහම් දෙසූ බුදුරජාණන් වහන්සේ සත්වයාට ඉතා පහසුවෙන් ධර්මාවබෝධය ලබා දෙන්නට උපයෝගී කොටගත් උපක්‍රම රාශියකි. එවන් උපමා ක්‍රම සහ රසවත් කතා රැසක් ඇත. බුදුරජාණන් වහන්සේ යොදාගත් උපමා බොහෝ සෙයින් තත්කාලීන සමාජයේ එදිනෙදා ජීවිතයේ දී මිනිසුන් පරිහරණය කළ දෑම විය. කෘෂි කර්මය, ගොවියා, අලි ඇතුන් වැනි සතුන් ද ඒ අතර විය. පහත් බුද්ධි මට්ටම්වල සිටි පුද්ගලයන්ටද සිහිය විකෘති වූ මහත් දුක් කරදරවලට ලක් වූ තැනැත්තන්ටද ආදි විවිධ මානසික මට්ටම්වලට ගැලපෙන අයුරින් දානයෙන් පටන්ගෙන නෛෂ්ක්‍රම්‍යයෙන් අවසන්වන පරිදි දහම් මග කියා දුන්නේ බොහෝ විට උපමා උපයෝගී කර ගෙන බව බෞද්ධ ත්‍රිපිටක සාහිත්‍යය තුළින් පැහැදිළි වෙයි.

බුදුරජාණන් වහන්සේ දිනක් කසීභාරද්වාජ බමුණා පන්සියක් පිරිස සමග සීසාන කෙත්යායට ගොස් පිරිස ආහාර අනුභව කරන තැනට පිඬුසිගා වැඩියහ. ඒ දුටු බමුණා "ශ්‍රමණ හවත් ගෞතමයන් වහන්ස මම නම් සී සාන්නෙමි වපුරන්නෙමි සී සා වපුරා ධාන්‍ය ලබා ගෙන අනුභව කරමි ඔබත් මා මෙන් සී සාන්න වපුරන්න සී සා වපුරා ධාන්‍ය ලබාගෙන අනුභව කරන්න" යැයි බමුණා බුදුරදුන්ට කීය. එවිට බුදු හිමියෝ "බමුණ මම ද සී සාන්නෙමි, වපුරන්නෙමි, සී සා වපුරා ධාන්‍ය ලබාගෙන අනුභව කරන්නේමි" යැයි කීහ. එවිට බමුණා ඔබ සී සා වපුරා ධාන්‍ය ලබාගෙන අනුභව කරමි යැයි කියයි. එහෙත් ඔබේ විය ගහක්, නගුලක් සී වැලක් කෙවිටක් හා ගවයන් මම කිසි දිනක දක නැත යැයි කී සේක. එවිට බුදුරජාණන් වහන්සේ අතිශයින් ම වැදගත් ධර්මානුකුල උපමා මගින් තමන් වහන්සේගේ නගුල, සී වැල, කෙවිට හා ගවයින් මොනවාද යන්න බමුණාට දේශනා කළේ මෙසේය.

*"සද්ධා බීජං තපො වුට්ඨි*
*පඤ්ඤාමේ යුග නංගලං*
*හිරි ඊසා මනො යොත්තං*
*සති මේ පාල පාචනං"*

බමුණ මගේ කෘෂි කර්මාන්තයෙහි බිත්තර වී නම් ශ්‍රද්ධාවය. සීලය එහි ජලයයි. මගේ විදර්ශනා ප්‍රඥව හා මහා ප්‍රඥව විය ගහ හා නගුලයි. ලැජ්ජාව එහි නගුලීසය. සිත විය ගහයි. සිහිය සීවැල හා කෙවිටයි" යනුවෙන් තමන් වහන්සේද යම් අයුරක ගොවියෙකු වන බව ප්‍රකාශ කරමින් බමුණාට දහම් දෙසා ධර්මය අවබෝධ කරවිය. මෙලෙස භික්ෂූන්ට ද දහම් දෙසීමේදී කෘෂිකර්මාන්තය උපමා කොට ගත් අවස්ථා ඇත.

මෙලෙසින් බුදුරජාණන් වහන්සේ රජවරුන්ට සිටුවරුන්ට මෙන්ම විවිධ සැඩ පරුෂ පුද්ගලයන්ට ද උපමා මගින් දහම් අවබෝධ කර වූ අවස්ථා රාශියක් ත්‍රිපිටක සාහිත්‍ය පරීක්‍ෂා කිරීමේ දී පෙනී යයි. එවන් සැඩ පරුෂ බමුණකු දිනක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ බුදු රජුන්ට තදින් බැණ වැදුණේය. බුදු පියාණෝ මේ සියල්ල මෛත්‍රියෙන් යුක්තව අසා සිට බමුණා ළගට කැදවා මෙසේ පැවසූහ.

"බමුණ නුඹ මට දූන් බැන්නෙහිය. මම ඒ සියල්ල අසා සිටියෙමි. මම දූන් නුඹගෙන් ද ප්‍රශ්නයක් අසන්නෙමි එයට පිළිතුරු දෙන්න" ඉන් පසු බුදු පියාණෝ මෙසේ වදාළහ.

"බමුණ නුඹේ ගෙදරට අමුත්තෙකු ආ විට ඔබ ඔහුට කුමක් කරන්නෙහිද?"

මම ඔහුට ආහාර පානදී සංග්‍රහ කරන්නෙමි යැයි කීහ. යම් ලෙසකින් නුඹේ සංග්‍රහය ඔහු නොපිළිගතහොත් ඔබ ඒවාට කුමක් කරන්නෙහි දැයි බුදු හිමියෝ ඇසූහ. එවිට බමුණා පවස්න්නේ බැමිණියත් මාත් එක්ව ඒවා අනුභව කරන්නෙමි යන්නයි. එවිට බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ අන්න ඒ වාගේ ඔබ මීට ස්වල්ප මොහොතකට පෙර මට කළ බැනීම් සංඛ්‍යාත සංග්‍රහ මම නොපිළි ගත්තෙමි. එබැවින් ඔබම එය පිළිගෙන භුක්ති විඳින්න යැයි පැවසූහ.

මෙවැනි අපූරු උපමා චුල්ල හත්ථි පදෝපම සූත්‍රය, මහා සීහනාද, චුලසීහ නාද ආදි සූත්‍රවල අන්තර්ගතව ඇත. එසෙ 'ම බුද්ධක නිකායට අයත් ධම්ම පදයේ උපමා සහිත උපදේශාත්මක ගාථා රැසක් දක්නට ලැබේ.

මේ සඳහා උදාහරණයකි, තමා කළ පව් තමා පසු පස විපාක දෙමින් එන්නේ ගොනා පසු පස එන කරත්ත මෙන්ය. 'චක්ඛංව වහතො පදං' ඒ වගේම අටලෝ දහමින් කම්පා නොවී සිටින පණ්ඩිතයා මහා සුළගකින් නොසෙල්වී පවතින මහා පර්වතයකට උපමා කොට ඇත.

**"සෙලො යථා ඒක ඝනො**
**වාතෙන සම්රති**
**එවට නින්දා පසංසාතු**
**න සම්ඤජන්ති පණ්ඩිතා"**

තවද දිනක් බුදුරජාණන් වහන්සේ රාහුල තෙරුන් වැඩ සිටි සේනාසනයට වැඩම කළ අවස්ථාවක දී කුඩා බඳුනක් යටිකුරු කොට තබා රාහුල තෙරුන් අමතා දූන් මේ බඳුනෙහි ජලය ස්වල්පයක්වත් තිබේ දැයි ඇසූහ.යටිකුරු කරන ලද බඳුනෙහි ස්වල්පයක්වත් ජලය නැතැයි රාහුල තෙරණුවෝ කිහ. එවිට බුදු හිමියෝ රාහුල හිමියන් අමතා රාහුලය යම්සේ යටිකුරු කොට තැබූ බඳුනෙහි ජලය ස්වල්පයක්වත් නොපවතීද එසේ ම බොරුකියන තැනැත්තා කෙරෙහි ගුණධර්ම ස්වල්පයක්වත් රදා නොපවතින්නේ යැයි රාහුල තෙරණුවන්ට ජල බඳුන උපමා කොට ගෙන දහම් දෙසූහ.

මෙබඳු සෞන්දර්යාත්මක වටිනා උපමා උපමේයයන් සිය දහස් ගණන් ත්‍රිපිටකය පුරා පවතී. ක්‍රමනුකූලව මහා සාගරය ගැඹුරු වන්නේ යම්සේද එසේම බුදුරජාණන් වහන්සේගේ ධර්මය ද ක්‍රමානුකූලව ගැඹුරුවන ප්‍රඥගෝචර ධර්මයිකි.

එම ගැඹුරු ධර්මය ලෝ සතුන් වෙත පමුණුවා ඔවුන්ට අවබෝධ කරවීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් උපයෝගී කරගත් ක්‍රමවේදය මෙම උපමා භාවිතයයි.

මීගොල්ල ශ්‍රී ජිනරාජ විවේක සේනාසනයේ විහාරාධිපති
දාස්ගිරිය ශ්‍රී සාසනරතන මූලික පිරිවෙනේ පරිවෙනාධිපති
ශාස්ත්‍රවේදී පූජ්‍ය කෝන්ගහවෙල සුමන හිමි.

# පොසොන් උදාවයි

## මිහින්තලාවයි

## දහම් අමාවයි



**දඹදිව අධිරාජයෙකු වූ ධර්මාශෝක රජතුමාගේ ධර්ම දූත සේවාවේ ප්‍රතිඵලයක් වශයෙන් එතුමාගේ පුත් වූ මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රධාන ධර්මදූත පිරිස ලංකා ද්වීපයට පොසොන් පොහෝදින වැඩියහ.**


එවකට ලංකාවේ රාජ්‍යය කෙළේ දෙවන පෑතිස් රජතුමාය. පොසොන් පොහෝදින දඩ කෙළියෙහි යෙදී සිටි රජතුමාට මිස්සක පව්ව අසලදී මිහිඳු මහරහතන් වහන්සේ හමු විය. රජතුමා සහ මිහිඳු මහරහතන් වහන්සේ අතර "අඹ පැනයක්" ඇති විය. එමගින් රජතුමාගේ බුද්ධිය විමසා බැලූ මිහිඳු මහරහතන් වහන්සේ රජුට ධර්මාවබෝධය ලැබීමට තරම් නුවණක් ඇති බව අවබෝධ කර ගෙන පළමුවෙන් ම රජතුමා ප්‍රධාන පිරිස පංච ශීලයෙහි පිහිටුවා අනුශාසනාවක ද පැවැත්වීය. දුන්න පසෙක දමූ රජතුමා මිහිඳු මහරහතන් වහන්සේගේ අදහසට අනුව ධර්ම දේශනාව සඳහා අවශ්‍ය පහසුකම් සැලැස්වීය. මිහිඳු මහරහතන් වහන්සේ ඉට්ඨිය, උත්තිය, සම්බල, බද්දසාල, සුමන යන තෙරවරුන් හා භංඩුක අනාගාමී උපාසකයා සමගින් අනුරපුර නගරයට සම්ප්‍රාප්ත විය. මිහිඳු මහරහතන් වහන්සේට වැඩ සිටීමටත්, ධර්ම දේශනාව පැවැත්වීම සඳහාත් ස්ථිර වූ ගොඩනැගිල්ලක් නොවුයෙන් "ඇත් හල" සකස් කළ බව මහා වංශයෙහි සඳහන් වෙයි. එම ශාලාවෙහිදී ලක්දිව පළමුවන ධර්ම දේශනාව වශයෙන් "චුල්ල හත්ථි පදෝපම" සූත්‍රයෙන් දහම් දෙසූ මිහිඳු මහරහතන් වහන්සේ රජතුමා ප්‍රධාන පිරිසට ධර්මාවබෝධය ලබාදුන්හ. "අරිට්ඨ" ඇමැතියාගේ පැවිද්ද මෙදින සිදු වූ බව ඓතිහාසික මූලාශ්‍රවල සඳහන් වේ. මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රධාන භික්ෂු පිරිසට වාසය කිරීම සඳහා ආරාම නොවුයෙන් මිහින්තලා අවට ස්වාභාවික පිහිටි ගල්ලෙන් "කටාරම්" කොටවා ආරාම බවට පත් කළ රජතුමා අනෙකුත් අවශ්‍ය පහසුකම් ද, නොඅඩුව සම්පාදනය කළේය.

මෙම ලෙන් සිවු දිසාවෙන් වැඩම වන සංඝයා වහන්සේලා උදෙසා පූජාකළ බව "ලෙන්වල" කොටා ඇති අක්ෂරවලින් පැහැදිලිවෙයි. "අගත අනගත චතුදිස සගස දිනෙ" යනුවෙන් එය සඳහන් වෙයි. පිංකම් හා පාපක්‍රියාවන් වෙන් වශයෙන් හඳුන්වා දෙමින්, මිහිඳු මහරහතන් වහන්සේ විමාන වත්ථු හා ප්‍රේත වත්ථු ඇසුරෙන් දහම් දෙසූහ. භික්ෂූන්වහන්සේලාගේ පොහොය කිරීම් සඳහා අවශ්‍ය ගොඩනැගිලි මිහිඳු මහරහතන් වහන්සේගේ අනුශාසනා පරිදි සිදුවිය. අනුරාධපුර නගරයෙහි මහා විහාර සීමාව වෙන්කර අවශ්‍ය බෞද්ධ ගොඩනැගිලි ගොඩනැගූ රජතුමා "වැවයි දාගැබයි" යන සංකල්පයට අනුව වාරි කර්මාන්තය සඳහා වැවත්, බෞද්ධ සංස්කෘතිය සඳහා දාගැබත් ඉදිවිය. කෘෂි කර්මාන්තය මූලික කරගත් ආර්ථික රටාව බුදු දහමෙන් ක්‍රමවත් විය. ප්‍රධාන ආගමික උත්සවය වූයේ බෞද්ධාගමික උත්සවයි.

මිථ්‍යා ආගමික සම්ප්‍රදායන්ගෙන් හා වැරදි ජීවන මාර්ගයන්ගෙන් යුක්තව සිටි මෙකල ජනතාව සම්‍යක් දෘෂ්ටියෙන් හා සදාචාර සම්පන්න සිරිත් විරිත්වලින් යුක්ත පිරිසක් බවට පත්වූහ. රජතුමා ප්‍රධාන ජනතාව පංචශීල ප්‍රතිපදාව මූලික කරගත් ජීවන ප්‍රතිපදාවකට හුරු පුරුදු වූහ. මිහිඳු මහරහතන් වහන්සේ සමග පැමිණි භංඩුක උපාසක පැවිද්දෙන් හා අරිට්ඨ ඇමැතිගේ පැවිද්දෙන් ආරම්භ වූ භික්ෂු සමාජය ක්‍රමක් ක්‍රමයෙන් වර්ධනය වන්නට විය. ඒ අනුව සිවු පසය (චීවර, පිණ්ඩපත සේනාස, ගිලන්පස) ලබාදීම පිණිසත් රජතුමා ප්‍රධාන ජනතාව කටයුතු කළහ. භික්ෂූන් වහන්සේලාද අනුරාධපුර නගරයෙන් බාහිරව ශාසනික කටයුතුවල නිරත වූහ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලක්දිව පුරා බුදු දහම සීඝ්‍ර ලෙස ව්‍යාප්ත වන්නට විය. විහාරස්ථාන මූලික කරගෙන බෞද්ධ අධ්‍යාපන ආයතනද බිහිවිය. රජතුමාට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීමේ අවස්ථාවද, භික්ෂූන් වහන්සේලාට පැවැරිණි. අනුරාධපුර යුගයේ බෞද්ධ ප්‍රබෝධය, ඇති වූයේ බුදු දහමට රජුගේ අනුග්‍රහය නොඅඩුව ලැබුණ හෙයිනි. මෙරටට වැඩම කරනලද මිහිඳු මහරහතන් වහන්සේ නිසා ලක්දිව බෞද්ධ රාජ්‍යයක් බවට පත් වූ බව මහාවංශයේ සඳහන් වෙන ඓතිහාසික තොරතුරු වලින් පැහැදිලි වෙයි.

අජන්තා ශිරෝමණී දිසානායක
පොල්ගහවෙල

# පව්කම් ඵලයෙන් මිදෙන්නට නම්



ඇතැම් ජනයා නුවණ මඳව ඉපිද නොයෙකුත් පාපී ක්‍රියාවල නියැලෙමින් පව්කම් කොට මහත් සේ දුක් විඳිති. ඔවුනට මතු භවයන්හීදි ඒ හේතුවෙන් දිගටම දුක් විඳීමට සිදුවේ. ඒ බැව් විස්තර කරන ලිපියකි.

බුදුදහමේ දැක්වෙන පංච නියාම ධර්මවලින් එකකි, කර්ම නියාමය. එබැවින් ලෝකයේ සිදුවන සියල්ල කර්මය අනුව සිදුවේ යැයි නිගමනය කිරීම ධර්මානුකූල නොවේ. පුද්ගලයෙකුගේ ජීවිතය තුළ ලබන සැප දුක් තීරණය කරන සාධක අතර කර්මය හැර තවත් සාධක රැසක් තිබෙන බව බුදුදහම විමර්ශනය කරන විට වටහා ගත හැකිය. ගති සම්පත්ති, ගති විපත්ති, උපධි සම්පත්ති, උපධි විපත්ති, කාල සම්පත්ති, කාල විපත්ති, ප්‍රයෝග සම්පත්ති, ප්‍රයෝග විපත්ති, වශයෙන් මිනිසා විඳින දුක් , සැප තීරණය වන ප්‍රබල සාධක හතරක් ගැන බුද්ධ දේශනාවේ දැක්වේ.

උපදින භවයට අදාළ විශේෂ සැප සම්පත් එතැන ඉපදීම නිසාම යම් කෙනෙක් ලබයි නම් එය "ගති සම්පත්තිය" ලෙස හැඳින්වෙන අතර යම් කෙනෙක් ඉපදුණු තැන ස්වභාවය අනුව දුක් විඳීමට සිදුවීම "ගති විපත්තිය" ලෙසත් හැඳින්වේ.

උපධි යනු, කෙනෙකු තුළ තිබෙන අනෙකුත් අයගේ පැහැදීම හෝ නොපැහැදීම ඇති කරවන පෞරුෂ ලක්ෂණ, රූපය සහ ගුණදහම් ඇති අය එම ආකර්ෂණීය පෞරුෂ ලක්ෂණ නිසා සමාජය තුළ ලබන පිළිගැනීම හා හිතෛෂිභාවය නිසා සැප සම්පත් ලැබීම, "උපධි සම්පත්තිය" වශයෙන්ද එසේ නොවන අනුන්ගේ නොපැහැදීම ඇති කරවන, අප්‍රසාදජනක පෞරුෂ ලක්ෂණ නිසා දුක් විඳීම "උපධි විපත්තිය" වශයෙන් දැක්වේ. "කාල සම්පත්තිය" යනු ඒ ඒ කාලසීමාවලදී, කෙනෙකු ඉපදී සිටින තැන්වල ඇති වී තිබෙන විශේෂ සැප සම්පත් ඒ ඒ කාලසීමාවලදී ඇතිවන යහපත් කාලගුණික වෙනස්කම් නිසා ඇතිවන සශ්‍රීක බව ආදිය නිසා ලබන විශේෂ සැප සම්පත්ද "කාල සම්පත්තිය" වශයෙන් හැඳින්විය හැකිය. විවිධ ස්ථානවල ජීවත් වීමේදී ඒ ඒ ස්ථානවල පවතින පරිසර හා පුද්ගලයන්ගේ ස්වභාවය අනුව ලැබෙන සැප- දුක් "ගති සම්පත්ති හා ගති විපත්ති" වශයෙන්ද ඒ ඒ කාල අනුව ඇතිවන බාහිර සාධකවල වෙනස්කම් අනුව ලැබෙන සැප-දුක් "කාල සම්පත්ති හා කාල විපත්ති" වශයෙන්ද සැලකිය හැකිබව පෙනේ. ඒ අනුව ඒ දෙකෙන්ම අදහස් කර ඇත්තේ දේශගුණය අනෙකුත් පුද්ගලයන්ගේ දක්ෂතා ආදී බාහිර සාධකවල වෙනස්කම් අනුව ජීවිතයේ විවිධ දුක්-සැප ලැබීමට හේතුවන බවය.

"ප්‍රයෝග සම්පත්තිය" යනු කෙනෙකුගේ බුද්ධිය සහ උත්සාහය නිසා ලබන යහපත්ප්‍රතිඵලය. "ප්‍රයෝග විපත්තිය" යනු උත්සාහය හා නුවණ දෙකම නිසා කෙනෙකු ලබන යහපත් ප්‍රතිඵලය.

එක දෙයක් සිදුවීමට හේතු රැසක් බලපාන බුදුදහම, නා නා හේතුක වාදයකි. බුදුදහමෙන් පෙන්වා දෙන යථාර්ථය එයයි. කර්මය, උත්සාහය, නුවණ ඇසුරු කරන්නට ලැබෙන අයගේ ගුණ, නුවණ, දක්ෂතා, දේශගුණික වෙනස්කම්, තමන්ගේ පෞරුෂ ලක්ෂණ ආදී දහසකුත් එකක් සාධක අපට ලැබෙන දුක-සැප තීරණය කිරීමට හේතුවෙයි.

අපගේ ජීවන අත්දැකීම් විමසා බලන විට, ඒ ඒ හේතුන්ගේ බලපෑම් සංයුතිය මත, ඒ ඒ සැප-දුක් ලැබීම තීරණය වන බව පෙනේ. ඒ අනුව යථාර්ථවාදීව බලන කල කර්මය බලවත් අවස්ථාවලදී අනෙකුත් සාධක ඉක්මවා එය ක්‍රියාත්මකවිය හැකි බවත්, ඒ ඒ මොහොතේ වැඩිපුර බලවත්වන සාධක අනුව කරුණු සිදුවන බවත් වටහා ගත හැක.

එබැවින් තමන්ගේ කර්ම ශක්තියද ඉතා පිරිසිදු, යහපත්, ප්‍රබල මට්ටමක පවත්වා ගැනීම ජීවිතයට අතිශයින්ම වැඩදායකය. එවිට එය අනෙකුත් සාධක අභිබවා ජීවිතයට ආරක්ෂාව හා යහපත සලසන ප්‍රබල බලවේගයක් වනු ඇත. එබැවින් නුවණ හා උත්සාහය මෙහෙයවා පිරිසිදු සිතෙන් යහපත් ක්‍රියාවෙන් ජීවිතයේ සාර්ථකත්වය කරා ළඟා විය යුතු බව බුදුදහමට අනුව නිර්දේශ කළ හැකිය. බරපතළ පාප කර්ම කළ අයට එම පව්වල නපුරු විපාක මතුභවයන්හිදී අත්විඳීමට සිදුවීමට ඉඩ ඇත. කරන ලද පව්කම්වල බලය ගෙවී නිමවන තුරු අදාළ පුද්ගලයාට එහි විපාක විඳීමට සිදුවේ.

මෙත්තාභි අසේකා
මෙහෙණින්වහන්සේ.

# නිර්මල බුදු දහමින් පෝෂණය වූ ග්‍රැමෆෝන් ගී



මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කිරීමත් සමඟම නිර්මල බුදුදහම ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත වී ගිය අතර, ග්‍රැමෆෝන් තැටි මගින් නිකුත් වූ ගීත වල අන්තර්ගත වුයේද බොදු දහමයි.

1930 දශකයේ ග්‍රැමෆෝන් තැටි භාවිතය ඇරඹීමත් සමඟම බොහෝ ගීතවල පදවැල නිර්මාණය වුයේද බුදු දහම හා එයින් කිය වුණ පණිවිඩ ඇසුරෙනි.

එම දශකයේ මුල් යුගයේ දී බිහි වූ ගීතවල පද රචකයා වුයේ යු.ඞී.පෙරේරා මහතාය. එච්.එම්.වි. ලේබලය යටතේ නිකුත් වූ ''සම්බුදු ස්වාමි - ගුත්තිල පඬිවී'' නමැති ගීතය එවකට ඉතා ජනප්‍රිය ගීතයකි. එය ගායනා කළ ගායකයා සිංහල ජාතිකයෙකු නොවීමද සුවිශේෂවූ කරුණකි. අහමද් මොහිදීන් මහතා විසින් ගායනා කළ එම ගීතයේ සංගීතය සපයා ඇත්තේ මොහොමඩ් ගවුස් මහතාය. ඔහුද සිංහල ජාතිකයෙකු නොවීමද ඉතා වැදගත්ය.

සම්බුදු ස්වාමි - ගුත්තිල පඬිවි
බරණැස් නගරේ ඉපදුන කාලේ
සුන්දර වීණා ශිල්ප මනා සේ
අගතැන් පැමිණ වැයුවේ ඒ කාලේ
පූජිතවී මුළු දඹදිවයෙහි
සෝභන වීලා වාදනයෙහි
දුර්ගුණ දාරි මුසිලයාගේ
ශිල්ප ඉගැන්වූ ඇති සැටි නොදනා
කළ ගුණ නොතකා මුසිල
ගඳ පා කළ සඳ තරඟා
සත්සුරිදාගේ බරණැස වයනා
වැයුමට පඩිගේ සුමධුර නදිනා
වැරදි දුදනා ලැබු අවවාදේ
බඹදත් රජුගේ මැති සබේ සොබනා

මෙම ගීතයේ පදමාලාව තුළින් එම ජාතක කථාවේ කියැවෙන පණිවිඩය ඉතා ප්‍රබලව ප්‍රකාශ වූ බැව් පැහැදිළිව සනාථ වන කරුණකි.

1940 වර්ෂයේ කොලොම්බියා ලේබලයට යු.ඩී.පෙරේරා ශූරීන් විසින් රචනා කරන ලද ඒ. ආර්. එම්. ඉබ්‍රාහිම් මහතා විසින් රචනා කරන ලද මොහොමඩ් ගවුස් මහතා විසින් සංගීතය සැපයූ ''සෝෂක සිටුගේ කථා'' යන ගීතය තුළින් තවත් ජාතක කථාවක් සමාජය වෙත ලබා දී ඇත.

එම ගීතයේ එන
''දිව්‍ය භවනෙහී ශ්‍රී සම්පත් වාසී
තව් සන්දි නම් සුන්දර නගරේ
නගර සෝබනී උත්‍රාව දිනුදා
කසල ගොඩේ දමුයේ නසන්ටා
බුදුන් නොමැතිවු කිතු ගොස පැවේ
බිළිදුන් රැගෙනා කසල ගොඩේ උන්
දර්ශන පුරෙහි වඩනා කාලේ
සිතුසේ විසදා උන්
යනුවෙන් දක්වා ඇත.

''කොලොම්බියා'' ලේබලය සඳහා යු.ඩී. පෙරේරා මහතා විසින් රචනා කරන ලද ''අනෝමා ගංතිරේ'' ගීතය ගායනා කළේ ඇලන් රත්නායක ශිල්පියාය. හඬෙහි ඇති ප්‍රබල තාවය නිසා එම ගීතයට ජීවයක් ලබාදීමට ගායකයා සමත් වී ඇත.

40 දශකයේ දී බිහිවුණ මෙම ගීතය එදා සෑම බෞද්ධාගමික උත්සවයකම ශබ්ද විකාශන යන්ත්‍ර හරහා ජනතාවට ඇසුනු බවත්, 50 දශකයේ දී ජාතික ගුවන් විදුලිය ඔස්සේ නිතර ඇසුන බවත් වාර්තාවේ.

**''අනෝමා ගංතිරේ - සුවෙහි වැඩ හිද**
**බෝසත් ස්වාමි - බෙදා හදා සාමේ**
**ශ්‍රී බුද්ධත්වේ - ලැබේවි නම් ඒ**
**ඝණ රන් පායේ - උඩුගම් යාවි**
**සුරත් වී පැතුසේ''**
යනුවෙන් යෙදේ.

1940 දශකයේ දී නිකුත් වූ ග්‍රැමෆෝන් තැටියක් ඔස්සේ ඇසුන ''රාජ පණ්ඩිත නාග විමානේ'' යන ගීතය යු. ඩී. පෙරේරා මහතා විසින් රචනා කරන ලද ඉතා ජනප්‍රිය වූ ගීතයකි. ඒ. ආර්. එම්. ඉබ්‍රාහිම් විසින් ගායනා කරන ලද එම ගීතය තවත් ජාතක කථාවක් ජනතාවට ලබා දී ඇත.

රාජ පණ්ඩිත නාග විමානේ
ලෝ හිමි විදුර පඬිගේ නාමේ
කිර්ති සුන්දර තේජස පැවේ
ලෝ හිමි විදුර පඩිගේ නාමේ

එම දශකයේ HMV තැටියක් සඳහා ලක්ෂම්බායි නම් ගායිකාව විසින් ගායනා කළ ''බැඳිලා ඒ රන් තැලියේ - වෛරේ පූර්වකාලේ '' ගීතය රචනා කලේ එම්. ඒ. අරනෝලිස් අප්පුහාමි මහතාය.

බැඳිලා ඒ රන් තැලියේ - වෛරේ පූර්ව කාලේ
භවෙන් භවේ ඉපදී - ගෙවී යයිනම් ඒ පායේ
තිලෝනා හිමි බුදු වී - දම් දෙසනා කාලයේ හි
ඒ වෛරේ නෑරා - ක්‍රොධයෙන් සැදිලා
පලිගන්න සේ ඉපදී

මුනිරාජා නසලා - ගනිමි සිතා බුදු රාජා
කලේය සඝ බේදේ
පා නෙක දුෂ්ට උපා - දුර්මත දාලා
බැරිවීලා සංකා - ගෞතම මුනි රාජා

යු. ඩී. පෙරේරා මහතා විසින් රචනා කරන ලද එස්. ඒ. අහමද් මොහිදින් මහතා ගායනා කළ ගීතය පනහ දශකයේ මුල් යුගයේ දී නිකුත් කළ ග්‍රැමෆෝන් තැටියක යුක්ත විය.

දුල්වන් අප මහා බෝසත්
මහෞෂධ පඩිවි ඉපදී
වාසිදි දුන් කාලේ
දඹදිව් වාසින්ගේ සිත පිනවාලා
කූට උපා දන්නා දිප්පිටියා
බොරුවෙන් රවටා අගුටු මිට්ටා
සක්සඳ දික්කල දෙගුරු ශ්‍රීයා
රුපේට ආලය පා
දර ඉදුවාගෙන එතෙරට වඩිනා - යන සැඳ
අගුටුමිට්ටා පැමිණා
දික්පිටියා හා උරණව තදිනා - මාර්ගේ දෙබර කළා
ඒ දුන බොසත් උන් ගෙන්වාලා
අසා නම් ගොත් නඩු විමසාලා
ඥාණේ පා ලොවටා

1950 දශකයේ දී එස්. එල්. කැකුණාවෙල මහතා රචනා කල ආර්. ඒ. චන්ද්‍රසේන සංගීතවේදියාණන් ගායනය කරමින් තනුව සකස් කල HMV තැටියකින් රසිකයින් වෙත පිළිගැන් වූ ''දස බලධාරි බුදු රජු පෙර කළ'' ගීතය අදටත් ඉතා ජනප්‍රියව පවතින ගීතවලින් එකකි.

දස බලධාරී බුදු
රජු පෙර කල
ඉපද හිමාලේ කිදුරෙකු වීලා
වසනා සඳේහි කිදුරඟ සමගා
වනයේ තුටිනා ප්‍රේමය පාලා
කර ආලේ රාජා ඒ බරණැසෙහි කිදුරිට
මැරුවෝ බෝසත් විදහි පහරා
සක්දෙව්දෝ හෝ දානය කෙරුවෝ

1947 වර්ෂයේ කොලොම්බියා ලේබලයට එම්. ආර්. ජොහාර්ෂා මහතා විසින් ගැයු මීළඟ ගිතයේ පද රචනය යු. ඩී. පෙරේරා මහතාය. සංගීතය මොහොමඩ් ගවුස් සංගිතඥයාණන් විසිනි.

මහා බෝධි මුලේ - බුදු රශ්මි රැස් විහිදෙන්නා
මහා සාක් තුමාණෝ විදු සක් අසුනේ වැඩ ඉන්නා
සුදනා සදෙහි දෙව්ලෝ මල් වැස්ස වසින්නා
මහා සාක් තුමාණෝ විදු සක් අසුනේ වැඩ ඉන්නාසංසාර ජාති ජාති
දෙසුම් උතුම් පාරමි
සංවීර ඥණ මහිමෙන්
ලෝ නාථ මාහිමි
තුන් ලෝ නාථ මා හිමි
ඒකදේය මහා මංගල
වෙසක් සුප සන්තා

යනුවෙන් ගැයු ගීතය අද ද කලාතුරකින් අසන්න ලැබේ.

1930 දශකයේ සිට 1950 දශකය දක්වා ග්‍රැමෆෝන් තැටි ඔස්සේ ඇසුනු ගීත බොහොමයක්ම බුදු දහමින් පෝෂණය වු බව පැහැදිළිය. මෙහි හඳුන්වා දෙනු ලැබුයේ ඉන් ගීත කිහිපයක වැදගත් කොටස්ය.

අද බුදු දහමෙන් පෝෂණය වු ගීතයක් නව පරම්පරාවෙන් ඉදිරිපත් නොවීම අතිශය ශෝකය දනවන අවස්ථාවකි.

මේ සඳහා එම ගිත ජනමාධ්‍යය ඔස්සේ ප්‍රචාරය කිරීමට කටයුතු කල යුතුව ඇත. එම ගීත අප ළඟ නැතැයි කීම හෝ එම ගීත ප්‍රචාරය කිරීමට උපකරණ නැහැයි කීම සත්‍ය නොවේ.

අවශ්‍යව ඇත්තේ උනන්දු වීම පමණි. එම ගීත විකාශය වුවත් නැතත් පරම්පරාවෙන් පරම්පරාවට ඒවායේ වැදගත්කම අඩු නොවේ. අප සෑමවිටම එම ගීත රැකගැනීමට උනන්දු වෙමු.



**හේමාල් යශනාථ විජේසිංහ**
**ශ්‍රී ලංගම, දඹුල්ල ඩිපෝවේ**
**හිටපු ඩිපෝ අධිකාරි**

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

# මිහිඳු දහම මෙනෙහි කරමු

මේ පොලෝතලය මත උපන් එක් ශාස්තෘවරයෙකු මිහිතලයේ වෙසෙන කෝටි සංඛ්‍යාත මිනිසුන්ගේ මාර්ගෝපදේශකයා වීමේ අසිරිමත් සිදුවීම් රැස වෙසක් මාසයේද අප විසින් මහත් භක්තියෙන් සිහිපත් කරන ලදී.

පොසොන් මාසයද එවැනිම වටිනාකමක් ඇති භාග්‍යවත් අවධියක් වන්නේ අප උපන් මේ දේශය සම්බුදු දහමින් ආලෝකවත් වූ උතුම් සංසිද්ධිය මේ මාසය යෙදෙන නිසාය.

බුදුදහම ප්‍රඥාවන්තයින් උදෙසා ඇති එකම විමුක්ති මාර්ගය වන බව මනාව පසක් කරගත් තථාගතයන් වහන්සේ එය දෙසනු පිණිස නුවණැත්තන් පිළිබඳව විමසා බැලූ පරිද්දෙන්ම මිහිඳු සම්දු මෙරට පැමිණ රටේ පාලකයාගේ ප්‍රඥාවන්තභාවය අඹ පැනයෙන් සහ ඥාතී ප්‍රශ්නයෙන් විමසා බැලූහ.

එතැන් පටන් මෙරට සිදුවූ බෞද්ධ ශාසනික, සමාජයීය, සද් විප්ලවය මෙම පුවත්පතේ ප්‍රධාන ලිපි කීපයකින්ම විස්තර වෙයි. සම්බුදු දහම වසර 5000ක් කලක් ලෝකයේ පවතින බව ප්‍රකාශිතය. මේ වන විට ඉන් අඩකට ආසන්න කාලයක් ගතවී අවසන්ය. එතෙක් කාලයක් ගතවුවද එක් අකුරක හෝ සංශෝධනයක් එකතුකිරීමක් හෝ අඩුකිරීමකට සම්බුදු දහම පාත්‍ර වූයේ නැත. එමඟින් බුදුදහමේ විශිෂ්ඨත්වය මනාව තහවුරු වෙයි.

ථෙරවාදී නිර්මල බුදුදහම ලංකාව තුළ ස්ථාපිත වීමට සිංහල භාෂාවද මැනවින් උපකාරී වී තිබෙනු පෙනේ. පින්, පව්, කුසල්, අකුසල්, අපේ පන්සල අපේ හාමුදුරුවෝ නිවන් දැකීම ආදී වශයෙන් සංස්කෘතික හා පාලි ඇසුරෙන් ගොඩනැගුණු හෙළ බොදු භාෂාව විසින් අන් කවරම ජාතියකටත් වඩා බෞද්ධාගම ගෞරව භක්තියෙන් හා නුවණින් වැළඳ ගැනීමට අපට මඟ පාදා දෙනු ලැබ ඇත.

දෙස බස රැස ලෙසත් රට, දැය, සමය, ලෙසත් අපේ විද්වත්හු එකළ මේ සුසංයෝගයෙන් මනාව විස්තර කර දුන්හ. ගද්‍ය, පද්‍ය, සාහිත්‍යයන්හි මෙන්ම ගීතය හා දෘශ්‍ය කලාවන් තුළද ඒ බව කැටි කළහ. එබැවින් බස රැකීද සම්බුදු දහම සුරැකීමක් ලෙස පසක් කළ හැකිය.


සම්බුද්ධ ශාසනය ආරක්ෂාවීමට නම් ලෝ පුරා වෙසෙන බෞද්ධයින්ද බෞද්ධ විහාර ආරාම සඝ සසුන මෙන්ම බෞද්ධ ශිෂ්ටාචාරයේ සියලු අංගයෝද ආරක්ෂාවිය යුතුය. පෝෂණය විය යුතුය. අප කෙරෙහි අනුකම්පාවෙන් ජම්බුද්වීපයේ සිට වැඩම කළ මිහිඳු මහරහතන් වහන්සේ විසින් අප වෙත දායාද කළ සම්බුදු දහම ලෝකයේ ආලෝකයයි. විමුක්තියේ ඒකායන මාර්ගයයි. දුකින් මිදීමේ විද්‍යාත්මක ක්‍රමවේදයයි. එලොව මෙලොව යහපත උදාකරවන උතුම් ජීවන දර්ශනයයි.

මේ අඹ ගස, අන් අඹ ගස්ද අඹ නොවන ගස්ද අතර ඇති එකම අඹ ගස වනවා මෙන්ම මේ දහම අන්‍ය දහම් අතර ඇති ආගමික සහනශීලතාවෙන් පොහොසත් විශ්වීය දහමක් වන බව මේ පොසොන් සමයේ අපි ඉතා බැතිබරව සිහිපත් කරමු.

නිමල් කරුණාරත්න ආරච්චි

# පොසොන් පොහෝදා

## දහම් සිතුවිලි බිඳක්...



දඹදිව රජකල ධර්මාශෝක අධිරාජයාගේ ධර්මදූත සේවාවේ විශිෂ්ඨ ප්‍රතිඵලයක් ලෙස මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන ධර්ම දූත කණ්ඩායමක් පොසොන් පොහෝ දින ලංකාද්වීපයට පැමිණියහ. උන්වහන්සේගේ ශාසනික සේවය ව්‍යාප්ත කිරීමට එවකට මෙරට රාජ්‍ය කළ දෙවන පෑතිස් රජතුමා කටයුතු කළේය.

ශ්‍රී ලංකාද්වීපය නව සංස්කෘතියක් කරා ගෙන යෑමට මිහිඳු මහ රහතන් වහන්සේ මෙන්ම දෙවන පෑතිස් රජතුමාද මහත් උත්සාහයකින් ක්‍රියාකර ඇති බව ශාසන ඉතිහාසගත තොරතුරු වලින් පැහැදිළි වෙයි. පංචශිල ප්‍රතිපත්තියක් මත ගොඩනැගුණු ලාංකික ජනතාව දුෂ්චරියන්ගෙන් වෙන්වී සුචරිතයට අනුව තම ජීවිතය ගතකරන්නට පුරුදු වූහ. එනිසාම හෙළ "බෞද්ධයා නැළවුනේ බොදු සංස්කෘතිය නැමැති තොටිල්ලේය" යන ප්‍රකාශනය ද ඇතිවිය. ඉහත සඳහන් අදහස ද තහවුරු කරයි.

මහින්දාගමනයත් සමඟ එදා ආරම්භ වූ නව සංස්කෘතික ප්‍රබෝධය ලාංකික බෞද්ධ ජනතාවගේ අභිවෘද්ධියට හේතුවූ බව සත්‍ය කරුණකි. විදේශීය සතුරු බලවේග මෙරට ආක්‍රමණය කල අවස්ථාවලදී ඒවා මැඩලීමටත් ඉවහල්වූයේ එදා රාජකීයන් අතරත් මහ ජනතාවත් අතර පැවැති බෞද්ධ සංස්කෘති බැඳීම්ය. ඔවුනොවුන් අතර පැවැති මෙම බැඳීම ඉතා වැදගත් එකක් විය.

පන්සල මූලිකව ගොඩනැගුණු ආර්ථික හා සාමාජික බැදීම අතිශයින්ම ප්‍රබල එකක් විය."වැවයි දාගැබයි" යන උදාර සංකල්පය ජනයාගේ හදවත් තුල මුල්බැස ගෙන තිබුණි. වැවෙන් සංකේතවත් වූයේ මෙරට ආර්ථික රටාවයි. කෘෂිකර්මාන්තය පදනම් කරගත් ආර්ථික ක්‍රමවේදයක් මෙරට ජනයා අතර ක්‍රියාත්මකව පැවතුනි. දාගැබෙන් සංකේතවත් වූයේ බෞද්ධ ආගමික සහජීවනයයි. මනුෂ්‍ය ජීවිත අර්ථවත් කරන සාර්ථකත්වයට පත්කරවන මූලික ගුණාංගයන් මෙමඟින් නිරූපණය විය.

බටහිර ඉංග්‍රීසි ජාතිකයින් මෙරට ආක්‍රමණය කළ අවස්ථාවේ ඔවුන් ප්‍රකාශ කර සිටියේ මෙරට ජනයා පන්සල සමඟ සම්බන්ධතාවය පවතින තාක්කල් ඔවුන් යටපත් කල නොහැකි බවයි. එයින් ලබාදෙන වැදගත් අදහස වූයේ මෙරට ලාංකික බෞද්ධ ජනතාව භික්ෂූන් වහන්සේලාගේ අවවාද අනුශාසනාවන්ට අනුව තම කටයුතු සිදුකරන බවයි. කෙනෙකුගේ උපතේ සිට ජීවිතය අවසානය දක්වා කාර්යයන්හිදී පන්සල මුල්කරගෙන කටයුතු කර ඇති බවයි.

මේ තත්වය නැති කිරීමට කල්පනා කල දුෂ්ට විජාතිකයින් ජනතාව ගමේ පන්සල සමඟ පැවැති බැඳීම් ඉවත් කිරීමට ක්‍රියා කලහ. එහි ප්‍රතිඵලය වූයේ ජනතාව දේශපාලනික ආර්ථික හා සාමාජික වශයෙන් භේද භින්න වීමය. මෙම බෙදීම් මෙරට ජනතාව ගේ සංස්කෘතික පරිහානියට තදින්ම බලපෑ සාධකයක් බවට පත්විය. බලය තහවුරු කරගැනීම සඳහා තම ගුණධර්මයන් අමතක කරන්නට ඔවුන්ට පුළුවන් විය. කරුණාව, දයාව, ඉවසීම, කෙළෙහි ගුණ සැලකීම, පරිත්‍යාගශීලී බව, අසරණයන්ට උපකාර කිරීම, ගිලන් උවටැන වැනි උත්තරීතර ගුණයන් ලාංකික සමාජයෙන් ඈත්වන්නට විය. ඒවා තම ජීවිතයෙන් ඈත් කිරීමට තරම් ජනයා සූදානම් වූහ.

මෙහි ප්‍රතිඵලය වූයේ ගුණධර්ම වලින් පිරිහුණු සමාජයක් බිහිවීමයි. භික්ෂූන් වහන්සේලා දෙමව්පියන්, ගුරුවරුන්, වැඩිහිටි, උගත් පුද්ගලයන් හඳුනාගැනීමට එම උතුමන්ට ගරුකිරීමට සමාජය බොහෝ දෙනෙකු අසමත් වීමය. මෙමගින් ලාංකික සමාජයට ඇතිවූ හානිය අතිවිශාලය.

මේ තත්වයෙන් ලාංකික ජනතාව බේරා ගැනීමට භික්ෂූන් වහන්සේලා ප්‍රධාන පූජක නායකයින්ද දේශපාලන නායකයින්ද පොදු ජන සංවිධාන ද වරින් වර ක්‍රියාත්මක වී තිබීම අගය කළ යුත්තකි. එහෙත් ඒවා ස්ථිරතාවයට යලි පත්නොවීම කණගාටුදායකය. මේ ගැන එක් පිරිසකට හෝ කණ්ඩායමකට දොස් කිව නොහැකිය. එහි වගකීම සියළුම ලාංකික ජනතාව වෙත පැවරේ.

සමාජයේ දැහැමිබව ඇති කිරීමට ඉවහල්වන සුචරිතයන්හි නිරතුරුවම යෙදීම මගින් ජනතාව තුළ ඇතිවන ආධ්‍යාත්මික හා බාහිර පිරිහීම වලක්වා ගතහැකිය.

එහි සමාජගත පිරිහීම අවම කරගැනීමට හැකිවේ යැයි සිතේ. ගුණධර්මයන් ජන සමාජයෙන් ඈත්කරන ප්‍රබල සාධකයක් වන්නේ "මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමය." "මතින් තොර සමාජයන්" යන ප්‍රකාශනය වඩාත් අර්ථවත් කළ යුතුය. මත්ද්‍රව්‍ය භාවිතාව නිසා ප්‍රකෘති මනස විකෘති වී සිදුකරන අපරාධ වැඩි වෙන බවක් පෙන්නුම් කෙරේ. මේ තත්වය මර්ධනය කිරීමට විවිධ ජන සංවිධාන මෙන්ම රාජ්‍ය නායකයින්ද ගන්නා කාලීන උත්සාහය අගය කල යුතුය. එම උත්සාහයේ ප්‍රතිඵල ලබාගැනීමට නම්, ආගමික සංවිධාන මාර්ගයෙන් පාසල් අවධියේ සිට දරුවන්ට නිසි අවබෝධයක් ලබාදිය යුතුය.

සමාජය තුළ සුචරිතය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ යුතුව ඇත. මේ සඳහා ඉතා උතුම් දිනයන් (පොහෝ දින) යොදාගෙන ක්‍රියාකිරීම මිහිඳු මහරහතන් වහන්සේට කරනු ලබන ගෞරවය ද වනු ඇත.

ඇම්. ඩී. විජයවර්ධන

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

## අදත් පොසොන් දා...

සිසිල් සුළං හමා ඇදෙන මිහින්තලාවේ
නිල්වන් තුරු පත් අතරින් සුවඳ ගෙනාවේ
තිස්ස රජුගෙ දුණු හී බිම වැටුණු වෙලාවේ
සාදු සාදු හඬ ඇසුණා දහම් ගුලාවේ

පොසොන් සඳේ සිසිල් ගලා සුව සැදුනාවේ
අරලිය මල් සුවඳ දිගේ සිත ඇදුනාවේ
අනුබදු හිමි දෙසූ ඒ සුළු ඇත් උපමාවේ
අදත් පොසොන් දා මුළු ලොවටම ඇසුනාවේ

එම්. සිරිධම්මචාරී මෙහෙණින් වහන්සේ - පොල්පිතිගම

## මිහිඳු සමිඳු වැඩිය දිනේ



පොසොන් සඳ උදාවුනේ
අවිදු අඳුර දුරු වුනේ
මුළු දෙරණම පහන් වුනේ
මිහිදු සමිඳු වැඩිය දිනේ ...//

දහම් අමා හඬ ඇසුනේ
අවි ආයුධ බිම දැමුනේ
ලක් මව සුවපත් කෙරුණේ
මිහිදු සමිඳු වැඩිය දිනේ...//

මිස්සකයෙන් රැස් දිලුනේ
වන සතුනගෙ දිවි රැකුණේ
තුන් රුවනට දිවි පිදුනේ
මිහිදු සමිඳු වැඩිය දිනේ...//

අහස උසට සෑ බැඳුනේ
ගල්මත බුදු ගුණ රැඳුනේ
කහවත ලක්බිම දිලුනේ
මිහිදු සමිඳු වැඩිය දිනේ...//

මෙත් කරුණා ගුණ වැඩුණේ
සාමය සමඟිය දිලුනේ
තුන්දොර සංවර කෙරුණේ
මිහිදු සමිඳු වැඩිය දිනේ...//

අපෙ ලක් මව නිති රැකුණේ
බලයෙන්මයි තුන් රුවනේ
ඒ සැම දෙය ලැබ දුන්නේ
මිහිදු සමිඳු වැඩිය දිනේ...//

ගලගෙදර රතනවංශ හිමි

## දෙවන පෑතිස්ස රජතුමා හා බුදුදහම සම්ප්‍රාප්තිය

සුරපුර පිවිසි යෙන්
මුටසිව මහ රදා නන්
පුත් තිස් කුමරු වන්
ලබා ගති රජ පද ඇවෑ මෙන්

දහයක් පුතු කෙරෙන් මුට සිව රජුගෙ අගේ
කණිටුය තිස්ස ගුණ දහමින් මුලට නැගේ
දෙවියන් විසින් ලැබූ පිය බව ලෙසින් සගේ
දේවානම් පියතිස්ස යවී නිසගේ

ලක්වැසි කෙරෙන් ආගම දහමක් නොවිනී
ගස් ගල් පුදා ජීවිත සම්පත පැතිනී
පව් පින් පරලොවක් හරි දැනුමක් නොවිනී
නිදහස් විනෝදය ලෙස දඩ කෙළි කෙළිනී

මිහින්තලා වන පියසට පිස තිස්ස
පොසොන් පෝ දිනක මුව දඩයමෙ පිවිස
දුනුදිය දෙවා දිව යත මුව පසු පස්ස
අහඹු ලෙසින් කණ හිනි තිස්සය තිස්ස

නමින් තමන් අමතන සපනා කව්ද
සැනින් නුවන් දිවගති පිරිසිඳින ලෙද
වතින් කසා බබලන කඳු මුදුනෙ වැද
පිනින් පිරුණ පිරිසකි පහදනා හද

මහ රජ අතේ රැඳී
දුනු හී සැනින් බිම වැදී
පිරිසට ළංව සෙදී
පුවත් විමසා බැතින් පා වැඳී

සව්වො අපි මුණි වර
අමා දම් දෙන පැන සර
මා මිහිඳු මහ තෙර
ආමු දඹදිව් තලෙන් පුවතර

මිහිඳු හිමි බසසා
පෑතිස් වෙමින් සතොසා
අඹ මුලෙක සකසා
පැනවී ආසන වඩින පිණිසා

මහ රජ නැණ පතර
විමසව මිහිඳු මහ තෙර
අඹ රුක උවම් කර
ඇසූ පැන ලැබ සිතැඟි පිළිතුර

ඩිංගිරි අම්මා රත්නායක

## අනුබුදු ගුණ සිසිල



පෙර'ඹර දිලි පුන්සඳ සේ දෙරන එකලු කළ
සුර ගඟ පිපි සියුමක් මෙන් අඹතල මත දුල
පුර මින් සිටි දැයකට පින් පාරමිතා බල
කර කරුණා මෙත් පතුරා දැල්වී නැණ සිල

පහන් පුදා මුණිදු වඳින මේ දෑතේ පින
සහන් එළිය හිතට දැනෙන අනුබුදු හිමි ගුණ
දැහැන් ගතව මා හදවත යා යුතු බව දැන
පහන් සිතින් නිතින් නිවෙමි සමිඳුනි දින

සරා සසර නිමා නොැන කළ පින් බලය
පරාජිතව වැලපෙන්නට නොමඳුන් එලය
දරා උතුම් සිතුම් පැතුම් ඉපදුණු හෙළය
විරාජිතයි මිහිඳු සමිඳ ඔබ ගුරු කුලය

නිතර ඇසෙන බැතිබර වූ දැයේ සාදු නද
උතුර උතුර හද පතුලෙන් ගලන දහම් කඳ
අතර නොවන සිතුවිලි මල් සුසිල් සුවඳ පොද
වැතිර වඳිමි අනුබුදු ගුණ සිසිලස විඳ

එදා විදාගෙන දුනු හී පර පණ නසන
සදා හරිත වන අරණට නිරිඳෙකු දුවන
මුදාගත් බැවින් පාපය දුරුකර දෙරණ
උදාවුණා පොසොන් සඳේ සදහම් පහන

ශාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු

## මිහිදු තෙරුන් වඳිනෙමි සිඹ පා කමල...

දඹදිව් තලෙහි සිට මෙහි වැඩි මිහිදු තෙරුන්
සම්බුදු දහම ගෙන වැඩියේ කුළුණු සිතින්
මිස්සක පව්ව වෙත වැඩියේ සපිරි වරින්
තිස්ස නිරිඳු දුටුවේ එය මේ ලෙසකින්

තිස්ස තිස්ස යන නම ඇසූ රජ උතුමාණන්
බැලුවේ කවරෙක්ද යන බව විමසිල්ලෙන්
දුටුවේ පව්ව උඩ වැඩ සිටි මිහිදු තෙරුන්
දුන්න පසෙකලා වැඳ වැටුණේ මෙලෙසින්

නවතිනු තිස්ස යන සුමිහිරි වදන් අසා
ඇති කලෙ රජුගෙ හදවත තුල නැතිව දොසා
කවරෙක් මෙහි ඇද්ද යන බව ඇසුව නිසා
පෙනී සිටියෙ අනුබුදු හිමි අඳුර නසා

සදහම් එළිය විහිදා ලක් දෙරණ තුල
ඇති කලෙ පිරිස තෙරුවන් ගුණ සයුර තුල
පහදා දහම් බලයෙන් හදවත් පුබුදු කල
මිහිදු තෙරුන් වඳිනෙමි සිඹ පා කමල

අජන්තා ශිරෝමණී දිසානායක



# තථාගත බල සහ චතු විශාරද ඥාණ

ලිච්චවී රාජ පුත්‍ර සුනක්ඛත්ත භික්‍ෂුව, දිබ්බ සෝතය සඳහා බුදුන් වහන්සේගෙන් කමටහන් ඉල්ලා සිටියත්, උන්වහන්සේ ඊට පින් නොමැති නිසා කමටහන් නොදුන් සේක. පසුව සුනක්ඛත්ත භික්‍ෂුව භාග්‍යවතුන් වහන්සේ සමඟ උරණ වී සිවුරු හැර ගිහිබවට පත්විය. ඉන්පසුව තථාගතයන් වහන්සේට දෝෂාරෝපණය කරමින් හැසිරෙන සුනක්ඛත්ත දැක සාරිපුත්ත මහරහතන් වහන්සේ සර්වඥයන් වහන්සේට මේ බව සැල කළේය. ඒ අවස්ථාවේ දී තථාගතයන් වහන්සේ සුනක්ඛත්ත මෝඩයෙකු බව ප්‍රකාශ කරමින් මහා සිංහනාද සූත්‍රය (බු.ජ.ම.නි - 1, පි.අං.164) දේශනා කළ සේක. එහි දැක්වෙන තථාගත බල සහ විශාරද ඥාණ හතර මෙයින් විස්තර කෙරේ.

තථාගත බල

දස බෝ පතිමාති සාරිපුත්ත තථාගතස්ස ගථාගතබලානි යෙහි බලෙහි සමන්නාගතෝ තථාගතෝ ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

භාග්‍යවතුන් වහන්සේ, පොළොව මත නොසැලී සිටිනා ගවයින්ට ප්‍රධානී වූ නිසභ ගවයා මෙන් සියලු දෙව්මිනිසුන්, මරුන්, බඹුන්, ශ්‍රමණ බ්‍රාහ්මණයන් යට කරගෙන ශ්‍රේෂ්ඨ ස්ථානයට පැමිණ සිංහනාද කරන සේක. ධර්මය දේශනා කරන සේක. එසේ පිරිස යටකරගෙන සිටින තථාගතයන් වහන්සේගේ තථාගත බල දහයකි.

01. ඉධ සාරිපුත්ත, තථාගතෝ ඨානඤ්ච ඨානතෝ අට්ඨානඤ්ච අට්ඨානතෝ යථාභූතං පජානාති - ශාරිපුත්‍රය, සිදුවන කාරණා සිදුවීමත් සිදු නොවන කාරණා සිදුනොවීමත් තථාගතයන් තතු සේ දනී.

මෙම භවයේදී මව මැරීම, පියා මැරීම යනාදී ආනන්තරිය පාපකර්මයන් සහ ආර්ය උපවාද කර ඇති අයෙකුට මෙම භවයේදී මාර්ගඵල ලැබිය නොහැකි බව බුදුන් වහන්සේ දැනගෙනම දේශනා කරයි. එය සිදු නොවන කාරණයකි. අජාසත්ත රජතුමාට සාමඤ්ඤඵල සූත්‍රය අවසානයේ සෝවාන් වීමට නොහැකි වූයේ පියතුමා මැරූ ආනන්තරිය පාපකර්මය නිසාය. එමෙන්ම සතර සතිපට්ඨානය නිසි ලෙස උපරිම වසර හතක් වඩනවා නම් ඒ අය අනාගාමී හෝ අරහත්වයට පත්වන බව දැනගෙනම දේශනා කරයි. මෙය සිදුවන කාරණයකි. බුදු කෙනෙකුන් කියූ දෙයක් කිසිවෙකුට වෙනස් කළ නොහැක. එය ඒ ආකාරයෙන්ම ඉටුවේ.

02. පුන ච පරං සාරිපුත්ත, තථාගතෝ අතීත අනාගත පච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසෝ හේතුසෝ විපාකං යථාභූතං පජානාති - ශාරිපුත්‍රය, අතීත අනාගත වර්තමාන කර්ම සමාදානයන්ගේ විපාක ප්‍රත්‍ය වශයෙන් හේතු වශයෙන් තථාගතයන් නිවැරදිව ම දනී.

ඕනෑම සත්වයෙකුගේ අතීත හෝ වර්තමාන කුසල හෝ අකුසල විපාක පෙර සිදුකල අසවල් කර්මය/කර්මයන් නිසා සිදු වූ බවත්, වර්තමානයේ සිදුකරන කුසල/අකුසල කර්මයේ විපාකය අනාගතයේදී මෙසේ ලැබෙන බවත්, සර්වඥයන් වහන්සේ දැනගෙනම දේශනා කරයි. ඛුජ්ජුත්තරා දාසියක් වූයේ පෙර කාශ්‍යප බුදුන් කල හිතවත් රහත් සාමනේර තෙරණියකගෙන් දුර තිබූ රන් මල්ලක් අරන් දෙන්න කියා වැඩගත් නිසාය. එමෙන්ම ඛුජ්ජුත්තරා කුදුවූයේ පෙර කුදු පසේ බුදු කෙනෙකු මෙසේ ගමන් කලා යැයි කුදු ලෙස රඟපා පෙන්වූ නිසාය. දෙව්දත් තෙර සිදුකළ ආනන්තරිය පාපකර්මවල විපාක අවසන් වී පිරූ පාරමිතා ශක්තිය ඉස්මතු වී අනාගතයේ පසේ බුදුවරයෙකු බවට පත්වන බව බුදුන් වහන්සේ දැකගෙන ම දේශනා කළ සේක.

03. පුන ච පරං සාරිපුත්ත, තථාගතෝ සබ්බත්ථගාමිනීං පටිපදං යථාභූතං පජානාති - ශාරිපුත්‍රය, ඕනෑම අයෙකුට ඕනෑම තැනක යන්න අවශ්‍ය සියලු ම ප්‍රතිපදාවන් තථාගතයන් වහන්සේ නිවැරදිවම දනී.

අනාගතයේදී තමන් මෙසේ විය යුතුයි. ඊට කුමක් කළ යුතුද? යන්න සර්වඥයන් වහන්සේගෙන් විමසූ විට නිවැරදි ම ඒකායන පිළිවෙත දේශනා කරයි. සක්විති රාජ සම්පත්තිය අවශ්‍ය නම් ඊට අදාල ප්‍රතිපත්තිය දේශනා කරයි. දෙව්ලොව යන්නට නම් සිල් රැකිය යුතු බව දේශනා කරයි. භෝග සම්පත් අවශ්‍ය නම් දන් දෙන ලෙස ප්‍රකාශ කරයි. මාර්ගඵල අවශ්‍ය නම් චතුරාර්ය සත්‍ය දේශනා කරයි. දුස්සීල, මිත්‍යා දෘෂ්ටික පටිපදාවෙන් දුගතිගාමී වන බව දේශනා කරයි.

04. පුන ච පරං සාරිපුත්ත,අනේක ධාතුනානා ධාතු ලෝකං යථාභූතං පජානාති - ශාරිපුත්‍රය, ලෝකයේ ඇති විවිධ ධාතුන් සියල්ල නිවැරදිව සර්වඥයන් වහන්සේ දනී.

මනුෂ්‍ය ලෝකය, සතර අපාය, දිව්‍ය ලෝක හය, බ්‍රහ්ම ලෝක විස්ස සහිත තිස්එක් තලයක් සහිත සක්වල ලෝක ධාතුව, එවැනි සක්වල ලෝක ධාතු දහසක් ඇති චූලනිකා ලෝක ධාතුව, සක්වල ලෝක ධාතු දස ලක්‍ෂයක් ඇති මජ්ඣිමා ලෝක ධාතුව, සක්වල ලෝක ධාතු කෝටි ලක්‍ෂයක් ඇති මහා සහස්සී ලෝක ධාතුව සහ ඊටත් එහා ගිය අප්‍රමාණ ලෝක ධාතු භාග්‍යවතුන් වහන්සේ දනී. එමෙන්ම පඨවි ධාතු, ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතු, ආකාස ධාතුව පිළිබඳවත් චක්ඛු ධාතු, සෝත ධාතු, ඝාණ ධාතු, ජිව්හා ධාතු, කාය ධාතු, මනෝ ධාතු, රූප ධාතු, ශබ්ද ධාතු, ගන්ධ ධාතු,ථ රස ධාතු, ඵොට්ඨබ්බ ධාතු, ධම්ම ධාතු, චක්ඛු විඤ්ඤාණ ධාතු, සෝත විඤ්ඤාණ ධාතු, ඝාණ විඤ්ඤාණ ධාතු, ජිව්හා විඤ්ඤාණ ධාතු, කාය විඤ්ඤාණ ධාතු, මනෝ විඤ්ඤාණ ධාතු පිළිබඳවත් නිවැරදිව භාග්‍යවතුන් වහන්සේ දනී.

05. පුන ච පරං සාරිපුත්ත, තථාගතෝ සත්තානං නානාධිමුත්තිකථං යථාභූතං පජානාති - ශාරිපුත්‍රය, සත්වයන්ගේ සිත යට ඇති හැකියාවන් සහ නොහැකියාවන් මනාව භාග්‍යවතුන් වහන්සේ දනී.

චුල්ල පන්ථක හිමිගේ රහත්වීමට ඇති හැකියාව භාග්‍යවතුන් වහන්සේම දැනගෙන කමටහන් ලබාදුන් සේක. නමුත් දිබ්බසෝත ඥාණය ඇතිකරගැනීමට පින් නොමැති හෙයින් සුනක්ඛත්ත භික්‍ෂුවට ඊට මගපෙන්වීම් නොකරන ලදී.

06. පුන ච පරං සාරිපුත්ත, තථාගතෝ පර සත්තානං පර පුග්ගලානං ඉන්ද්‍රිය පරෝපරියත්තං යථාභූතං පජානාති - ශාරිපුත්‍රය, නිවනට නායකත්වය ලබාදෙන සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා යන ඉන්ද්‍රිය ධර්ම පහ සෑම අයකුගේ ම කෙසේ සකස් වෙලා පවතිනවා ද යන්න නිවැරදිවම සර්වඥයන් වහන්සේ දන්නා සේක.

එබැවින් භාග්‍යවතුන් වහන්සේ ධර්මය අසන සෑම කෙනෙකුටම දැනෙන්නේ තමන්ටම ධර්ම දේශනා වන ලෙසය. බුදුන් වහන්සේ මාර්ගඵල අවබෝධයට අවශ්‍ය නිවැරදිම කමටහන නිවැරදිම වෙලාවට ලබාදෙන්නේ උන්වහන්සේට පමණක් ඇති ඉන්ද්‍රිය පරෝ පරියත්ත ඥාණය තුලිනි. බාහිර දාරුචීරියට නිවැරදි ම වෙලාවෙ නිවැරදි ම කමටහන ලබාදීම මීට උදාහරණයකි.

07. පුන ච පරං සාරිපුත්ත, තථාගතෝ ඣානවිමෝක්ඛ සමාපත්තීනං සඞකිලේසං වෝදානං වුට්ඨානං යථාභූතං පජානාති ශාරිපුත්‍රය, භාග්‍යවතුන් වහන්සේ සියලු ධ්‍යාන, විමෝක්‍ෂ, සමාධි, සමාපත්තීන් ගේ පිරිහීම, පිරිසිදුවීම සහ ඒවා ඇතිකරගෙන ඉන් නැගිටීම මනාව දනී.

රූපාවචර සහ අරූපාවචර ධ්‍යානයන්, අෂ්ට විමෝක්‍ෂයන්, ඛනික උපචාර අර්පනා යනාදි සියලු සමාධීන් සහ සියලු සමාපත්තීන් ඇතිකරගැනීම, පැවැත්වීම, ඒවා පිරිහීම සහ ඒවායින් ඉවත්වීම මනා සේ දන්නේ සර්වඥයන් වහන්සේය. භාග්‍යවතුන් වහන්සේ සමාපත්තීන් කෝටි ලක්‍ෂ විසිහතරකට සමවදින බව ධර්මයේ සඳහන් වේ.

08. පුන ච පරං සාරිපුත්ත, තථාගතෝ අනේකවිහිතං පුබ්බේනිවාසං අනුස්සරති - ශාරිපුත්‍රය සීමාවක් නොමැතිව තමන්ගේත් අන් සත්වයන්ගේත් පෙර භවයන් සිහිකිරීමේ හැකියාවක් තථාගතයන් වහන්සේට ඇත.

අනන්ත සංසාරයේ සියලුම සත්වයන්ගේත් බෝසතාණන් වහන්සේගේත් පූර්ව නිවාස අප්‍රමාණව සිහි කිරීමේ හැකියාව සර්වඥයන් වහන්සේට ඇත. අසවල් භවයේ අසවල් ස්ථානයේ අසවල් නම් ගෝත්‍ර සහිතව ඉපදුනා. ඉන්පසු එයින් චුතව අසවල් තැන ඉපදුනා ලෙසට, සීමාවක් නොමැතිව පෙර භවයන් සිහි කර ප්‍රකාශ කිරීමේ හැකියාව බුදුරජාණන් වහන්සේ සතුව පවති.

09. පුන ච පරං සාරිපුත්ත, තථාගතෝ දිබ්බේන චක්ඛුනා විසුද් ධේන අතික්කන්ත මානුසකේන සත්තේ පස්සති - ශාරිපුත්‍රය, මිනිස් ඇස ඉක්මවා දිව්‍ය ඇසින් සත්වයන් මැරෙන ඉපදෙන අයුරුත්, පාප සහ පුණ්‍ය කර්මයන් අනුව සුගති දුගතිගාමී වන අයුරුත්, අප්‍රමාණව දැකීමේ හැකියාව භාග්‍යවතුන් වහන්සේට ඇත.

සිතා ගැනීමට නොහැකි තරම් වූ දිබ්බ චක්ඛු ඥාණය භාග්‍යවතුන් වහන්සේට ඇත. සිව්මංසලක ඇති මහල් නිවසක ඉහල මාලයේ සිට පහල බලන විට ගෙට එන අය ගෙයින් යන අය පැහැදිළිව දර්ශනය වන්නාසේ භාග්‍යවතුන් වහන්සේට සියලු සක්වලේම සියලු සත්වයන්ගේ චුති උප්පත්තීන් දැකිය හැකිය.

10. පුන ච පරං සාරිපුත්ත, තථාගතෝ ආසවානං ඛයා අනාසවං චේතෝවිමුක්තිං පඤ්ඤාවිමුක්තිං දිට්ඨේව ධම්මේ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති - ශාරිපුත්‍රය, සියලු ආස්‍රවයන් ක්‍ෂය කිරීමෙන් මෙම ආත්මයේම චේතෝ විමුක්තියත්, පඤ්ඤා විමුක්තියත් ප්‍රත්‍යක්‍ෂ කොට දැන ඊට පැමිණ තථාගතයන් වහන්සේ වාසය කරයි.

සර්වඥයන් වහන්සේ රාග දුරුකිරීමෙන් වන චේතෝ විමුක්තියත් අවිද්‍යාව දුරුකිරීමෙන් වන පඤ්ඤා විමුක්තියත් සාක්‍ෂාත් කරගෙන අනාස්‍රව චිත්තයකින් වාසය කරයි.

**විසාරද ඥාණ**

1.තමන් වහන්සේ සම්මා සම්බුද්ධයි, සියල්ල අවබෝධ කරගෙන සර්වඥයි කියා ප්‍රකාශ කළ විට මේ කොටස අවබෝධ නොකලා කියා චෝදනා කරන්නට කිසිම ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ දෙවියෙකු හෝ මාරයෙකු හෝ බ්‍රහ්මයෙකු හෝ සියලු සක්වලෙහි කිසිවෙකු නොමැත.

2. තමන් වහන්සේ ක්ෂීණාස්‍රවයි ලෙස පැවසූ විට මෙම ක්ලේෂය ඇතැයි කියා චෝදනා කරන්නට කිසිම ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ දෙවියෙකු හෝ මාරයෙකු හෝ බ්‍රහ්මයෙකු හෝ සියලු සක්වලෙහි කිසිවෙකු නොමැත.

3.යමෙකුට මාර්ගඵල ලබන්නට අන්තරාවකර ධර්මයන් තථාගතයන් වහන්සේ දේශනා කර ඇත. ඒවා සේවනය කිරීමෙන් මාර්ගඵල ලැබිය හැකිය යන්න ප්‍රකාශ කිරීමට කිසිම ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ දෙවියෙකු හෝ මාරයෙකු හෝ බ්‍රහ්මයෙකු හෝ සියලු සක්වලෙහි කිසිවෙකු නොමැත.

4. සසර දුක නැතිකරගන්න අවශ්‍ය පටිපදාව භාග්‍යවතුන් වහන්සේ දේශනා කර ඇත. එය පිළිපදින අයෙකුට සසර දුක නැතිකරගැනීමට නොහැකියි කියා ප්‍රකාශ කරන්නට කිසිම ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ දෙවියෙකු හෝ මාරයෙකු හෝ බ්‍රහමයෙකු හෝ සියලු සක්වලෙහි කිසිවෙකු නොමැත.

පූජ්‍ය මැල්සිරිපුර ධම්මකුසල හිමි

# තෙරුවන් ගුණයට පිවිස සසර බිය දුරු කර ගනිමු



සම්බුදු පියාණෝ සාරා සකි කලක් සම තිංසත් පාරමී දම් සපුරා සම්මා සම්බුදු පදවි ලැබුවේ සත්වයා සසර කතරින් මුදාලනු පිණිසමය. පන්සාලිස් වසක් පුරා ගම් දනව් සිසාරා තුරිත, අතුරිත වශයෙන් වැඩමවා වදාලේද සතට සෙතට පිණිසමය. සත්වයාගේ මෙලොව දුකට, සැපට යම් පිහිටක් වුයේ නම් ඒ ඔවුන්ගේ ආරාධනා පරිදිය. විශාලා මහනුවර තුන්බියට පිහිට වීම එබඳු අවස්ථාවකි.

විශාලා මහනුවර යනු ලිච්ඡවී රාජධානියයි. තථාගතයන් වහන්සේ වදාල අපරිහාණිය ධර්ම හත මැනවින් ම පිළිපැද්දෝ ලිච්ඡවීහූය. ඔවුන්ගේ රාජධානිය දිව්‍ය පුරයක් බඳුවිය. ලිච්ඡවී පරපුරේ මිනිසුන් දෙවියන් දෙවගනන් බදුවිය. නුවර වටා මන නන්දනීය ප්‍රාකාරයකි. ප්‍රාකාරය ඇතුලින් නුවර වට කරන ලද්දේ ඕලු, නෙලුම්, මානෙල් ඈ පස්පියුමෙන් සුසැදි මනරම් පොකුණය. දෙව් ලොව ගැන අසා ඇති කෙනෙකුට මෙම රාජධානිය දැක්මෙන් දෙව්ලොව දෝයි සැක සිතෙන තරම්ම මනරම්ය. අපරිහානිය ධර්ම පිළිපැදිමෙන් කිසිදු ශක්ති සම්පන්න රජෙකුටවත් පරාජය කළ නොහැකිවු අපරාජිත රාජ්‍යයකි.

එහෙත් කළකම් පලදේමය. පූර්ව කර්ම විපාක කාලයක් මෙනුවරට උදාවිය. වර්ෂාව නැතිවිය. ශෂ්‍ය සම්පත් ඌණ විය. ආහාර හිගවිමෙන් මිනසුන් මිය ගියෝය. මියගියවුන් වියළුන දිය අගලට (පොකුණට) ඇද දැමීය. මිනි කුණු ගදින් අමනුශ්‍යයෙන් නුවරට ඇතුලු විය. අමනුශ්‍ය උවදුර හේතුවෙන් අහිවාහක නම් රෝගයක් ඇතිවිය. මේ හේතුවෙන් මැරෙන සංඛ්‍යාව සීග්‍රවිය.

දැන් විශාලා මහනුවර වාසින් දුර්භික්‍ෂ ,රෝග අමුනුෂ්‍ය යන තුන්බියෙන් වෙලී ඇති බව අවම රාජ්‍යයන්ටද මෙය සැලවිය. තෙරුවන් කෙරෙහි අචල විශ්වාසයෙන් හා ශ්‍රද්ධාවෙන් යුතු බිම්බිසාර මහා රජතුමාගේ මඟ පෙන්වීම මත ලිච්ජවී රජවරු දෙපලක් බුදුරජාණන් වහන්සේ වෙත එළඹ තමන්ට ඇතිව ඇති උවදුර දක්වා රටවාසින්ට සෙත් පිණිය වැඩමවන ලෙස ආරාධනා කළහ.

බුද්ධඥනයෙන් බල වදාල සම්බුදු පියාණෝ මෙලෝතුන් බිය පමණක් නොව සසර බිය දුරුකර ගැනිම පිණිස තෙරුවන් අනන්ත ගුණය අසා අවබෝධ කරවනු හැකි බව දැන පන්සියක් මහ සඟ පිරිවරා විශාලාවට වැඩ රුවන් සුත්‍රයේ දෙසා වදාල සේක. රුවන් සුත්‍රය ඇතුලත් තුනුරුවන් ගුණ තේජස කොපමණද යත්, සතර දෙසින්ම ගලා ආ ගණ මේඝන් හේතුවේන් මළ මිනි කඳන් පාවී නුවරින් නික්මීණ. තෙරුවන් ගුණ දෙසුම අකනිටා බඹලොව දක්වාම පැතිරිණි. දෙව් බඹුන් විශාලා නුවර අහස්කුස බබලන්ට විය. දෙව් බඹුන්ගේ සම්ප්‍රප්තියෙන් සියළු අමනුෂ්‍යයින් පලා ගියහ. සියල්ලෝ සුවපකත් විය. සුවාසූ දහසක් සත්වයෝ ධර්මාවබෝධය ලදහ.

මෙසේ මෙලොව තුන්බියද, සංසාර බියද දුරුකිරිමට සමත් රුවන් සුත්‍රයෙහිලා සඳහන් තෙරුවන් ගුණ සමුදාය දැන ගෞරවයෙන් තෙරුවන් සරණ යමු. අපි තෙරුවන් ගුණයට පිවිසෙමු. තෙරුවන හඳුනා ගනිමු. සංසාර බියද දුරු කරමු.

රතන සුත්‍රයේ සඳහන් බුදු ගුණ දෙව් ලොව, නා ලොව, මිනිස් ලොව, වටිනා රන් රුවන් මුතු මැණික් ඇත. ඒ කිසිදු රුවනක් තථාගතයන් වහන්සේගේ ගුණයට සමාන නොවේ. එබැවින් බුදුරුවනට උතුම් වන්නේය.

තවද වස්සාන සමයේ ගහ කොළ මල් එලින් බරව සෞභාග්‍යමත් වන්නේය. එසේම තථාගතයන් වහන්සේ නිවනට පැමිණවීම පිණිසම අමාමහා නිවන් සුව පිණිසම ධර්ම දේශණා කරති.එබැවින් බුද්ධ රත්නයට ශ්‍රේෂ්ඨ වන්නේය.

ද්‍යද්‍යද්‍ය උතුම් වු නිවන දක්වන්නාවූ, නිවන ලබා දෙන්නාවූ, නිවන් මඟ පෙන්වන්නා වූ, සසර පැවැත්ම නසන්නාවූ දහමක්ම දේශණා කළ බැවින් බුද්ධ රත්නයට ශ්‍රේෂ්ඨ වන්නේය.

ලෞකික ලෝකයේ වාසය කරන්නාවූ සත්වයාට වටිනාම වස්තුව වන්නේ රන්, රුවන් ය. ඒ රන් රුවන් කුමන ආකාරයක මිළ වුවද ඒවා සියල්ල වෙනස් වන විනාශ වෙන මෙන්ම සත්වයාගේ තෘෂ්ණා චෛතසික දළුලවමින් සසර දුකට පමුණුවන්නා වු බැවින් ඒ රන්, රුවන් වල වටිනාකම, අගය තාවකාලික වේ. එසේම රන්, රුවන් සොර සතුරන්ට ගත හැකිය. දියෙන් ගින්නෙන් විනාශ වේ. එසේ සිදුවිම පෘතග්ජනයාට දරා ගත නොහැකි දුකකි. ගින්නකි. ඒ ගින්න හේතුවෙන් විවිධ අකුසලයෝ සිදුකරති. එයින්ම සසර මහා දුක්ඛ දොමනස්සයන් උපදී.

බුදුරජාණන් වහන්සේ නමැති රුවන ලගා කර ගැනිමෙන් සත්වයාට සැනසිමට ලැබේ. මෙම ගාථා ත්‍රිත්වය තුළ බුදුරජාණන් වහන්සේ රුවනක් යැයි සැලකුවේ කුමන කරුණු පදනම් කරගෙන ද එය මෙසේය...

1. අමා මහ නිවනට දහම් දෙසු බැවිනි.

2. නිවන් මග පෙන්වා වදාල බැවිනි.

3. සංසාරයේ ඇවිදිම නැවැත්වීම පිණියම දම් දෙසු බැවිනි.

ඉහත දැක්වෙන මහ අනර්ඝ බුදුගුණ දෙස ප්‍රඥ ඇසින් බැලු කළ බෞද්ධයන්ට බුදුන් දකින ආකාරය වැරදිය. බොහෝ පඩිවරුන් උගත්තු බුදුගුණ දහම් බෞද්ධ දර්ශනය ලෙස පෙන්වා දෙන්නේ එදිනෙදා ජිවිත නිරවුල්ව පවත්වා ගන්නා ආකාරයටයි. ගිහි ජිවිතය සාර්ථක කර ගැනිමය. ධනය හරි හම්බ කරගන්නා ආකාරය ආදී බොහෝ දේය.

එහෙත් බුදුරජාණන් වහන්සේ මහා අනර්ඝ මානික්‍යක් වුයේ සත්වයා සතර කතරින් එතෙර කරවිම පිණිස මාර්ග පෙන්වමින් ඒ අමා මග විවර කළ බැවිනි. ඒ බුදුරදුන් පෙන්වා වදාල ප්‍රතිපදාව ඔබටම වැටහේවා. ධර්මය ලෙසින් පෙන්වා දෙන මිත්‍යාපටලයෙන් ඔබගේ දැත් අන්ධ නොවේවා රතන සුත්‍රයේ සදහන් දහම් ගුණ

1. ශාක්‍ය මුණිත්‍රයන් වහන්සේ එකඟ වු සිත් ඇතිව කෙළෙස් නැසිමට නිමිති වු රාගයෙන් වෙන් විමට අවශ්‍යවු ජාතිජරා මරණ නැති උතුම් නිවනම දෙසීය. ඒ දහම් හා සම වූ කිසිවක් නැත්තේය. එබැවින් නිවන් දහම උතුම් රුවනක්ම වන්නේය.

2. බුද්ධ ශ්‍රේෂ්ඨයන් වහන්සේ අත්‍යන්ත පරිශුද්ධ වූ යම් මාර්ග සමාධියක් වර්ණනා කළේද අනතුරුවම ඵලදෙන සමාධිය යැයි යමකට කියන ලදද ඒ උතුම් සමාධි සුවයට සම කළහැකි කිසිවක් නැත. එබැවින් ධර්ම රත්නය උතුම් රුවනක්ම වන්නේය.

3. මහා අනර්ඝ වූ අසම සම වූ දම් රුවන දෙස ප්‍රඥ ඇසින් බලන්න බුද්ධ ධර්මය වනාහි සීල, සමාධි, ප්‍රඥවම වේ. ධර්මයේ රත්න භාවයක් වෙත්නම් ඒ නව ලෝකෝත්තර ශ්‍රී සද් ධර්මයයි. එනම් ලෝකෝත්තර ශීල, විදර්ශනා සමාධි, විදර්ශනා ප්‍රඥ, සම්මා ඥන, සම්මා විමුක්ති නම් මාර්ගයේ ගමන් කොට ලබන්නා වූ සෝවාන් මාර්ගය - ඵලය, සකෘද්ධාගාමී මාර්ගය - ඵලය, අනාගාමී මාර්ග - ඵලය, අර්හත් මාර්ග - ඵලය හා නිවනම වේ.

රත්න සූත්‍රයේ සඳහන් ආර්ය සඝගුණ.:-

සත් පුරුෂ මහෝත්තමයන් විසින් ප්‍රසංසාවට ලක් වූ පුද්ගල යුගල හතරක් වේ. ඒ සෝවාන් මාගී - ඵල සකෘද්ධාගාමී මාගී - ඵල. අනාගාමී මාගී - ඵල. අර්හත් මාගී - ඵල ලැබූ ආර්ය මහා සංඝරත්නයයි. ඒ ලොව්තුරු අමා මැණියන් වහන්සේ ශ්‍රාවක වූ ආර්ය උතුම් අටදෙනා සැදැහැත්තන් දක්ෂිණාවට සුදුසු ය. එබදු උතුමන්ට දෙන ලද දානයේ ආනිසංස මහත්ඵල වෙති. එබැවින්ම ආර්ය මහා සංඝරත්නය උතුම් රුවනක්ම වන්නේය.

බුදුරජාණන් වහන්සේ පනවා වදාළ සුවිශුද්ධ කායවාග් කර්මයෙන් (ප්‍රාතිමෝක්‍ෂ සංවර ශිලයෙන්) හා නොවිසුරුනු සිතින් සියළු කෙලෙසුන්ගෙන් දුරුව රහත්ඵල සමවත විදින්නාහ. ඒ නික්ලේෂී බැවින්ම සඝරුවන උතුම් රුවනක්ම වන්නේය.

රටක ආරක්ෂාවට බැඳි පවුරෙහි ඇතුළුවන දොරටුවේ සවිකොට ඇති ඉන්ද්‍රකීලය කුමන සුළගකටවත් නොසෙල් විය හැකිය. එසේම සෝවාන් ඵලය ලැබූ බුද්ධ ශ්‍රාවකයාගේ සිත තුළ ඇති ශ්‍රද්ධා, ශිල ආදී ගුණයෝ කුමන බලපෑමකින්වත් වෙනස් නොවේ. නොසෙලවිය හැකිය. එයින්ම ආර්යයන් වහන්සේ රත්නයක්ම වන්නේය.

15 පිටුවට...

ශාස්ත්‍රවේදී වත්තේගම කුසලධම්මා මෙහෙණින් වහන්සේ



# දඹදිව සිට ශ්‍රී ලංකාද්වීපයට ලැබුණු සැදහම් අමාදහර

භාරතයේ අධිරාජ්‍යයත්වයට පත් අශෝක රජතුමා තම දික්විජය ප්‍රතිපත්ති ව්‍යාප්ත කරමින් තම බලය කාලිංග දේශය දක්වා පැතුරුවේ ය. චන්ඩාශෝක නාමය හඳුන්වනු ලැබුවේද මෙම කාංලිග යුද්ධයෙන් ජන ජීවිත දහස් ගණනක් විනාශයට පත් කිරීම හේතුකොට ගෙනය.අවසානයේ කාලංග දේශය යටත් කරගැනීමෙන් පසු සිදු වූ ජීවිත හානිය දැක රජුගේ සිත කලකිරීමට පත්විය. මෙම අවස්ථාවේ සන්සුන් ඉඳුරන් ඇතිව මහ මඟ වැඩම වූ නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ කෙරෙහි සිත පහදවාගෙන බුදු සසුනෙහි පැහැදීමක් උපදවා ගත්තේය.

එතැන් සිට දිග්විජය ප්‍රතිපත්තිය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කරන්නට සිතූ රජතුමා එවකට ශාසන භාරධාරී වූ මොග්ගලී පුත්තතිස්ස මහරහතන් වහන්සේ හමු වී බුද්ධ ශාසනයේ දියුණුවට කළ යුතු දේ ගැන අනුශාසනා ලබාගත්තේය. එතැන් සිට අශෝක අධිරාජයා ශාසනයේ චිරපැවැත්ම සඳහා ධර්ම සංඝායනාවක් පැවැත්වීමට තීරණය කර අවශ්‍ය කටයුතු සම්පාදනය කලේය. මොග්ගලීපුත්තතිස්ස මහ තෙරුන්ගේ අනුශාසනා පරිදි තෙවන ධර්ම සංඝායනාව පවත්වා රටවල් 09කට ධර්ම දූතයන් වහන්සේලා ද පිටත්කර යැවීය.

ධර්මාශෝක යන නාමය ලබාගත් අශෝක අධිරාජයා තම පුතණුවන් වූ මිහිදු මහරහතන් වහන්සේ ප්‍රධාන දූත පිරිස තම්බපණ්ණි හෙවත් වර්තමාන ශ්‍රී ලංකාද්වීපයට එවනු ලැබිය. එයට බලපෑ ප්‍රධාන හේතුව වූයේ දෙවනපෑතිස් රජු හා ධර්මාශෝක රජු අතර පැවැති නොදුටු මිතු දහම සනිටුහන් කිරීමටය. ශ්‍රී ලංකා ද්වීපයට පොසොන් පොහොය උදාවූයේද මෙම කාලයේදීය. දෙවන පෑතිස් රජතුමා ප්‍රධාන මුව දඩයමෙහි යෙදී සිටියේ මිස්සක පව්ව පර්වත ප්‍රදේශයේය. මිහිදු මහරහතන් වහන්සේ ප්‍රධාන පිරිස මිහින්තලා පව්වේදී දෙවනපෑතිස් රජතුමාට හමුවිය. මිහිදු මහරහතන් වහන්සේ ඔවුන් දැක තිස්ස...තිස්ස යනුවෙන් ඇමතීය.

තම නාමය අඩගසන්නේ කවරෙක්දැයි වටපිට බැලීය.එවිට රජතුමාට දක්නට ලැබුණේ කසාවතින් බබළන තෙරණමකි. රජතුමාට තමන් වහන්සේ කවරෙක්දැයි හඳුන්වා දුන්නේ මෙසේය.

''සමණාමයං මහාරාජ - ධමම රාජසස සාවකා

තවෙව අනුකම්පාය - ජම්බුදීපා ඉධා ගතා''

මහරජතුමනි, අප ධර්ම රාජයාණන් වහන්සේගේ ශාවක පිරිස වෙමු.ඔබලාට අනුකම්පාවෙන් දඹදිව සිට මෙහි පැමිණියෙමු. මෙම වදන්වලින් සතුටට පත් රජතුමා දුණුදිය ඉවතලා මිහිදු මහරහතන් වහන්සේ ඉදිරියේ වැඳ වැටුනේය. රජතුමා ප්‍රධාන පිරිස තෙරුවන් සරණ ගියහ.රජුගෙන් අඹ පැනයක් විමසූ මිහිදු මහරහතන් වහන්සේ පළමුව රජුගේ නුවණ පරීක්ෂාවක් සිදු කලේය. එමගින් රජතුමාගේ බුද්ධිය විමසා දැනගත් තෙරුන් වහන්සේ ධර්මදේශනාවක් පැවැත්වීමට අවශය බව රජුට අවබෝධ කරවීය.

ඒ අනුව මිහිදු මහරහතන් වහන්සේ සමග පැමිණි ඉත්තිය, උත්තිය, සම්බල, භද්ද සාල යන තෙරවරුන් ද සුමන සාමණේරයන් ද, භණ්ඩුක අනාගාමි උපාසක සමග පසුදින අනුරාධපුර නගරයට වැඩම කළහ. ධර්ම දේශනාවට සුදුසු ස්ථානයක් නොවූයෙන් ඇත්හල සකස් කළ බව ශාසන වංශ කතාවල සඳහන් වෙයි. එම ශාලාවේදී රජතුමා ප්‍රධාන පිරිසට චුල්ලහත්ථිපදෝපම සූත්‍රයෙන් දහම් දෙසූ මිහිදු මහරහතන් වහන්සේ ඉන් අනතුරුව අරිට්ඨ ඇමතියා පැවිදි කරවීය. මේ වන විට භික්ෂූන් වහන්සේලාට සුදුසු ආරාම නොවූයෙන් මිහින්තලාව අවට ස්වාභාවික ලෙන් සකස් කොට පූජාකළ බව එහි දැක්වෙන සෙල්ලිපි ලිපිවලින් පැහැදිලි වෙයි.

''අගත අනගත චතුදිය සගස දිනෙ''

මෙම සෙල්ලිපියෙන් පෙන්වා දී තිබෙන්නේ පැමිණියා වූ ද නොපැමිණියා වූ ද සතර දිශාවේ සංඝයාට පූජාකළ බවයි. මෙයින් පසුව විමානවත්ථු, පේතවත්ථු යන සූත්‍ර ධර්මයන් ඇසුරෙන් දහම් දෙසා ධර්මාවබෝධය ලබා දුන් මිහිදු මහරහතන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගේ පොහොය කිරීම් පිළිබඳ කටයුතු මෙහෙයවීය. ඒ සඳහා සීමා ගොඩනැගිලිද ඉදිකර දෙන ලෙසට රජතුමාට අනුශාසනා කලේය.වැවය,දාගැබයි යන බෞද්ධ සංකල්පය මූලික කරගෙන ලක්දිව නව බෞද්ධ සංස්කෘතියක් ආරම්භ විය. කෘෂිකර්මාන්තය පදනම් කරගත් ආර්ථික



රටාවක් ද මෙයට සම්බන්ධ විය. විවිධ මිථ්‍යා ඇදහිලිවලට යොමුව සිටි ජනතාව නිවැරදි සංස්කෘතියකට යොමුවිය. අරිට්ඨ ඇමතිගේ පැවිදිවීමෙන් ආරම්භ වූ ලක්දිව භික්ෂු සමාජය ක්‍රමක් ක්‍රමයෙන් ලංකාව පුරා ව්‍යාප්ත විය.

ස්තූප නිර්මාණයද බෝධි ගෘහ නිර්මාණයද මේ අතර සිදුවිය. රජතුමා ප්‍රධාන ජනතාව බෞද්ධ ප්‍රතිපත්තිවල පිහිටා රාජ්‍ය විචාලයේය. රාජ්‍ය අනුග්‍රහය නොමදව ලැබීම හේතුකොට ගෙන බෞද්ධ ගොඩනැගිලි වලින් සමන්විත සිද්ධස්ථාන බිහිවිය. මේ නිසාම ජනතාව දුස්චරිතයෙන් වෙන්ව සුචරිතයෙහි යෙදුණාහ.

ලක්දිව රජ වනුයේ බෝධි සත්ත්ව ගුණ ඇති අය පමණි....යන ප්‍රකාශද ඇති වූයේ මේ නිසාය. අනුරාධපුර යුගයෙන් ආරම්භ වූ බෞද්ධ ප්‍රබෝධය රාජ්‍ය යුග ගණනාවක් පුරා ව්‍යාප්ත වී ගිය බව දැනට හමුවෙන ගොඩනැගිලි වලින් පැහැදිලි වෙයි.ලක්දිව රජකළ බෞද්ධ රජවරුන් ජීවිත පරිත්‍යාගයෙන් බුදු දහම ආරක්ෂා කොට පෝෂණය කළ බව ශාසන ඉතිහාසයෙන් පැහැදිලි වෙයි.

ඇම්.ඩී.විජයවර්ධන


ථෙරී ගාථා ඇසුරෙන්
භද්‍රා කුණ්ඩලකේශී
සන්තුක.. කෙරෙහි.. සිත් ඇතිවූ.. භද්‍රා.. ඔහුව නොලද හොත්... මිය යමියි.. සිතා.. සිය.. සයනයේ වැතිරුණේය...
කුමාරී.. කුමාරී.. ඔබ බය වුනාද.. ඈ හා.. ඇයි.. මෝ.. අඬන්නේ.. ඔබට කිසියම් අසනීපයක් වත්ද..
ඉන්.. ඉනි.. නෑ..
සන්තුකව මරන්ට ගෙනියනවා දැකලා ඔබ බය වුනාද... කුමාරී..
..ඉන්න.. මම.. සිටු දේවියව.. කැඳවාගෙන එන්නම්
භද්‍රා.. ඇයි දියණිය.. මොකද.. මේ.. ඔබට.. වසාධියක්වත්ද? කියන්න... මොකද වුනේ
ඉන්..න් මෑණියනි
මෑණියනි.. තමන් ආශා කරන යමක් ලබාගැනීමට නොහැකි වුවහොත්... නොලැබුන හොත් ජීවිත සිතට... මොන තරම්.. ශෝක උපදවන්නක්ද?
ඔව්.. ..ඔව්.. ඉතිං..
මෑණියනි.. දැන් අර මරන්ට ගෙනගිය.. සන්තුක පුරෝහිත බමුණු පුතා...
ඔහුව.. මට විවාහ කර දෙන්ට.. මෑණියනි.. ඔහුව ලද හොත්.. මා ජීවත් වෙමි.. යම්.. හෙයකින් මට.. ඔහු නොලද හොත් මා ද... මෙහිම.. මියයමි... මෑණියනි..
හරි.. හරි.. ඉතිං මොකක්ද ඔබට ලබා ගැනීමට නොහැකි දේ.. ඔය තරමට ..ශෝක වින්නට

# සුරස අතිරේකය




විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්ෂක ඩී.එම්.එච්.කරුණාරත්න මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පළ කෙරේ.

# මිහිඳු මහරහතන් වහන්සේගේ ධර්ම දේශනා



පොසොන් පොහොය දිනයෙහි පූර්වභාගයේ දී මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිව බුදුසසුන පිහිටුවීම සඳහා උපාධ්‍යාය මොග්ගල් පුත්ත තිස්ස මහරහතන් වහන්සේ හා භික්ෂු සංඝයා විසින් කරන ලද ඉල්ලීම පරිදි ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන තෙරවරුන් වහන්සේලා හා සුමන සාමණේරයන් වහන්සේ ද, භණ්ඩුක උපාසකයන්ද සමඟ ලක්දිව මිස්සක පව්වට (මිහින්තලාව) වැඩම කළ බව සමන්ත පාසාදිකාව හා මහා වංශය ආදී මූලාශ්‍රවල පැහැදිළිවම සඳහන් කොට ඇත. (සමන්ත පාසාදිකාව 40 පිටුව - මහාවංශය 13 පරි.) එසේම සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 කට පසු අශෝක අධිරජ්‍යයාගේ (ක්‍රි.පූ 250 - 210) 18 වැනි රාජ වර්ෂයේ දී මෙය සිදුවූ බවද සමන්තපාසාදිකාව හා මහාවංශය වැඩිදුරටත් විස්තර කර ඇත. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉතිහාස අංශයේ මහාචාර්ය මහින්ද සෝමතිලක මහතාගේ මහින්දාගමනය හා එහි ඓතිහාසික පදනම් ග්‍රන්ථයේ ද මහාචාර්ය පී.බී. මීගස්කුඹුර මහතාගේ පැහැදර සඟරාවේද මේ ප්‍රවෘත්තිය සවිස්තරව සඳහන් කොට ඇත.

මෙහිදී ප්‍රථමයෙන් මිහිඳු මහරහතන් වහන්සේ ලංකාද්වීපයට වැඩම කරන වකවානුවට පෙර තිබූ ප්‍රාග් බෞද්ධ ආගමික විශ්වාස පිළිබඳව සැකවින් කරුණු සොයා බැලිය යුතු යයි හැඟේ. විජය රජුගේ අභාවයෙන් පසු ලක්දිව රාජ්‍යත්වය සඳහා භාරතයේ සිට පණ්ඩුවාස කුමරු දෙතිසක් (32) ඇමතිවරුන් සමඟ පරිබ්‍රාජක වෙස්ගෙන නැව් නැගී ලක්දිවට පැමිණි බවත් ඔවුන් දුක ජනතාව මැනවින් සත්කාර කළ බවත් මහාවංශයේ සඳහන් වේ. මෙයින් පෙනී යන්නේ පැවිද්දන් පිළිබඳ හැඳින්වීමක් ලක්වැසියා තුළ තිබූ බවයි. පණ්ඩුකාභය රාජ්‍ය සමය හා සම්බන්ධ වෙළඹ රූ රැගත් චේතිය යක්ෂණිය, චිත්තරාජ, කාලවේල යක්ෂයින් දෙදෙනා, වෙස්සවණ, ව්‍යාධි, කම්මාර දෙවිදේවතාවුන්, පච්චිම රාජිණී, වත්ථු යන යක්ෂයින් හා දෙවිදේවතාවුන් පිළිබඳ මහාවංශයේ 10 වැනි පරිච්ඡේදයේ සවිස්තරව කරුණු සඳහන් කොට ඇත. (මහාවංශය 10 පරි. 84 - 103) මේ ඇඳහිලි හා විශ්වාස මෙරට ස්වදේශිකයන් වූ යක්ෂ, නාග ගෝත්‍රිකයන් අතර ඈත අතීතයේ සිට පැවැති බවත් දේවානම්පියතිස්ස රාජ්‍ය සමය වන තෙක් ඒවා මෙරට දේශීය ජන විශ්වාස සමඟ මිශ්‍ර වෙමින් පැවත ආ බවත් කල්පනා කළ හැක. එසේම එවකට භාරතයේ පැවැති ජෛනාගමේ පූජකයන් මෙහි සිටි බවට තොරතුරු හමුවේ. පණ්ඩුකාභය රජු නගරයේ උතුරු දිසාවේ ජෝතිය, කුම්භාණ්ඩ හා ගිරි නම් වූ නිගණ්ඨ පූජකයන් සඳහා ආරාම සාදවා දී ඇත. බ්‍රාහ්මණයන් සඳහා යාග හෝම පැවැත්වීමට සොත්ථි ශාලාවක්ද සිවිකා නමින් හැඳින්වූ සිද්ධානයක් ද සාදා දී තිබේ. අනෙක් අතට බුදුරජාණන් වහන්සේ තෙවරක් ලංකාද්වීපයට වැඩම කළ හෙයින් බෞද්ධාගමික විශ්වාසයන් ද ජනතාව අතර ප්‍රචලිතව තිබූ බව සිතාගත හැක. මේ ආකාරයට මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවට වැඩම කරන වකවානුව වන විට ලක්දිව විවිධ ඇදහිලි හා විශ්වාස පන්සියයක් (500) පමණ තිබුණු බැව් සඳහන් වේ.

තෙවන ධර්ම සංගායනාවෙන් පසු එහි මූලිකත්වය ගෙන කටයුතු කළ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ අනුශාසනා පරිදි ධර්මාශෝක අධිරාජ්‍යා විසින් ප්‍රත්‍යන්ත ප්‍රදේශ කවයකට සම්බුද්ධ ශාසනය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ධර්මදූත පිරිස් පිටත්කර හරින ලද අතර එහිදී තම්බපණ්ණි දීපයට හෙවත් ලක්දිවට පිටත් කර එවූ ධර්මදූත කණ්ඩායම් නායකත්වය දෙන ලද්දේ මොග්ගලී පුත්ත තිස්ස මහ රහතන්සේගේ සද්ධි විහාරික ධර්මාශෝක අධිරාජ්‍යයාගේ පුත් මිහිඳු මාහිමියන්ටය. සමන්ත පාසාදිකා විනයට්ඨ කතාවට අනුව මිහිඳු මහ රහතන් වහන්සේ මොග්ගලී පුත්ත තිස්ස මහ රහතන් වහන්සේගෙන් ත්‍රිපිට සංගෘහිත අට්ඨකතා සහිත ථේරවාදයද මැනවින් ප්‍රගුණ කළ මහරහතන් වහන්සේ ලැබූ ශාසනික අධ්‍යාපනය, අනිකුත් ප්‍රත්‍යන්ත ප්‍රදේශවල බුදුසසුන පිහිටුවීම සඳහා පිටත්කර යවන ලද ධර්මදූතයින් වහන්සේලා ලද අධ්‍යාපනයට වඩා විශේෂත්වයක් ගන්නා ලදී.

මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රමුඛ ධර්මදූත පිරිස මෙහි පැමිණීමට පෙර ලක්වැසි ජනතාව හා ඔවුන්ගේ භාෂාව, සිරිත් විරිත්, විශ්වාස, ඇඳහිලි ආදිය පිළිබඳ තොරතුරු මාස පහක පමණ කාලයක් අශෝක අධිරාජ්‍යයාගේ රාජකීය අමුත්තන් ලෙෂ පාටලී පුත්‍ර නගරයේ රැඳී සිටි අරිට්ඨ ඇතුළු පිරිසගෙන් අසා දැනගන්නා ලද බව සඳහන් වේ. එහිදී තමන් නුදුරු අනාගතයේදී ශ්‍රී ලංකාවේදී හමුවන ජනතාවගේ භාෂාව, සිරිත් විරිත් විශ්වාස ඇදහිලි ආදිය පිළිබඳ මිහිඳු මා හිමි ප්‍රමුඛ ධර්ම දූත පිරිසට අවබෝධයක් ලැබුණු අතර එය ශ්‍රී ලංකාවේ ධර්ම ප්‍රචාරක කටයුතු වලට මනා පිටුබලයක් වූවාට සැක නැත.

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් ලංකාද්වීපයට වැඩම කොට දේශනා කරන ලද සූත්‍ර දේශනා හා එකී සූත්‍ර දේශනා පැවැත්වීමට හේතු භූත වූ කරුණු හා ඒ තුළින් ලාංකීය ජන ජීවිතය, සමාජ පරිසරය ආදී ක්ෂේත්‍රවල ඇතිවූ විපර්යාසය යනාදිය ගැන සොයා බැලීමක් කිරීමටත් අපේක්ෂා කෙරේ.

මිහිඳු මහ රහතන් වහන්සේ සතියක පමණ කාලවකවානුවක් තුළ වරින් වර සූත්‍ර දේශනා බොහෝ ප්‍රමාණයක් දේශනා කොට ඇත. ඒ අනුව මහාවංශයේ සඳහන් ආකාරයට චුල්ලහත්ථි පදෝපම සූත්‍රය, සමචිත්ත, ජේතවත්ථු, විමානවත්ථු, සච්ච සංයුක්ත, දේවදූ., බාල පණ්ඩිත, අග්ගික්ඛන්ධෝපම, ආසිවිසෝපම, අනමතග්ගිය, ඛජ්ජයක, ගෝමය, පිණ්ඩික, ධම්මචක්කප්පවත්තන, මහා අප්පමාද යන සූත්‍ර හා වස්සූපකායික ඛන්ධකය යන සූත්‍ර දේශනා කළ බව මහාවංශයේ සඳහන් වේ. දීපවංශය හා සමන්තපාසාදිකා විනයට්ඨ කථා යන මූලාශ්‍ර වලද මේ හා සමාන වූ සූත්‍ර නාමලේඛනයක් දක්වා ඇත.

## චුල්ලහත්ථි පදෝපම සූත්‍රය

මිහිඳු මහ රහතන් වහන්සේ දෙවන පෑතිස් රජු සමඟ කරන ලද සංවාදයෙන් පසු පළමුවෙන්ම දේශනා කරන ලද්දේ චුල්ලහත්ථි පදෝපම සූත්‍රයයි. මෙම සූත්‍ර දේශනාව ඇසීමෙන් පසු රජතුමා ඇතුළු මුව දඩයමේ ගිය ෂතලිස් දහසක් පමණ වූ පිරිස තිසරණ සරණ යෙහි පිහිටියහ. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද මජ්ඣිම නිකායේ මූල පණ්ණාසකයට අයත් මෙකී සූත්‍රයෙහි අන්තර්ගතය ප්‍රධාන කොටස් දෙකකට හෙවත් පරිච්ඡේද දෙකකට වෙන්කොට දක්වා තිබේ. ඉන් පළමු කොටස ජානුස්සෝණී බ්‍රාහ්මණයා හා පිලෝතික පරිබ්‍රාජක අතර වූ සාකච්ඡාවයි. දෙවන කොටස ජානුස්සෝණී බ්‍රාහ්මණයා බ්‍රාහ්මණයා බුදුරජාණන් වහන්සේ හමුවීමට

ii පිටුවට...

i පිටුවෙන්...



ගිය අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ ඔහුට කළ ධර්ම දේශනාවයි.

තෙරුවන් සරණගිය උපාසකයකු වූ පිලෝතිලක දිනපතා උදෑසනින් විහාරයට ගොස් බුදුරජාණන් වහන්සේට ඇප උපස්ථාන කිරීම සිරිතක් කොට සිටි අතර එක් දිනක එසේ විහාරයට ගොස් ආපසු එන අතරමඟදී ජානුස්සෝණී බමුණා හමුවී කළ සංවාදයෙන් පසු ජානුස්සෝණී බ්‍රාහ්මණයා බුදුරජාණන් වහන්සේ වැඩ සිටින දිසාවට දොහොත් මුදුන් දි වැඳගෙන නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස යන නමස්කාර පාඨය තුන්වරක් කියා වන්දනා කළ බව මෙම සූත්‍රයෙහි දක්වා ඇත. මෙසේ නමස්කාර පාඨය තුන්වරක් කීමෙන් පැහැදිළි වන්නේ ඈත අතීතයෙහි පටන් වර්තමානය දක්වා අඛණ්ඩව පැවත එන මූලික බෞද්ධ චාරිත්‍රයක් පිළිබඳ අදහස ලංකාවේ රජතුමා ඇතුළු පිරිසට ඉගැන්වීම යයි සිතිය හැක. ඇතෙකුගේ පියවර සටහනේ දිග පළල අනුව ඇතුගේ උස හා විශාලත්වය තීරණය කිරීමේ න්‍යාය වර්තමාන දියුණු ලෝකයේ විද්‍යාඥයින් විසින් පවා පිළිගෙන ඇති ශාස්ත්‍රීය න්‍යායකි. මෙහිදි පිලෝතික පරිබ්‍රාජක විසින් ඉදිරිපත් කළ ඇත් පියවර උපමාවෙහි අසම්පූර්ණත්වය පැහැදිලි කරමින් බුදුරජාණන් වහන්සේ ජානුස්සෝණී බමුණුහට කළ දේශනාවෙන් ඇතුගේ ප්‍රමාණය නිශ්චිත වශයෙන් දැනගැනීමට අවශ්‍ය තවත් වැදගත් කරුණු කිහිපයක් අවශ්‍ය වන බව පැහැදිළි කරදී ඇත.

එනම් වනයේ ගස්වල පිට ඉලූ තැන්, අතු බිඳී ගිය තැන් දළින් ඇන සිඳින ලද තැන් ආදිය වේ.ඇත් පියවර සිටහන් වලින් පමණක් තීරණයකට බැසනොගෙන මෙකී කරුණුද පරීක්‍ෂා කර බැලීමෙන් අනතුරුව ඇතු පිළිබඳ තිරණයකට එළඹිය යුතුබව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ සේක.

මෙයින් පැරණි රජදරුවන් හස්ති ශිල්පය ගැන මනා අවබෝධයකින් පසුවූ බව පෙනී යයි. දේවානම්පියතිස්ස රජතුමාට හස්තිපද උපමාවක් මගින් දහම් කරුණු අවබෝධ කරදිම පිණිස මෙම සූත්‍ර දේශනාව මිහිඳු මහ රහතන් වහන්සේ විසින් පළමුවෙන්ම දේශනා කළා යයි සිතිය හැක. බ්‍රාහ්මණ, ගහපති, සමන, පණ්ඩිතයන් යන සතර වර්ගය බුදුන් වහන්සේ සමඟ වාද කිරීමට පැමිණ බුදුන් වහන්සේගෙන් ධර්මය අසා උන්වහන්සේගේ ශ්‍රාවකයන් වීම පිලෝතික පරිබ්‍රාජක තෙරුවන් සරණයාමට හේතු වූ ඥාණ පද සතර ලෙස දක්වයි.

භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධ බව, ධර්මය ස්වාක්ඛාතබව, සංඝයා සුපටිපන්න බව පිලෝතික අවබෝධ කර ගත්තේ එකී ඥාණ පද ෂතර අනුවය. මෙහි ඛත්තිය බ්‍රාහ්මණ, ගහපති, පණ්ඩිතයන් තුන් කොටස බුදුන් වහන්සේ සමඟ වාද කොට බණ අසා සරණාගමනය වශයෙන් ශ්‍රාවක භාවයට පැමිණෙන බව දක්වා ඇති අතර සමන පණ්ඩිතයන් බුදු සසුනෙහි ඉහාත්මයෙහිම විශිෂ්ඨ ඥාණයෙන් දැන ප්‍රත්‍යක්‍ෂ කොට පැමිණ ලබාගත් බව පවසයි.

මෙහිදි ප්‍රථමයෙන් නමස්කාර පාඨයෙන් බෞද්ධ සම්ප්‍රදාය හඳුනා ගැනීමත් අනතුරුව සරණාගමනය හඳුනාගැනීමත් ඉන්පසු නියම පැවිද්දා හඳුනා ගැනීමත් මෙයින් ඉදිරිපත් කර ඇති බව පෙනේ.

මේ අනුව සරණාගමනය හා පැවිද්ද පිළිබඳ කරුණු දේවානම්පියතිස්ස රජු ඇතුළු පිරිසට අවබෝධ කරගැනීමට හැකිවූ බව සිතිය හැක.

ජානුස්සෝණී බ්‍රාහ්මණ බුදුරජාණන් වහන්සේ හමුවීමට පැමිණි පසු හස්ථිපද උපමාව සම්පූර්ණ කොට කරන ලද දේශනාව මෙම සූත්‍රයෙහි දෙවන පරිච්ඡේදය ලෙස සැළකිය හැක. බුදුරජාණන් වහන්සේගේ ධර්ම දේශනාව ශ්‍රවණය කරන ගෘහපතියකු හෝ ගෘහපති පුත්‍රයෙකු හෝ වෙනයම් කුලයක උපන්නෙකු හෝ සැදැහැ දිතින් සසුන් ගතවි චතුපාරිශුද්ධි සීලය සම්පූර්ණ කොට පංච නීවරණ ප්‍රහීණ කොට ධ්‍යාන අභිඥා උපදවා පූබ්බේ නිවාසානුස්සති, චුතුපපාත අසවක්ඛය ඥාණ ලබා චතුරාර්ය සත්‍ය අවබෝධ කොට රහත් බව ලබා භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධය උන්වහන්සේගේ ධර්මය ස්වාක්ඛාතය, ශ්‍රාවක සංඝයා සුපටිපන්නය, යයි නිශ්චයටම පැමිණීම හස්තිපද උපමාව විස්තර වශයෙන් දැක්වීම එහි පරිපූර්ණත්වය ලෙස මෙම පරිච්ඡේදයෙන් විස්තර කොට ඇත.

මෙහි ගෘහපතියෙකු හෝ ගෘහපති පුත්‍රයෙකු බුදුබණ අසා සිත් පහදවාගෙන සසුන්ගතවීම පිළිබඳව දක්වා තිබීම කෘෂිකාර්මික ජීවන රටාවක නියැලී සිටි ලක්වැසි ජනතාවට ඉතා සමීපසම්බන්ධයක් දක්වන්නාවූ කරුණක් ලෙස සැළකිය හැක.

චුල්ල හත්ථි පදෝපම අට්ඨකතාවෙහි ගහපති දාරකා පන කච්ඡේහි සේදං මුඤ්චන්තේහි ඡිට්යියා ලෝඛං පුප්ඵමානාය භූමිං කසිත් වා නිපාත මාන දප්පා හොන්ති. පබ්බජිත්වා මානං වා දප්පං වා අකත්වා යතාබලං බුද්ධ වචනං උග්ග හෙත්වා විපස්සනාය කම්මං කරොන්තා සක්කොන්ති අරහන්තේ පතිට්ඨාතුං යනුවෙන් දක්වා ඇති විස්තරයෙන් ද මේ බව තවදුරටත් තහවුරු වේ. (මජ්ඣිම නිකාය අට්ඨ කථා 170පිට) නියම ශ්‍රමණයන් වහන්සේ මෙබඳුය. ඔවුන්ගේ සීලය, ප්‍රතිපත්තිය මෙබඳු යයි දේවානම්පියතිස්ස රජතුමා නොදන්නා නිසා ශ්‍රමණ භාවයට පැමිණීම හා ශ්‍රමණ ප්‍රතිපත්ති හඳුන්වාදීම පිණිස පළමුව චුල්ලහත්ථි පදෝපම සූත්‍රය දේශනා කළ බව සාරත්ථ දීපනී විනය ටීකා කතුවරයාද පවසයි. මෙහිදි ජානුස්සෝණී බ්‍රාහ්මණ බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැහැදී දිවි හිමියෙන් තිසරණ සරණගිය උපාසකයකු වූවා සේම දේවානම්පියතිස්ස රජු ඇතුළු පිරිස මේ සූත්‍ර දේශනාව අසා අවසානයේ තෙරුවන් සරණගිය පිරිසක් බවට පත්වූහ.

මේ අවස්ථාවේදී සුමන සාමනේරයන් වහන්සේ ඇමතු මිහිඳු මහ රහතන් වහන්සේ ධර්ම ශ්‍රවණය සඳහා මුළු දිවයිනේම සිටින ජනතාවට ඇසෙන සේ කාලඝෝෂා කරන ලෙස දන්වා සිටින ලදී. ඒ අනුව සුමන සාමනේරයෝ කාල ඝෝෂා කළ අතර ඒ අසා බ්‍රහ්ම ලෝකය දක්වා දේවතාවෝ ධර්ම ශ්‍රවණය සඳහා රැස්වූ බව සඳහන් වේ. එම රැස්වූ දේව සමූහයාට මිහිදු මහ රහතන් වහන්සේ විසින් සමචිත්ත සූත්‍රය දේශනා කළ සේක. ධර්ම ශ්‍රවණය කිරීම සඳහා දෙවිදේවතාවුන්ට පැමිණෙන ලෙස කාල ඝෝෂා කරන ලෙස සුමන සාමනේරයන් වහන්සේට පැවසීම හා එම කාලඝෝෂාව එවක් පටන් අද දක්වා අඛණ්ඩව පවත්නා තවත් බෞද්ධ සම්ප්‍රධායක් හඳුන්වා දීමක් ලෙෂ සැළකිය හැක. ධම්මස්සවණ කාලෝ අයං භදන්තා යනුවෙන් අදත් ධර්මදේශකයින් වහන්සේලා ධර්ම දේශනාවට පෙර දේවාරාධනාව කිරීමේ චාරිත්‍රයක් ඇත. එම සම්ප්‍රධායේ ආරම්භය හා ලක්වැසි ගිහි පැවිදි පිරිසට හඳුන්වා දුන් අවස්ථාව මෙය විය හැකැයි සිතේ.

පේත වත්ථු, විමානවත්ථු, සච්ච සංයුක්ත දෙවැනි දින රජමාලිගාවට වැඩම කළ අනුබුදු මිහිදු මහ රහතන් වහන්සේ විසින් දේවානම්පියතිස්ස රජුගේ සහෝදර මහානාග උපරාජයන්ගේ බිසව වූ අනුලා දේවිය ඇතුළු පන්සියයක් කාන්තාවන්ට හා රජුට පේතවත්ථු විමාන වත්ථු හා සච්ච සංයුක්තය දේශනා කළ සේක. (සමන්ත පාසාදිකාව 47 පිටුව මහාවංශය 14 පරි. 58 ගාථාව) යම් යම් අකුසල කර්ම කලවුන් ප්‍රේත ආත්ම භාවයන්හි ඉපිදී දුක්විඳින ආකාරය මෙම පේතවත්ථු වලින් විග්‍රහකොට ඇති අතර මෙම කථාවලින් වැඩිකොටසක් කාන්තාවන් හා සම්බන්ධ සිද්ධි හුවා දැක්වීමට යොදාගෙන ඇතිබව පෙනේ. අනෙක් අතට කුසල් දහම්හි නියැලුණු අය දෙව්ලොව දිව්‍ය විමානයන්හි ඉපිද දිව්‍ය සැල සම්පත් විඳින ආකාරය විමානවත්ථු වෙන් විස්තර කර දක්වා ඇත. සංයුක්ත නිකායේ එන චතුරාර් සත්‍ය විස්තර කරන බුද්ධ දේශනාව සච්ච සංයුක්තයයි.

ධර්ම දේශනා ක්‍රම පිළිබඳ හසල දැනුමක් ඇති මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රවණය කරන පිරිසට සංවේගය ඉපදවීම පිණිස පළමුව පේතවත්ථුව දේශනා කොට එසේ සංවේගයට පත් පිරිස තුළ ප්‍රසාදය, සැනසීම පිළිබඳ හැඟීම ජනිත කරවීම පිණිස ස්වර්ග කථා ඇතුලත් විමාන වත්ථුව දේශනා කොට සැනසුමට පැමිණි පිරිසට දිව්‍ය

iii පිටුවට...

## ii පිටුවෙන්...

සම්පත් ආස්වාදය නොකළ යුතුය. නිවන ෂත්වයාට පරම ආස්වාදය ලබාදෙන බැවින් ඒ සඳහා වෙර වීරිය කළ යුතුය. යනුවෙන් චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගැනුම පිණිස ද උනන්දු කරවීමට අවසානයේදී සච්ච සංයුක්තය දේශනා කළ බව සඳහන් වේ. (සාරත්ථදීපනී ටීකා 142 පිට)

මෙම ජේතවත්ථු හා විමාන වත්ථු සූත්‍ර දෙකෙහි දක්වා ඇත්තේ ඉහතින් සඳහන් කළ ආකාරයට කළ කම්ඵල විඳිමින් ප්‍රේත ලෝකයෙහි හා දිව්‍ය ලෝකයෙහි ඉපිද වාසය කරන මිය ගිය ප්‍රාණීන් ගැන කථා වස්තූන්ය. මේ කථා වස්තු එවකට ප්‍රේතාත්ම ගැන විශ්වාසයක් ඇතිව සිටි එම ශ්‍රාවක පිරිසගේ සිත් ගත්තාට කිසිදු සැකයක් නැත. මේ නිසාම ඔවුහු බුදුදහම ගැන පැහැදී නැත. මේ කථා වස්තු වලින් ඔවුන්ගේ ප්‍රේතාත්ම විශ්වාසය වඩාත් හේතු යුක්ති සහගතව පැහැදිලි කර නැත. සච්ච සංයුක්තයේ එන පරිදි චතුරාර්ය සත්‍ය ප්‍රකාශ කොට පැහැදිලි කර දෙන ලද්දේය. මෙහිදී සංසාරය කොතරම් ගොරධිරම්ද, කොයිතරම් භයානකද යන වග පෙන්වා දීමට මෙවැනි සූත්‍ර දේශනා වලින් මිහිඳු හිමිට අවස්ථාව උදා වූ බව මෙයින් අනාවරණය වේ.

### දේවදූත සූත්‍රය

මිහිඳු මහ රහතන් වහන්සේ දෙවන දින දහවල් දානය වළඳා අවසානයේදී රජුගේ ඇත්හලෙහි පණවන ලද ආසනයෙහි වැඩහිඳ රැස්වූ මහා පිරිසට දේවදූත සූත්‍රය දේශනා කළ සේක. මජ්ඣිම නිකායේ උපරි පණ්ණාසකයට ඇතුළත් මෙම සූත්‍රය සියලු බුදුවරයින් වහන්සේලා විසීම දේශනා කරන ලද සූත්‍ර ධර්මයක් බව මජ්ඣිම නිකාය අට්ඨකතාව දක්වයි. (මජ්ඣිම නිකාය අට්ඨකථා 155 පිට) කාය සුචරිතය, වචීසුචරිතය, මනෝ සුචරිතයන්හි යෙදෙන මිනිසා සුගතියෙහි උපත ලබන බවත් මෙහි ප්‍රථමයෙන් සඳහන් කර ඇත.

එසේම කාය දුච්චරිත, වචී දුච්චරිත, මනෝ දුච්චරිතයන්හි යෙදෙන පිරිස මරණින්

මතු නිරයෙහි උපත ලබා අනේකවිධ දුක්කම්කටොලු වලට භාජනය වන ආකාරය දෙවනුව විස්තර වශයෙන් දක්වේ. සිත, කය, වචනය යන තුන් සුචරිත ක්‍රියාවන්හි යෙදිය යුතුය යන පණිවුඩය පැවසීමට පැමිණෙන්නා වූ දේවදූතයින් පස් දෙනෙකු ගැන මෙම සූත්‍රයේ සඳහන් වේ. එම දූතයන් පස්දෙනා නම් මෙලොව උපත ලැබූ ළදරු කුමරුවා මහළුවියට පත් පුද්ගලයා දැඩිලෙස ගිලන් බවට පත් තැනැත්තා කළ වැරදි නිසා මෙලොව රාජ නියෝගයෙන් දෙතිස් වර විඳින පුද්ගලයා හා මරණයට පත්වූ පුද්ගලයා යන පස්දෙනාය.

එම දූතයින් පස්දෙනා දක්න ඔබත් මමත්

මෙබඳු තත්වයට පත්වන්නෙමි යි සලකා බැලුවේදයි පව්කම් කොට නරකාදියේ උපන් සත්වයාගෙන් යම රජු ප්‍රශ්න කරන බව මෙහි දක්වේ. මෙම සූත්‍රයේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ පව්කම් කොට නරකාදියෙහි ඉපිද මහත්වූ දුක්කම් කටොලු වලට භාජනය වන යුරු විස්තර කරමින් මිනිසුන් දුසිරිතෙන් වළක්වා සුසිරිතෙහි යෙදීමට පෙළඹවීම බව පැහැදිලි වේ. නුවණින් මුහුකුරා නොගිය ඇත්හලට රැස්වූ සාමාන්‍ය ලක්වැසි

පොදු ජනතාවට පහසුවෙන් අවබෝධ කරගත හැකි ආකාරයට සජීවී දෙබසක විලාසයෙන් මෙම සූත්‍රය දේශනා කොට ඇත. මීට ප්‍රථම ජේතවත්ථුව දේශනා කොට ප්‍රේත ලෝකයේ දුක් කරදර පැහැදිලි කරදුන් මිහිඳු මහ රහතන් වහන්සේ මෙම සූත්‍ර දේශනාවෙන් නරකාදියේ දුක් ගැන පැවසීම අනුව කලින්

නිගමනය කරන ලද සැලැස්මකට අනුව දේශනා කරන ලද බව පෙනේ. සාමාන්‍ය ජනතාව සුචරිත මාර්ගයට යොමු කරවීම පිණිස අතිශයින් උචිත කරුණු සමූහයක් දේවදූත සූත්‍රයේ ඇතුලත්ව ඇතැයි මේ අනුව කල්පනා කළ හැක. දීප වංශයේද මෙය දේවදූත සූත්‍රාන්තයෙහි ඇතුළත් (ඒ ඒ නිරිසතුන්ගේ) ඉතා භයානක පූර්ව කර්මය අසා නිරය භයින් තැති ගත්තා වූ

සත්වයෝ භයට පැමිණියාහුය. භයින් පීඩිත වූ සත්වයන් දුක චතුස් සත්‍ය පැවසූ සේක යනුවෙන් දක්වා ඇත. (දීපවංශය 13 පරි. 7,8 පිටු)

### බාල පණ්ඩිත සූත්‍රය

මජ්ඣිම නිකායේ උපරි පණ්ණාසකයේ තුන්වන සුඤ්ඤත වර්ගයට අයත් දසවැනි සූත්‍රය දේවදූත සූත්‍රයයි. එම සූත්‍රයට මුලින් දක්වෙන එම වර්ගයේම නව වැනි සූත්‍රය බාලපණ්ඩිත සූත්‍රයයි. කායාද් ද්වි ත්‍රයෙන් දුෂ්චරිතයන්හි යෙදෙන්නා බාලයා ලෙසත් සච්චාරිත්‍රයන්හි යෙදෙමින් හා පණ්ඩිතයා ලෙසත් මෙහි පළමුවෙන්ම හඳුන්වා දී දුසිරිතෙහි යෙදෙන බාලයා ඉහාත්මයෙහි තුන්වැදෑරුම් දුක් දොම්නස් විඳින බව පෙන්වා දී ඇත.

පළමුවෙන්ම දේශනා කළ දේවදූත සූත්‍රයෙන් ප්‍රධාන වශයෙන් දුසිරිතෙහි යෙදෙන්නා පරලොව නිරයේ දුක්විඳින සැටි විස්තර කළ ආකාරයත් අනතුරුව මෙම සූත්‍රයේ මෙලොව දුක් දොම්නස් විඳින අයුරු දක්වීමත් සුවිශේෂ වූ කරුණකි. ඉන් අනතුරුව නිරයෙහි විඳින්නට ව නදක් මෙලොව විඳින දුක් හා සංසන්දනය කොට නිරයේදී අත් විඳින දුක්වල බියකරු බව පැහැදිලි කර ඇත.

ජනතාවගේ සිත් සතන් ඉතාසියුම් ලෙස ක්‍රමානුකූලව සුචරිත මාර්ගයට යොමු කිරීමේ සැලැස්ම අනුව මිහිඳු මාහිමියන් මේ ආකාරයට දේශනා කළ බව පෙනී යයි. තවද දුසිරිතෙහි යෙදෙන පුද්ගලයා තිරිසන් ගත සත්වයන්ව උපත ලබා දුක් විඳින සැටිද මිනිසත් බව ලැබුවත් හීන පුද්ගලයකු වන බවත් රාජ වධබන්ධන ආදියට භාජනය වන බවත් මෙම සූත්‍රයේදී පැහැදිලි කර දී ඇත. මේ විස්තරයෙන්

පසු සුචරිතයෙහි යෙදෙන පුද්ගලයා තමන් කළ සුචරිත ක්‍රියා පිළිබඳව මෙලොව සුව සොම්නස විඳින අයුරු ද උසස්ම සම්පත්තිය වූ

සක්විති රාජ සැපත පවා ලබාගැනිමෙන් භුක්තිවිදිය හැකි බවත් පෙන්වා දී ඇත.

දේවදූත සූත්‍රයෙන් දුසිරිතෙහි යෙදීම හේතුකොට ගෙන පරලොව බියකරු නිරය දුකට භාජනය වන බව විස්තර වශයෙන් දේශනා කොට ඇත.

ඉන්පසු බාල පණ්ඩිත සූත්‍රයෙන් සුසිරිතෙහි යෙදීමෙන් මෙලොවත් පරලොවත් ලෞකික වශයෙන් ඉහලම සැප සම්පත් ලඟාකර ගතහැකි බවත් විස්තර කරදී ඇත. මෙම ධර්ම දේශනාව ශ්‍රවණය කළ සමාජයේ උසස් කුල ස්ත්‍රීන්, කුල කුමරියන් ආදී පිරිස ගැන සලකා බලන කළ ඔවුන් ලබා ඇති ජීවන තත්වයට පර්ධාන හේතුව පූර්වයෙහි සුසිරිතෙහි යෙදීම බව පැහැදිලි කරදීම තුළින් ඔවුන් යහමඟට යොමු කිරීම මෙම දේශනාවේ පරමාර්ථය වූවාට සැක නැත.

### අප්පමාද සූත්‍රය

අප්පමාද නමින් හඳුන්වන සූත්‍ර දේශනා කිහිපයක් ත්‍රිපිටක සාහිත්‍යයට ඇතුලත් වී ඇත. මිහිඳු මහරහතන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ අංගුත්තර නිකායේ එන මහා අප්පමාද සූත්‍රය බවත් එය *රාජෝවාද සුත්ත* නමින් හැඳින්වෙන බවත් සාරත්ථදීපනී විනය ටීකා කතුවරයා පවසයි. (සාරත්ථ දීපනී 143 පිට) එසේම අංගුත්තර නිකායේ

ඡක්ක නිපාතයේ පඨම පණ්ණාසකයේ ධම්මික වර්ගයට අයත් එකොළොස්වන සූත්‍රය ද දසක නිපාතයේ දෙවන නාථ වර්ගයට අයත් පස්වන සූත්‍රයද අප්පමාද සූත්‍ර නාමයෙන් හඳුන්වා දී ඇත. සියලු කුසල් දහම් අප්‍රමාදය මුල්කොට අප්‍රමාදයෙහි ඇතුළත්ව ඇති බවත් එම ධර්මයනට අප්‍රමාදය අග්‍ර බවත් දසක නිපාතයේ අප්‍රමාද සූත්‍රයෙන් පැවසේ. සියලුම ජංගම ප්‍රාණීන්ගේ පාද හස්ති පාදයෙහි ඇතුළත්වන බවත් හස්ති පාදයට අග්‍ර බවත් උපමා මගින් දක්වයි.

### රාජෝවාද සූත්‍රය

රාජෝවාද නමින් කොසොල් රජුට දේශනා කළ ජාතක කතාවක් ජාතකට්ඨ කතාවේ නිපාතයේ පඨම වග්ගයෙහි දක්නට ලැබේ.

එහි ඉදං සත්ථා ජේතවන විහාරන්තො. රාජෝවාදං ආම්භකථෙසි. සො තෙසකුණ ජාතකෙ ආහවිස්සති. (ජාතකට්ඨ කථා දුතිය භාග 1 පිට) යනුවෙන් තේ සකුණ ජාතකයේ සම්බන්ධය දක්වා ඇත. තේ සකුණ ජාතකයේ ආරම්භයේ කොසොල් මහ රජුට අවවාද වශයෙන් එම ජාතක කතාව දේශනා කළ අවවාද රාශියක් එම ජාතක කතාවේ ආරම්භයෙන් දක්වේ. රජවරු දැහැමින් රාජ්‍ය කළ යුතු යයිද, යම් කලෙක රජ දරුවන් අධාර්මික වුවහොත් රාජ පුරුෂයෝද අධාර්මික වන බව මෙහි සඳහන් වේ.

රාජ්‍ය පාලකයන් ඉහතින් දක්වූ ආකාරයට අධාර්මික වන කළ තෙල් මී පැණි ආදිය ද වන මුල් පලද අමිහිරි වේ. එසේම මුළු රටම ඔද රහිත වේ. කසට වේ. රජුන් දැහැමි වන කළ වන මුල් ඵල මිහිරි රසැති වේ. මුළු රටම ඔදවත් වේ. නදියකින් එතෙරවන විට ගවරැල් නායකයා ඇදට යන්නේ නම් ගව රැල ද එසේම ඇදට යති. ගව නායකයා ඍජුව ගමන් කරයි නම් අනෙකුත් ගවයෝද ඍජුව යති. ඒ ආකාරයට රටක රාජ්‍ය නායකයා ධර්මයෙහි හැසිරෙන්නේ නම් ජනතාවද දැහැමි මඟ ගමන් කරති. රජු ඡන්දය, දෝෂා, මෝහා, භයා යන සතර අගතියට ගියේ නොදැහැමි ප්‍රජාවද අධර්මයට නැමෙති. රජු දැහැමි වන කළ මුළු රටම සුවපත් බවට සැමිණේ. මේ ආකාරයට මිය පරලොව යන්නාවූ සත්වයාට තමා විසින් කරන ලද්දාවූ කුසල කර්ම විනා අනික් පිහිටක් නම් නැත්තේය. ඒ නිසා කුසල් රැස්කිරීම අප්‍රමාදීව කටයුතු කළ යුතු බව මෙම සූත්‍රයෙන් ගෙනහැර දක්වා ඇත.

### ආසිවිසෝපම සූත්‍රය

සමන්තපාසාදිකා අට්ඨ කතාවට අනුව දේවදූතසූත්‍ර දේශනාවෙන් පසු නන්දන වනෝද්‍යානයෙහි පණවන ලද ආසනයෙහි වැඩහිඳ මිහිඳු මහ රහතන් වහන්සේ ආසි විසෝපම සූත්‍රය දේශනා කළ සේක. (සමන්ත පාසාදිකාව 47 පිට) එහෙත් මහාවංශය හා දීපවංශයේ මිහිඳු මාහිමි බාලපණ්ඩිත සූත්‍රය දේශනා කළ බව සඳහන් කර ඇත. මෙම සූත්‍රය දේශනා කළ අවස්ථාවෙහි මිහිඳු මහ රහතන් වහන්සේ දැකීමට

කුල භාර්යාවන්

කුලකුමරියන් රාජ රාජ

මහාමාත්‍යාදීන් වංශවත් යෙහෙළියන් කුල පුත්‍රයන් සමූහ වශයෙන් පැමිණි බව දීපවංශයේ සඳහන් වේ.

### අනමතග්ග සංයුක්තය

මිහිඳු මාහිමි වැඩම කළ දෙවන දිනයේ

දී නන්දන වනයෙහිදීම අනමතග්ග සංයුක්තය දේශනා කොට ඊළඟ දිනයේ අග්ගික්ඛනධාපම බජ්ජනීය සූත්‍රය දේශනා කළ සේක.

### අග්ගික්ඛන්ධොපම සූත්‍රය

මහාවංශයට අනුව මිහිඳු මහ රහතන් වහන්සේ විසින් ශ්‍රී ලංකාවට වැඩමකළ

දෙවන දිනයේ අග්ගික්ඛන්ධොපම සූත්‍රය දේශනා කොට ඇත. දීපවංශයේ හා මහාවංශයේ දක්වෙන මේ සූත්‍රවලට අමතරව චර්යා පිටකය සහ මහා සමය සූත්‍රය ද දේශනා කළ බව සඳහන් වේ. මේ

කරුණු සියල්ල තුලනයකට භාජනය කිරීමේදී මිහිඳු

මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කොට දේවානම්පියතිස්ස රජතුමා ඇතුලු ලක්වැසි ජනතාවට බුදුදහම පිළිබඳ අවතැන් වූ අවබෝධය ලබාදීම පිණිස මුලින් දක්වන ලද චූල්ලහත්ති පදෝපම සූත්‍ර දේශනාවේ පටන් අන් හැම සූත්‍ර දේශනාවක් ම පවත්වා අවසානයෙහි රටේ පාලකයා දැහැමි වීම රටවැසියන්ගේ අභිවෘද්ධියට ප්‍රධාන හේතුවක් වන බව අප්‍රමාද සූත්‍ර දේශනාවෙන් ප්‍රබල ලෙස රජුට ඇඟ වූ බව මෙයින් අනාවරණය කරගත හැක.

මේ අනුව මිහිඳු මහ රහතන් වහන්සේ විසින් ලක්දිව ජනතාවට දේශනා කළ සෑම සූත්‍ර ධර්මයක්ම රජු ප්‍රමුඛ ජනතාවගේ ජීවිත හා දැඩි ලෙස සම්බන්ධ වී පැවැති බැව් අවසන් ලෙස පෙන්වා දියහැක.

# මහින්දාගමනයට පෙර ආගමික පසුබිම



බුද්ධ වර්ෂ 236 වැන්නෙහි මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන ධර්මදූත වහන්සේලා ලක්දිවට පැමිණ බුදු සසුන පිහිටුවීමෙන් පසු ආගමික ප්‍රබෝධයක් ඇති වූ බව පෙනේ. අතීතයේ පටන් මිනිසා තම තමන්ගේ බලාපොරොත්තු ප්‍රාර්ථනා ඉටු කර ගැනීම පිණිසත් විපත්ති කරදර ආදියෙන් මිදී ආරක්ෂාව සලසා ගැනීම සඳහාත්, යම් යම් ඇදහිලි ක්‍රම අනුගමනය කර ඇති බව, ඉතිහාසයෙහි සඳහන් වේ.

අතීතයේ ඉන්දු ආර්යයෝ ද විටින් විට පැමිණෙද්දී ඔවුන් ඇදහූ ඇදහිලි ක්‍රම ද ලංකාවට රැගෙන එන්නට ඇත. විජයාවතරණයට පෙර මෙම දිවයිනෙහි නාග, දේව ආදී ගෝත්‍රිකයන් වාසය කර තිබේ. එබැවින් ඔවුන් යකුන්, මළවුන්, නාගයන්, දෙවියන් හා ගස් ගල් ආදිය ද අදහන්නට ඇත.

'මහාවංශය, දීපවංශ' ආදී වංශකථාවලත් 'සමන්ත පාසාදිකා විනය' අටුවා වේත් සඳහන් වන පරිදි එකල ලක්දිව, යකුන් - නාගයන් ඇදහීම, රුක් දෙවියන් ඇදහීම ආදිය ද පරිබ්‍රාජක ආදීන්ගේ ආගම්, බ්‍රාහ්මණ ආගම්, ජෛන ආගම් ආදී ආගම් ඔවුන් යකුන්, නාගයන් ඇදහීම රුක් දවියන් ඇදහීම පැවති බව පිළිගත හැකිය.

## යකුන් හා නාගයන් ඇදහීම

බුදුන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදු වූ අවස්ථාවේ ද එසේම විජයාවතරණය වන විට ද ලංකාවේ සිටියේ යක්ෂයින් බව මහාවංශයේ සඳහන්වේ. **'න සන්ති මනුජා එත්ථ'** යනුවෙන් මහාවංශයේ සඳහන් වන්නේ එකල ලංකාවේ මිනිසුන් නොසිටි බවය. මෙකල විසූ යක්ෂයන් අමනුෂ්‍ය කොටසක් නොව නොදියුණු මිනිස් කොටසක් බව සිතිය හැකිය. එකල ඔවුන් යකුන්, මළවුන්, ප්‍රේතයන් ඇදහීම නිසා යක්ෂ නාමයෙන් හැඳින්වූහ.

පණ්ඩුකාභය රාජ්‍ය කාලය වන විටත් යකුන් පිදීම ලක්දිව ප්‍රචලිතව පැවති ඇදහිල්ලකි. උන්මාද චිත්‍රාවගේ දාසයන් දෙදෙනෙකු වූ චිත්ත හා කාලදේවල ඇයගේ සහෝදරයන් අතින් මැරුම් කෑ බවත් පසුව යක්ෂයන් වී ඉපි ද මව් කුස සිටි පණ්ඩුකාභය කුමරා රැකබලා ගත් බවත්,

**'යක්ඛා භූත්වාන රක්ඛිංසු - උභො ගබ්භේ කුමාරකං'** යනුවෙන් මහා වංශයේ සඳහන් පාඨයකින් පැහැදිලිවේ.

පණ්ඩුකාභය කුමරු රජවූ පසු කාලදේවල යක්ෂයා උදෙසා නුවරින් නැගෙනහිර දිසාවෙහි දේවාලයක් ද, චිත්‍ර රාජ යක්ෂයාට අභය වැවේ කොටසේ දේවාලයක් ද කරවා පිදූ බව මහා වංශයේ මෙසේ සඳහන්වේ.

**'කාලවේලං නිසාසේසි යක්ඛං පුරතපීමේ**
**යක්ඛංතු චිත්ත රාජං තං හෙට්ඨා අභය වාපියා'**

මෙම යක්ෂයන් සමඟ පණ්ඩුකාභය රජතුමා ඉතාමත් හිතවත්ව මහත් භක්තියෙන් යුක්තව සිටි බව ද සඳහන්වේ. පණ්ඩුකාභය රජතුමා චිත්‍රා නම් යක්ෂණියට ද, වළවාමුඛී යක්ෂණියට ද, මහේජ නම් යක්ෂයෙකුට දේවාලයක් කරවා පුද පූජා පවත්වා ඇත.

බුදුන් වහන්සේ දෙවැනි වරටත් තුන්වෙන් වරටත් ලක්දිවට වැඩමවන විට මෙහි වාසය කළේ නාගයන් බවත්, ඔවුන් පෙරකී යක්ෂයන්ට වඩා උසස් බවත් වංශකතා සඳහන් කරයි. නාගයන් කෙරෙහි භය පක්ෂපාතී බවක් දැක් වූ ඔවුන් නාග නමින් හැඳින් වූ නොදියුණු මිනිසුන් කොටයක් බව පෙනේ.

## වෘක්ෂ වන්දනාව

විවිධ වෘක්ෂයන්ට දෙවියන් අරක් ගෙන ඇතැයි විශ්වාස කළ පැරණි ලක්වැසියා රුක් දෙවියන් පිදීමෙන් තම ජීවිතයේ අභිමතාර්ථ සඵල කරගනු පිණිස කටයුතු කර ඇත.

පණ්ඩුකාභය රජතුමා අනුරාධපුර බටහිර වාහල්කඩ සමීපයේ නුග රුකක් වෛශ්‍රවණයේ වාසභවන සඳහා පිදූ බව සඳහන්වේ. එසේම තල් ගසක් ව්‍යාධ දෙවියන්ගේ වාස භවනය ලෙස ද පූජා කොට ඇත.

## දේව වන්දනාව

ලංකාවේ දේව විජයාවතරණයටත් පෙර සිටම පැවැති ආගමික සිරිතකි. බුදුන්ගේ ප්‍රථම ලංකාගමනයේ දී සුමන නම් දෙවියෙකු තෙරුවන් සරණ ගොස් බුදුන්ගෙන් පුද පූජා පිණිස කේශධාතු මිටක් ලබා ගත් බව සඳහන් වේ. 'ව්‍යාධි දේව' නමින් දඩයම් කරුවන්ගේ දෙවියෙක් වෙයි.

දඩයම් කරුවන්ට ආශිර්වාද කරමින් දඩයම සඵල කර දෙන දෙවියෙකු ලෙස කම්හල්කරුවන්ට ආශිර්වාද කරන දෙවියෙකු ලෙස 'කම්මාර' දේව යනුවෙන් ඉටුදෙවියෙකු සිටි බව සඳහන් වේ. පුර දේව යනු අනුරපුරයට අරක් ගත් දෙවියෙකි. උප්පලවර්ණ (උපුල්වන්) නම් ලංකාවට අරක්ගත් දෙවියන්ය. විජය ඇතුළු පිරිසට ආරක්ෂාව සැලසුවේද මෙම දෙවියන්ය.

මහා වංශයේ 10 වෙනි පරිච්ඡේදයෙහි 102 ගාථාවේ සිවිකාසාලා හා සොත්ථිසාලා යනුවෙන් ගොඩනැගිලි විශේෂයක් පණ්ඩුකාභය රජතුමා විසින් කරවන ලද බවක් සඳහන් වෙයි. එයට විස්තරයක් ලියා ඇති මහා වංශ ටිකාවේ මෙසේ සඳහන් වෙයි.

**'තත්ථ සිවිකාසාලා නාම සිවලිංග පතිට්ඨාපිත සාලා විජායනඝරංවා සොත්ථි සාලා නාම බ්‍රාහ්මණානං සොත්ථි වචනු විචාරණ සාලා.....'**

මෙයින් හැගෙන්නේ සිවිකාසාලා යනු ශිවලිංගය පිහිටුවන ලද ශාලාව යන්නයි. මෙයින් හැඟෙන්නේ ශිව වේයන් ගැන ද එකල රට වැසියා දැන සිටිය බවයි. ශිව ලිංග පූජාව ද එදා ජනප්‍රිය ආගමික චාරිත්‍රයකි.

## පසණ්ඩ - පරිභ්‍රාගික - ආජීවක - ප්‍රව්‍රජ්ජිත

ශ්‍රමණ නමින් හැඳින්වූ තාපස කොටසක් ද එකල ලංකාවේ වාසය කොට ඇත. පණ්ඩුකාභය රජ දවස ජෝතිය හා ගිරි නිගණ්ඨයන් වාසය කළ ප්‍රදේශයෙහිම නොයෙක් පාෂණ්ඩකයන් ද ශ්‍රමණයන් ද එහි සිටිය බව මහා වංශයෙහි සඳහන්ය.

අනුරාධපුර අවසන් භාගයෙහි මිත්‍යාදෘෂ්ටි කුල පන්සියයක් වාසය කළ බව මහාවංශයේ 100 වැනි ගාථාවෙන් ප්‍රකාශ වෙයි. පඩුවස්දෙව්, භද්දකච්ඡායනා ආදීන් ලංකාවට පැමිණියේ පරිබ්‍රාජක හෝ පැවිදි වෙස් ගෙන බව සඳහන් වන අතර ඉන් පැහැදිළි වන්නේ පරිබ්‍රාජක හා පැවිදි බව ලබාගත් අය ද එදා ලක්දිව විසූ බවයි.

## බ්‍රාහ්මණ ආගම

විජයාවතරණයේ සිටම ලංකාවේ බමුණෝ ද සමාජයේ ප්‍රධාන තැනක් ලබා සිටියහ. ඔවුන් ශිල්ප ඉගැන්වීම ආදියෙහි නිරත වූහ. උපතිස්ස ග්‍රාමය බිහිකළ උපතිස්ස බමුණා විජය රජුගේ පුරෝහිතයෙකි. දේවානම්පියතිස්ස රජු ධර්මාශෝක රජතුමාට තුටු පඬුරු යැවූ අවස්ථාවේ මහා අරිට්ඨ කුමරු ප්‍රධාන දූත පිරිසට බමුණෙකු ඇතුළත් වූ බව මහා වංශය සාක්ෂි දරයි. බමුණන් විසින් එක් රැස් වී ජනතාවට සෙත් පතා ස්වස්ති පාඨ කියන ස්ථානය සොත්ථි සාලා නම් වෙයි.

## ජෛනාගම

නිගණ්ඨ නමින් හැඳින්වෙන්නේ ජෛන ශ්‍රාවකයන්ය. ජෛන ආගමේ ශාස්තෘවරයා වූ මහා වීර දක්වා ඇත්තේ

'නිගණ්ඨ නාථ පුත්තෝ' යනුවෙනි.

පණ්ඩුකාභය රජ දවස ජෝතිය, ගිරි හා කුම්භාණ්ඩ යනුවෙන් නිගණ්ඨයෝ තිදෙනෙක් වූහ. සිංහලයන් ලක්දිව පදිංචි වූ කාලයේ සිටම ජෛනයන් ද පදිංචි වී ඇත.

මෙසේ විවිධ ආගමික දර්ශනයන්ගෙන් පිරි පැවති ලක්බිම මහින්දාගමනයෙන් උදාවූ බෞද්ධ ප්‍රබෝධයෙන් අර්ථාන්විත සුභ ඵල ගෙන දෙන මානව චින්තනයකින් සුභාවිත විය. වෘක්ෂ වන්දනාවෙහි නිරතව සිටි ලක්වැසියා ජය ශ්‍රී මහා බෝ සමිඳු ලක්දිවට වැඩම කිරීමත් සමඟ අර්ථවත් වෘක්ෂ වන්දනාවකට යොමු විය.

දෙවියන්ට පුද පඬුරු දී අදෘෂ්‍යමාන බලවේගයකින් පිහිට පැතූ ලක්වැසියා දෙවියන්ට පින් පඬුරු දීමට තරම් බුදු දහමෙන් ප්‍රබුද්ධමත් විය. යකුන් අරක් ගත් සේ සලසා බිලි පුදදුන් ගල් පර්වත ආදිය මිනිසාම බුදු බැතිය උතුරා යන සමාධි පිළිම බවට පත් කර ගත්හ.

ආගන්තුක වුවද, බුදු සසුන ලක්දිවට ගෙනා උපරිම ආශිර්වාදයක් බවට පත් කර ගැනීමට ඔවුහු සමත් වූයේ එබැවිනි.

ශාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු
තලවත්තේගෙදර

05 පිටුවෙන්...

(සමථ සමාධිය නැවක් පැදදවීමට ගත් රිටකට උපමාකර ඇත) අනාථ නොවන සිහිය ස්ථිර සිහිය සත්‍යාවබෝධය සඳහා එළඹ සිටි සිහිය උන්වහන්සේ ලැබ ගන්නේ ආනාපානසති භාවනා මාර්ගයෙනි. විදර්ශනා ආනාපානසති භාවනාව හා සමථ සමාධි ආනාපාන සති භාවනාව අතර පැහැදිළි වෙනසක් ඇත. සමථ සමාධියේ ලෞකික ඵලය වන්නේ කෙළෙස් යටපත් කර ලබන ධ්‍යාන මට්ටමයි. ප්‍රථම ධ්‍යානාදී ලෞකික ඵල ලැබීමට සංකාර වූ රූපය අරමුණක් වශයෙන් ගෙන විතක්ක විචාර කල යුතුය. ඒ කාය සංකාර වූ හුස්ම රැල්ලයි.

මෙහිදී යෝගාවචරයාගේ අවධානය යොමු විය යුත්තේ ආනාපාන සති ලෝකෝත්තර සමාධිය මස්තක ප්‍රාප්ත කර ගැනීම සඳහා ඒ කාය සංකාර වූ හුස්ම රැල්ල (පණ නලෙහි) පටිච්ච සමුප්පන්න බව විදර්ශනා කිරීමයි. රූප සංකාර මත ගොඩනැගෙන සමාධිය ලෝකෝත්තර නොවන නිසා,

**"සබ්බකාය පටිසංවේදී අස්සසිස්සාමීති සික්ඛති**
**සබ්බකාය පටිසංවේදී පස්ස සිස්සාමීති සික්ඛති"**

සබ්බකාය වූ කාය සංකාර හුස්ම රැල්ලේ සුද්ධාෂ්ඨකයේ හෙවත් භූත රූපයේ යථාර්ථය විනිවිද දැකීමයි. මේ විදර්ශනා සමාධියේ ප්‍රතිඵලය අනිස්සිතොච විහරති නච කිඤ්චිලොකෙ උපාදියති යන ධර්මතාවයට සිත පත්වීමයි. අනිමිත්ත සමාධිය මස්තකප්‍රාප්ත වී ලෝක ධර්මයන්ගෙන් හිත නිදහස් වේ. විනිවිද දැකීමේදී විදර්ශනාවේදී සංඥා නොගැනීමේ තත්වයට හිත යොමුවේ. ඒ අනිෂ්සිත බවයි. එහි ප්‍රතිඵලය මහත් ඵලයි මහා ආනිසංශයි.

**"ආනාපානසති සමාධි භික්ඛවේ භාවිතා බහුලීකතො මහප්පලො හොති. මහානිසංසො"**

මහණෙනි, ආනාපානසති (ලෝකෝත්තර) සමාධිය භාවිතා බහුලීකතා කිරීමෙන් මහත් ඵලය ඇතිවේ. මහා ආනිශංශවේ. මෙම ලෞකික ඵලයක් හෝ ආනිශංසයක් නොවේ. ලෝකෝත්තර ඵලවූ සෝවාන් සකෘදාගාමී, අනාගාමී, අර්හත් ඵලයි. ආනිසංසය නිර්වාණය වූ අමෘතයයි.

12 පිටුවෙන්...

## තෙරුවන් ගුණයට පිවිස සසර බිය දුරු කර ගනිමු

ගැඹුරු නුවණැති බුදුරජාණන් වහන්සේ අවබෝධ කළ ආර්ය සත්‍යයෙන් සෝවාන් ඵලයවත් ලැබගෙන තිබේනම් උපරිම ආත්ම 7 කට සීමා වූ භවයට පමණක් පමා වූ බැවින් ආර්ය සංඝ තෙමේ උතුම් රත්නයක්ම වන්නේය.

දර්ශන සම්පත්තිය හෙවත් සෝවාන් මග නුවණ ලැබූ ආර්යයන් වහන්සේ සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස යන තුන් සංයෝජන දුරු කළ බැවින් සතර අපාය දුරු කළහ. ආනන්තර්ය පාපකර්ම 5 ද මිත්‍යා දෘෂ්ඨියද බැහැර කරන ලදි. මේ බැරෑරුම් පාප දෘෂ්ඨීන් දුරු කළ බැවින් ආර්ය සංඝ තෙමේ උතුම් රුවනක්ම වන්නේය.

සෝවාන් පුද්ගල තෙමේ කය වචනයෙන් වරදක් කළද කිසිදා කළ වරද සඟවනු නොලැබේ. නිර්වාණ පදය ලද උන්වහන්සේට වරද සැඟවීමට අවශ්‍ය නැත. එබැවින්ම උන්වහන්සේ උතුම් රුවනක්ම වන්නේය.

රහත්වීම නිසා පුරාණ කර්ම නවති. අලුතින්ද කර්ම සිදු නොකරයි. අලුතින් භවයක් නො අල්ලති. ප්‍රති සංධිය හීනය. සියළු කෙළෙසුන් සුන්ය. ධෛර්ය සම්පන්නය. ඒ රහතන් වහන්සේ පහන නිවුණා සේ සිත නිරුද්ධ වීමෙන් නිවන ලැබ ඇත. උන්වහන්සේ උතුම් රුවනක්ම වන්නේය.

සංඝ රත්නයේ ගුණ දක්වෙන එම රත්නය ලොව මහා අනර්ඝරත්නයක් වන කරුණු විමසා බැලීමේදී සංඝරත්නය යනුවෙන් හඳුන්වා ඇත්තේ කවුරුන්දැයි මුලින්ම පැහැදිලිව විස්තර කර තිබේ. ඒ ලොව්තුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ වැඩම කොට වදාල නිවන් මාර්ගය ඇසුරු කරමින් ලෝකෝත්තර ශීල, සමාධි, ප්‍රඥ නිපුන කළ සෝවාන් මාර්ගයේ සිට අර්හත් ඵලාවබෝධය ලද ආර්ය කොටස් අටට (8) අදාල බුද්ධ සූත්‍රයන්, බුද්ධ දූහිතෘන්ය. ඉන් මෙපිට රත්න භාවය ලද භික්ෂු, භික්ෂුණීන් නොමැත. උන් වහන්සේලා හඳුන්වන්නේ සම්මුති සංඝ නමිනි. එනම් ආර්ය සංඝරත්නයේ ''ආගතං'' අනු පිළිවෙලින් පැමිණ ඇති බැවින් ''සංඝ'' යැයි සමාජය සම්මුතියක් ඇති කරගෙන ඇති බැවිනි.

ඉහතින් සඳහන් නිකෙලෙස් රහතන් වහන්සේ ''අග්‍ර දක්ඛිණෙය්‍ය'' වන්නේය. උන් වහන්සේට දානාදි යම්කිසි පූජාවක් කිරීමෙන් ඒ මොහොතේම ප්‍රාර්ථනා සමෘද්ධ වේ. අනාගාමී ඵලයේ සිට සෝවාන් මාර්ගය දක්වාවූ සංඝරත්නය ''දක්ඛිණෙය්‍ය'' වේ. එනම් උන්වහන්සේලාට සිව්පස උපස්ථාන කරන දායකයාට මෙලොව පරලොව මහත්වූ ආනිසංස ලැබේ.

තෙරුවන් ගුණ තව බොහෝය. සඳහන්ව ඇත්තේ රුවන් සූත්‍රයෙහිලා සඳහන් ගුණසමුදායයි. ඒ ගුණ සමුදාය දෙස බලා තෙරුවන් මැනවින් හඳුනාගෙන තෙරුවන් සරණ ගොස්, තෙරුවන් ගුණයට පිවිස සසර බිය දුරුකර ගනිත්වා.

සතර අපායː- නරක, තිරිසන්, ප්‍රේත, අසුර

ආනන්තර්ය පාපකර්ම පහː- මව මැරීම, පියා මැරීම, බුද්ධ ශරීරයේ ලේ සෙලවීම, රහතුන් මැරීම, සංඝ භේදය.

03 පිටුවෙන්...

## හෙළ බොදු රටක් බිහිකළ මහින්දාගමනය

දේශයේ සිට ලක්දිව බලා අශෝකාරාමයෙන් පිටත් වූ මිහිඳු ප්‍රමුඛ ධර්මදූතයින් වහන්සේලා පස්නමට සහාය පිණිස සුමන සාමණේරයන් වහන්සේ එකතු කර ගත්හ. මේ පිරිසට වේදිස ගිරියේ දී "භණ්ඩුක" ද එකතු විය. (දීපවංශය 12,26 පිටු හා මහාවංශය 13, 17, 18 පිටු) ඒ අනුව සෙසු රටවලට ගිය කණ්ඩායම් වලද සහායකයින් වහන්සේලා සිටින්නට ඇතැයි කල්පනා කළහැක. ශ්‍රී ලංකාවට එවූ ධර්ම දූතයින් වහන්සේලා ගැන විමසා බලන විට පෙනී යන්නේ කිසියම් විශේෂතාවය ක් කර ඇති බවයි. එනම් ශ්‍රී ලංකා ධර්මදූත කණ්ඩායමේ නායකත්වය ඉසුලූ මිහිඳු හිමි ධර්මාශෝක රජුගේ පුත්‍රයෙකු වූ බව සඳහන් වීම නිසාය.

මේ ආකාරයට ධර්ම දූතයින් වහන්සේලා සමඟ පැමිණි සුමණ සාමණේරයන් මෙන්ම භණ්ඩුකත් ශ්‍රී මහා බෝධින් වහන්සේගේ ශාඛාව රැගෙන ලංකාවට පැමිණි සංඝමිත්තා තෙරණියත් රජ පවුලට සම්බන්ධ වූ අය වූහ. (ලංකා ඉතිහාසය පේරාදෙණි වි.වි. ෂ කාණ්ඩය) මේ අනුව ධර්මාශෝක අධිරාජ්‍යයාගේ පුත් කුමරෙකු වූ මිහිඳු හිමියන් මෙන්ම දූ කුමරියක වන සංඝමිත්තා තෙරණියත් එසේම මුණුපුරන් දෙදෙනෙකුත් එවීමෙන් ශ්‍රී ලංකාවට විශේෂ සැලකිල්ලක් දක්වා ඇති බව පෙනේ. එසේ එවීමේ ප්‍රතිඵල ඉතා වැදගත් වූ බව අද දක්වාම ශ්‍රී ලංකාව ථේරවාදී බෞද්ධ සම්ප්‍රධායේ සුවිශේෂී මධ්‍යස්ථානයක් වශයෙන් පැවත ගෙන ඒමෙන් ගම්‍යමාන වේ.

මහින්දාගමනයට සුදුසු කාල වකවානුව කුමක්ද යන්න තීරණය කිරීමේ දී පෙනී යන්නේ මුටසීව රජුට පසුව රාජ්‍යයට පත් දේවානම් පියතිස්ස රජුගේ රාජ්‍ය කාලය ඊට වඩාත් උචිත වූ බව වංශකථාවල සඳහන් වේ.

දේවානම්පියතිස්ස රජු රාජ්‍යවයට පත් වූ විට අගනා රන් රුවන් පහළ වූ අතර ඒවා තම බෑණා වූ අරිට්ඨ ඇතුලු දූත පිරිසක් මගින් මිතුදම තහවුරු කරගැනීම් වස් ධර්මාශෝක අධිරාජ්‍යයා වෙත යවන ලද බව වංශ කතාවල සඳහන් වේ. මේ පුද පඬුරුවල වටිනාකම ඉතා ඉහල මට්ටමක තිබූ අතර ඊට ප්‍රතිත්‍යාග වශයෙන් පරිත්‍යාග කිරිමට ධර්මාශෝක රජුට හැකියාවක් නොවූයෙන් ලංකාවෙන් ගිය පිරිසට තාන්න මාන්න ද ඔවුන් අත දහම් පඬුරක් හා අභිෂේකයක් සිදුකිරීමට අවශ්‍ය භාණ්ඩද දේවානම් පියතිස්ස රජු වෙත එවන ලදී. එම ධර්මදූතයින් අත එවූ දහම් පඬුරුවූයේ "මම බුදුන්, දහම්, සඟුන් සරණ ගියෙමි.

ශාක්‍ය පුත්‍රයන්ගේ ශාසනයෙහි උපාසකයෙක් වීමි. නරෝත්තමය ඔබ සැදැහැසිතින් තුණුරුවන් සරණයෙමි" යන්නයි. (මහාවංශය 11, 25, 36 පිටු) මේ දහම් පඬුර පිළිගත් දේවානම්පියතිස්ස රජතුමා තුණුරුවන් සරණගිය බෞද්ධයකු වී සිටි අතර ධර්මදූතයින් වහන්සේලාගේ උපදෙස් මත වෙසක් පුර පසළොස්වක පෝදා දෙවන අභිශේකය සිදුකරන ලදි. මේ අභිෂේකයත් සමඟ ලංකාව අශෝක අධිරාජ්‍යයාගේ ධර්ම විජය ප්‍රතිපත්තියට නතුවූ රටක් බවට පත්විය.

මිහිඳු මහරහතන් වහන්සේ ලංකාවට පැමිණි ගමන් මාර්ගය පිළිබඳව ද විවිධ අදහස් පළවී ඇත. මේ සඳහා උන්වහන්සේ හා දේවානම් පියතිස්ස රජු අතර සිදුවූ සාකච්ඡාව වැදගත් වේ. රජු ශ්‍රී ලංකාවට වැඩම කළේ කුමන මාර්ගයකින්දැයි විචාල විට උන්වහන්සේ ගොඩබිමිනුත් නොව මුහුදිනුත් නොවන බවට පිළිතුරු සේක. (මහාවංශය 14, 15 පිටු) ගොඩබිම යනු ගොඩබිම් දෙකින්ම නොවැඩි බව පැවසූ නිසා උන්වහන්සේ අහසින් වඩින්නට ඇතැයි රජතුමා නිගමනය කළේය. මේ මාර්ග දෙකම ගොඩබිම හා මුහුද යන දෙකින්ම යුක්ත වූ නිසා මිහිඳු හිමියන් දුන් පිළිතුර ඇතැම් විට බෞද්ධ තර්ක ක්‍රමයක් උපයෝගී කරගෙන දෙන ලද්දක් ලෙස අනුමාන කළහැක. අම්පාර දිස්ත්‍රික්කයේ රජගලින් හමුවූ ක්‍රි.පූ. 2වන සියවසට අයත් බ්‍රාහ්මී සෙල්ලිපියක ධර්ම දූතයින් වහන්සේලා අහකිස් වැඩිබවට සඳහන් වී ඇත.

දේවානම්පියතිස්ස රජු හා මිහිඳු හිමි මිහින්තලයේ දී හමුවීම අහම්බෙන් සිදුවූවක් බවටද ආකල්පයක් ගොඩනැගී ඇත. මෙහිදී රජු හඹාගිය මුවා සැබෑ මුවෙකු නොවන බවද වෙස් වලාගත් මිහින්තලේ ට අධිගෘහිත දේවතාවෙක් බවද සඳහන් වේ. මුවා පසුපස හඹාගිය රජු මිහිඳු හිමියන් සිටි ස්ථානයට ලඟාවත්ම මුවා නොපෙනී ගියේය.

මිහිඳු හිමි රජතුමා දැක "තිස්ස, තිස්ස" කියන නමින් රජු ඇමතුවේය. රජුට නම කියා ඇමතීමට කිසිවෙකු දිවයිනේ නැති නිසා රජු මවිතයට පත්විය. (දීපවංශය 12,14 පිටු හා මහාවංශය 14,7 පිටු) මේ සියල්ලෙන් ම පෙන්වීමට උත්සාහ කොට ඇත්තේ දෙපක්ෂයේ ප්‍රථම හමුවීම අහම්බෙන් සිදුවූවක් යන්නය. එහෙත් මිහිඳු හිමි තමන් බුදුන් වහන්සේගේ බුද්ධ ශ්‍රාවකයන් බවත් ඔබතුමාට අනුකම්පාවෙන් දඹදිව සිට ආ බවත් කියා හඳුන්වා දෙනවාත් සමඟ රජතුමාට තම මිත්‍ර ධර්මාශෝක අධිරාජ්‍යයා මීට මාසයකට පෙර එවන ලද සංදේශය මතක් විය. රජු මෙහිදී ආයර්යන් වහන්සේලා පැමිණි බව දැන ආයුධ බිම තැබුවේය. ඒ අනුව රජතුමා හා ධර්මදූත පිරිස මිහින්තලයේදී හමුවීම කලින් කරන ලද සූදානමක් අනුව සිදුවූවක් බව පෙනී යයි.

මිහින්තලයේ දි දෙපක්ෂය මුණගැසුණේ ජෙට්ඨමූල නම් නැකත එළැඹුණු පොසොන් පෝය දිනයේය. සමන්තපාසාදිකාව හා මහා වංශයට අනුව ජල ක්‍රීඩාව "ජෙට" නැකත හා සම්පන්ධවූවකි. මෙය නිරිත දිග වර්ෂාව අපේක්ෂාවෙන් පර්ජනය නම් දේවතාවාට ස්තුති කිරීමට පැවැත්වුණු ජාතික උත්සවයක් හැටියට මහාචාර්ය පරණවිතාණ ශූරීන් පෙන්වා දී ඇත. (මහාවංශය 25, 50, 51 පිටු) ඒ අනුව එය වසරක් පාසා පොසොන් පොහොය දිනයේ පැවැත්වුණු උත්සවයකි.

මෙම උත්සව දිනයේ රජු පිරිවර ජනයා 40 000ක් කැටුව කඩිනමින් මිහින්තලාව ට ගිය බව මහාවංශය සමන්තපාසාදිකාය යන මූලාශ්‍රවල සඳහන් වීමෙන් පෙනී යන්නේ මුව දඩයමට වඩා විශේෂ වැදගත්කමක් තිබුණ ගමනක් වූ බවයි. විශේෂ පිරිසක් කැටුව රජු මිහින්තලාවට ගියේ ධර්මදූතයන් වහන්සේලා පිළිගැනීමට බව මෙහිදී උපකල්පනය කළහැක.

රංගිරි ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2021 ජූනි- 2565 පොසොන් කලාපය

# චිත්තාවේග පාලනය

## සාමකාමී සමාජයකට මග පාදයි

චිත්තාවේග පාලනය පිළිබඳ සාකච්ඡා කිරිමට පෙර චිත්ත හෙවත් සිත පිළිබඳ හඳුනා ගැනීම ප්‍රයෝජනවත් වේ.

බොහෝ ආගම් මගින් මෙන්ම විවිධ දාර්ශනිකයින් සිත පිළිබඳ විවිධ අදහස් දක්වා ඇත. එම අදහස් මතින් පැමිණි නාමයන් වන සිත මනස මනෝකාය පසබා ආදි නම් භාවිතා කරන්නේ මෙම අරුම පුදුම සිත හඳුනා ගැනීමටයි.

සිත පිළිබඳ එහි ඇති සැබෑ තත්වය ඒ ආකාරයෙන්ම පෙන්වා දුන්නේ බුදුරජාණන් වහන්සේය. උන් වහන්සේ ගේ දේශනාව පරිදි සිත මෙබඳුය.

'දූරංගමං ඒකචරං අසරීරං ගුහාසයං' දුරගමන් යන තනිව හැසිරෙන ශරීරයක් නොමැති දෙයකි. මෙම දේශනාව අනුව සිත යනු ඇසට නොපෙනෙන ක්‍රියාකාරිත්වයෙන් යුක්ත මිනිසා තුළම පවතින වස්තුවකි. ඒවාගේම අභිධර්මයට අනුව සිත යනු 'ආරම්මන විජානන ලක්ඛණං චිත්තං'' අරමුණු දැනගැනීමේ ස්වභාවයෙන් යුක්ත වූයේ සිත යන්නයි තවත් අවස්ථාවක් සිතේ ස්වභාවය බුදුරජාණන් වහන්සේ පෙන්වාදී ඇත්තේ 'වාරිජොව ථලේ ඛිත්තෝ ඕකමොකත උබ්බතෝ පරිබන්දතිදං චිත්තං'---ජලයෙන් ගොඩ දැමූ මාළුවෙක් මෙන් හැම විටම අරමුණු සොයමින් සිටින ස්වභාවයෙන් යුක්ත බවයි. මෙම බුද්ධ දේශනාවන් පරිදි සිත යනු කුමක්දැයි අපට අවබෝධ කර ගත හැකිය.

මීලගට අපගේ අවධානය යොමු කළ යුත්තේ චිත්තාවේග දෙසටයි. පභස්සරං මිදං භික්ඛවේ චිත්තං යන දේශනාව පරිදි පුද්ගලයෙක් මෙලොවට බිහිවන විටදි සෑම සිතක්ම ප්‍රභාස්වරය පිරිසිදුය. එම පිරිසිදු සිත, ඇස, කන, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රියන් මගින් ලබාගන්නා බාහිර අරමුණු වන රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ ඔස්සේ එන උපක්ලේෂයන් මගින් සිතේ පවතින් ප්‍රභාස්වර ගතිය පිරිසිදු ස්වභාවය අඩුවී ගොස් සිත කිලිටි වෙයි. එම බාහිරින් සිතට එන උපක්ලේෂයන් නම් රාගය, ද්වේෂය, මෝහය, මදය, මාන්නය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය, පලිගැනීම යන සිතුවිලිය. මෙම සිතුවිලි පුද්ගල මනසේ හටගන්නා ආවේගයන්ය.

සෑම පුද්ගලයෙක් තුළම මෙම ආවේග පවති. එය මනුස්ස ස්වභාවයයි. මෙම ආවේග ඍණාත්ම ආවේග වශයෙනුත් ධනාත්ම ආවේග වශයෙනුත් වර්ග කළ හැකිය. ඍණාත්ම ආවේග නම් තරහ ක්‍රෝධ මාන ඊර්ෂ්‍යා ආදියයි. මෙම සිතුවිලි වලින් කෙරෙනුයේ මිනිසුන්ව පිරිහිමට අගතියට පත් කිරිමයි. බුදු දහමේ අකුසල් ලෙස හඳුන්වා දෙන්නේ මෙම සිතුවිලි වන අතර එමගින් මිනිසාට අපායට මග විවර කර දෙයි. බෞද්ධ මනෝ විද්‍යාව තුල මානසික රෝග හෙවත් මනෝ ව්‍යාධි ලෙස මෙම ආවේග හඳුන්වා ඇත. මිනිසුන් තුළ පවතින එබදු මනෝ ව්‍යාධීන් ගනනාවක් ත්‍රිපිටකයේ මජ්ඣිම නිකායේ සාලෙය්‍යක සූත්‍රයේදි පෙන්වාදී ඇත.

ඒවානම්,

1 අනුන්ට හිංසා කිරීමේ කැමැත්ත
2 අනුන්ගේ ජීවිත නැති කිරීමේ කැමැත්ත
3 අනුන් සතු දේ පැහැර ගැනීමේ කැමැත්ත
4 අනුන් සතු ස්ත්‍රීන් සේවනය කිරීමේ කැමැත්ත
5 පංච ඉන්ද්‍රියන් අයුතු ලෙස පිනවීමේ කැමැත්ත
6 බොරුවෙන් වංචාවෙන් අනුන් මුලා කිරීමේ කැමැත්ත
7 කේලාම් කියා අනුන් කෙටවීමේ කැමැත්ත
8 අනුන්ට රළු වචනයෙන් අපහස කිරීමේ කැමැත්ත
9 තමාටත් අනුන්ටත් ප්‍රයෝජනයක් නැති දෙවල් කතා කිරීමේ කැමැත්ත
10 තමා සතු දේ ගැන දැඩි ආශාව (අභිජ්ඣා)
11 අනුන්ට ක්‍රෝධ කිරීම
12 ඇත්ත නැත්ත ලෙසත් නැත්ත ඇත්ත ලෙසත් වරදවා පිළිගැනීම
13 නොකළ යුත්ත කළ යුතු ලෙසත් කළ යුත්ත නොකළ යුත්ත ලෙසත් කල්පනා කිරීම
14 වැරදි අදහසක්ම කල්පනා කොට වැරදි දෙයක්ම අනුන්ට කීම
15 වැරදි ලෙස කියන අතර තමාද වැරදි ලෙස ක්‍රියා කිරීම
16 වැරදි ලෙස ජීවත් වීමට ඇති කැමැත්ත
17 වැරදි ලෙස සිතා ක්‍රියා කිරීම නිසා වැරදි අවබෝධ ඇති වීම

මෙම ඍණාත්මත් අකුසල මනෝ ව්‍යාධීන් යම් සිතක පවතින විට ඔහු ක්‍රියා කරන්නේ ඒවා කෙසේ හෝ ඉෂ්ට කර ගැනීමටයි. එම සිතෙහි නිරන්තරයෙන් හට ගන්නේ වෛරය ක්‍රෝධය තරහව සහිත අදහස්මයි. එම අදහස් සමග යම් යම් අරමුණු ඉටු කර ගැනීමට ගොස් ඉටු නොව තැන පාලනය කර ගත නොහැකි මට්ටමට තරහව වෛරය පත්ව තම ඒකම අරමුණක් වෙනුවෙන් දේපල හානි ජීවිත හානි පවා සිදු කරයි. සිතට එන මෙම ආවේග පාලනයකින් තොරවීම බොහෝ සමාජ අපරාධවලට හේතුවක් වී ඇත.



වර්තමාන සමාජය තුළ මෙම ආවේග පාලනයකින් තොරව ක්‍රියාවට නැංවීමට ගොස් සිදුවී ඇති අනන්තර්ය පාප කර්ම පවා සිදු කර ඇති තොරතුරු අසන්නට ලැබේ.

මෙම ඍණාත්මක හෙවත් අකුසල සිතුවිලි පුද්ගල මනස තුළ හට ගන්න බලපාන ප්‍රධාන මනෝභාවයන් තුනක් ඇත. එනම්,

ලෝභ (ආසාව)
ද්වේශ (තරහාව)
මෝහ (මෝඩකම)

මෙම කාරණා තුන මුල්වී චිත්තාවේග පහල වේ. යම් තරුණයෙකුට තරුණියක් කෙරෙහි ලෝභ කමක් ආශාවක් ආදරයක් ඇතිවූ විට ඇය වෙනුවෙන් පෙම්වතකු ලෙස කළ යුතු යුතුකම් කිරීමට යාමේදි හෝ ඇය තමා සතු කර ගැනීමට යාමේදි එය හිතුවක්කාර ලෙස කරන්න යන්නේ නම් වැඩිහිටියන් එයට අවවාද කරමින් එය වලක් වන්න යාමේදි එම පෙම්වතාට හෝ පෙම්වතියට වැඩිහිටියන්ව පේන්නේ තමනගේ සතුරන් ලෙසය. එයට හේතුවන්නේ ලෝබකමින් ආශාවෙන් මුලාවට පත්ව සිටීමයි. එම මුලාව හමුවේ තම අභිප්‍රායයන් කෙසේ හෝ ඉටු කර ගැනීමට යාමේදි තම සිතට එන තරහව ක්‍රෝධය පාලනයකින් තොරව යයි. එවිට තමා අතින් සිදුවන හානිදායක දේවල් තමාද නොදනි.

ඒවාගේම සිතකට රාගය නැමති ආවේගය ආ විට පාලනයකින් තොරවූ විට ස්ත්‍රී දූෂණ ළමා අපචාර වැනි කාම අපරාධ සිදුවෙයි. මෙලෙසම අනිකුත් සියළු ආවේග ඊර්ෂ්‍ය ක්‍රෝධ මාන වෛර පලිගැනීම් පාලනය කර නොගතහොත් පුද්ගල පරිහානිය වගේම සමාජ පරිහානියද සිදුවීම වැළැක්විය නොහැකිය.

සිතට එන මෙම ආවේග පාලනයකින් තොරව ක්‍රියාවට නංවන්න ගොස් මහ අපරාධ සිදු කොට පශ්චාත්තාප වන මිනිසුන් සමාජයේ සුලබව දක්නට ඇත. සිර ගෙවල් බන්ධනාගර වල සිටින්නේ මෙම අවේග පාලනය කර නොගෙන කටයුතු කළ අයයි.

මෙම ආවේග අතර ධනාත්මක ආවේගද ඇත. ඒවා බුදු දහම තුළ කුසල සිතුවිලි ලෙස හඳුන්වා ඇත. මින් පුද්ගලයාගේ දියුණුව මෙන්ම සමාජයේ සමය සතුට එකමුතු කම ඇති කරයි. මෙම ධනාත්ම ආවේග කොතෙක් පුද්ගල මනසට පැමිණියත් කම් නැත. මන්ද එයින් සමාජයට හානියක් නොවන නිසාත් සමාජයට යහපතක් වන නිසාත්ය. මෙම ධනාත්මක හෙවත් කුසල සිතුවිලි මනසට පැමිණි විට මිනිසුන් දන් දෙන්න සිල් රකින්න අසරණයන්ට පිහිටවීම වේනම් සමාජ සුබ සාධනමය කටයුතු කරයි. එම ධනාත්මක ආවේග නම් අලෝබ අදෝස අමෝහ කරුණාව මෛත්‍රිය දයාව අනුකම්පාව උපේක්ෂාව වැනි යහපත් කුසල් සිතුවිලිය. මෙම සිතුවිලි සහිත මිනිසුන් නිරන්තරයෙන්ම අප ශ්‍රී ලාංකික සමාජයේ දක්නට ලැබේ. මන්ද යත් අපේ රටේ මිනිසුන් දනට පිනට දෙන්න අසරණයන්ට පිහිට වෙන්න නොපැකිලෙන ස්වභයක් පවතින නිසා එය දීර්ග කාලයක් තිස්සේ අප ලැබූ බුද දහමේ ආභාසයෙ ප්‍රතිඵලයකි.

එවැනි තත්වයන් මත අද වර්තමනයේ ඍණාත්මක සිතුවිළි සමඟ අකුසලයට බරව සමාජ අපරාධ කරන උදවිය බහුල බවක් දක්නට ලැබීම අබාග්‍යයකි.

පුද්ගල මනසේ පවතින ඍණාත්මක සිතුවිලි පාලනය කරගත් විට මෙම සමාජ විරෝධි අපරාධ වලක්වා ගත හැක එම නරක ආවේග හෙවත් අකුසල සිතුවිලි පාලනය කර ගන්නා ක්‍රමයක් බුදු දහම තුළ ඇත. එනම් අකුසල සිතුවිලි වලට ප්‍රති විරුද්ධ සිතුවිලි මෙනෙහි කිරීම මගින් නරක ආවේග පාලනය කිරීමයි.

විතක්ක සන්ටාන සූත්‍රයට අනුව වෛරයක් සිතට ආ විට එය යටපත් කිරීමට නම් ඊට ප්‍රතිවිරුද්ධ වූ මෛත්‍රි සිතුවිලි මෙනෙහි කළ යුතුය. රාගය සිතට ආ විට පිළිකුල ද ලෝභය පැමිණි විට පරිත්‍යාගයද ඊර්ෂ්‍යව පැන නැගුණු විට උපේක්ෂාවද මෙනෙහි කළ යුතුය.

බුදුරජාණන් වහන්සේ මංගල සූත්‍රයේදි කාලේන ධම්ම සවනං කාලේන ධම්ම සාකච්ඡා ලෙස දේශනා කළේද මෙම නරක නපුර ඍණාත්මක අකුසල සිතුවිළි සිතට ආ විට ධර්මය ඇසීමටත් ධර්මය සාකච්ඡා කිරීමටත් සුදුසුම වෙලාව විදිහටයි. යහපත් පුද්ගලයෙක් නිර්මාණය වූ විට යහපත් සමාජයක් නිරායාසයෙන්ම ගොඩ නැගේ. එමනිසා සෑම පුද්ගලයෙක්ම තම තමාට නිරන්තරයෙන් එන ආවේග ගැන අවබෝධයෙන් සිට එහි ආදිනවත් යහපත් චේතනාවන් වල උතම් බව ධර්මානුකූලව තේරුම් ගැනීමත් අවශ්‍ය වේ. එවිට ආවේග පාලනයෙන් සාමකාමී සුවපත් සමාජයක් ඇති කර ගත හැක.

ශාස්ත්‍රවේදි පූජ්‍ය කෝන්ගහවෙල සුමන හිමි
ශ්‍රී ජිනරාජ විවේක සෙනසුන
මීගොල්ල